# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# වාර්ෂික වාර්තාව 2023










| පටුන | පිටු අංකය |
| --- | --- |


| | |
| --- | --- |
| ➢ සම්බන්ධීකරණ තොරතුරු | 02 |
| ➢ දැක්ම සහ මෙහෙවර | 03 |
| ➢ සංස්ථාමය තොරතුරු | 04- 08 |
| ➢ සභාපතිතුමාගේ සමාලෝචනය | 09 – 10 |
| ➢ සංස්ථාපිත පසුබිම | 11- 38 |
| ➢ සංස්ථා තේ | 39 - 41 |
| ➢ රබර් නිෂ්පාදනය | 42 |
| ➢ භාණ්ඩාගාර ප්‍රතිපාදන | 43 |
| ➢ 2023 – 2022 වර්ෂයන් සඳහා සංසන්දනාත්මක මූල්‍ය කාර්ය සාධනය | 44 |
| ➢ මානව සම්පත් කළමණාකරණය | 45 – 48 |
| ➢ මූල්‍ය වාර්තා | 49 |
| ➢ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 50 |
| ➢ *ආදායම පිළිබඳ ගිණුම් ප්‍රකාශය* | 51 |
| ➢ *ස්කන්ධය මත වෙනස්වීම් පිළිබඳ ගිණුම් ප්‍රකාශය* | 52 |
| ➢ මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 53 |
| ➢ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් | 54-70 |
| ➢ විගණකාධිපති වාර්තාව | 71-81 |
| ➢ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ආයතනය ගත කියාමාර්ග | 82-97 |




**ප්‍රධාන කාර්යාලය**
අංක 257, ශ්‍රී ධම්ම මාවත
කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන : 011 5757539
ෆැක්ස් : 011 2438635
විද්‍යුත් තැපැල : slspc@sltnet.lk
වෙබ් අඩවිය : www.slspc.lk

**ප්‍රාදේශීය කාර්යාලය**

ප්‍රාදේශීය කාර්යාලය
ගල්පිහිල්ල, පන්විල.

දුරකථන: 081 5634903
ෆැක්ස්: 081 5634902
විද්‍යුත් තැපැල
regionalofficegp@gmail.c

**විගණනකරුවන්**
විගණකාධිපති
306/72, පොල්දූව පාර, බත්තරමුල්ල

## දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රබලතම වාණිජ ව්‍යවසායකත්ව ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වත්කම් සේවක සහභාගීත්වයෙන් නිසි කළමනාකරණය කරමින් රටේ දේශීය නිෂ්පාදනයට සහ වතු සේවක පවුල්වල සහ අසල්වැසි ගම්මානයන්හි යහ සාධනය ඇති කිරීමට උපරිම දායකත්වය ලබා දීම.

නීතිඥ ශ්‍රීමාල් විජේසේකර මහතා
සභාපති
පත්වීම් ලද දිනය 2020.01.23

ආර්.ඒ.ආර්.එස්.මායාදුන්න මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/අමාත්‍යාංශ නිරීක්ෂක
පත්වීම් දිනය 2020.01.28

ආර්.එම්.එස්.පී.එස්.බණ්ඩාර මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2022.03.21

ජේ.එල්.ඒ.සම්පත් නලින්ද මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

කුෂාන් වැගොඩපොල මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

සුසන්ත සේනාරත්න මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

ඩබ්.ඩබ්.එම්.බී.පී.කඹුරාදෙණිය මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.11.02

එස්.එම්.සී.එස්.සිරිවර්ධන මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

ආර්. එන සොයිසා මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2023 .02.22

## කළමනාකරණය - ප්‍රධාන කාර්යාලය 2023

| නම | තනතුර |
|---|---|
| නිතිඥ ශ්‍රීමාල් විජේසේකර මහතා | සභාපති |
| එච්.එන්.පී.ජිනසේන මහතා | සාමාන්‍යාධිකාරී |
| ජේ.එච්.එම් අමාන් මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන |
| එස්.අයි.එම් හසන් මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) |
| කේ.ඒ.එච්.ඩී.පෙරේරා මිය | කළමණාකාරිනි - ප්‍රසම්පාදන |
| එන්.වි. ඒ.පි විතානගේ | කළමණාකරු- නීති (2022 මැයි මස සිට) |
| බී.වී.එල්.සී.බෙනරගම මිය | කළමණාකාරිනි - ඉඩම් |
| ඩබ්.ඩී.ඩබ්.කීර්ති මහතා | කළමණාකරු - ප්‍රවාහන |
| ආර් .ඒ. අමල් සංජය මහතා | අභ්‍යන්තර විගණක |
| සී.එස් බන්ඩාර මිය | ගණකාධිකාරී |
| පී.සී.ජේ.පනාගොඩ මහතා | සහකාර ගණකාධිකාරී |
| ජී.බී.සී.ෆොන්සේකා මහතා | පරිපාලන නිළධාරී |
| ආර්.වයි.ජී.එස්.යාපා මහතා | සහකාර කළමණාකරු -මූල්‍ය |
| පී.වී.ප්‍රදීප් මහතා | සහකාර කළමණාකරු - අලෙවි |
| එස් එල් කේ රන්වල මිය | සහකාර කළමණාකරිනි - වැවිලි |
| එච්.එම්.එස්.එන්.හේරත් මිය | සහකාර කළමණාකාරිනී-ප්‍රවාහන |
| පී.ටී.ඩී ගුණවර්ධන මිය | සහකාර කළමණාකාරිනී-ඉඩම් |
| ඩබ්ලිව්.සී විතාන මයා | තොරතුරු තාක්ෂණ නිලධාරි |
| එම්.ටී.ටී. මොරහැල මිය | සහකාර ගණකාධිකාරිනි (ප්‍රාදේශීය කාර්යාලය ) |

| නම | තනතුර |
|---|---|
| ටී.එම්.පී.අයි.කේ.තෙන්නකෝන් මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැව්ලි) |
| කේ. ඩී. වී ගුණසේකර | කළමනාකරු (වැව්ලි) |
| පී. අයි.එල්.පෙරේරා මහතා | ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී , ප්‍රධාන කාර්යාලය |
| ආර්.ජ්.ආර්.එම්.රණවක මහතා | ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී , කැලෑබොක්ක රාජ්‍ය වතුයාය |
| වයි.ජ්.ටී.බී.වඩුගොඩපිටිය මහතා | ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී , හාගල රාජ්‍ය වතුයාය (කොන්ත්‍රාත්) |
| අයි.ඩබ්.ආර්.ජයවර්ධන මහතා | ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී , අලකොල්ල රාජ්‍ය වතුයාය |
| ටී.ආර්.එච්.හේවගේ මහතා | ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී , ගෝමර රාජ්‍ය වතුයාය |
| ආර්.ජ්.එම්.දයාරත්න මහතා | ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී , ගල්පිල්ල රාජ්‍ය වතුයාය (වැඩ තහනමට ලක්වූ ) |
| එස්.වයි.ලියනගේ මහතා | ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී , ඔපල්ගල රාජ්‍ය වතුයාය /හාගල රාජ්‍ය වතුයාය |
| ඩබ්.ටී.කේ.සමරතුංග මහතා | වතු අධිකාරී , රංගල රාජ්‍ය වතුයාය |
| ජී.ඩබ්.ජී.විජේරත්න මහතා | වතු අධිකාරී , හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය |
| ඩී.ඩබ්.ටී.සී.දන්තසිංහ මහතා | වතු අධිකාරී , වයිතාලව රාජ්‍ය වතුයාය /ඔපල්ගල රාජ්‍ය වතුයාය |
| ආර් සී කහවිට මහතා | වතු අධිකාරී , කොටගඟ රාජ්‍ය වතුයාය |
| කේ.ඩී.එම්.පී.වීරසිංහ මහතා | වතු අධිකාරී,මිඩ්ලන්ඩ් රාජ්‍ය වතුයාය |
| සී.එච්.එච්.කේ.ජී.ලක්රුවිර මහතා | වතු අධිකාරී , හෙයාපාර්ක් රාජ්‍ය වතුයාය/වැඩ බලන වතු අධිකාරී වයිතලාව රාජ්‍ය වතුයාය |
| එස්. ඩබ්.එම්.සී.එස්. අලදෙණිය මහතා | වැ.බ. වතු අධිකාරී , විහාරගල රාජ්‍ය වතුයාය /වැඩ බලන වතු අධිකාරී නිකොලඔය රාජ්‍ය වතුයාය |
| ඩබ්.ජ්.ඩී.පී.විජේසිංහ මහතා | වැ.බ. වතු අධිකාරී , වුඩ්සයිඩ් රාජ්‍ය වතුයාය |
| ජ්.ඩී.කේ.ජ්.පී සෙනරත් මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර වතු අධිකාරී , නිකොලඔය රාජ්‍ය වතුයාය |
| එල් කේ අලුවිහාරේ මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර වතු අධිකාරී , නිකොලඔය රාජ්‍ය වතුයාය |
| සී .එස්.එස්.එම දිසානායක මහතා | වතු අධිකාරී වලහන්දුව රාජ්‍ය වතුයාය (වැඩ තහනමට ලක්වූ) |
| ජෙ .ආර් මෙරියන් මහතා | වතුයාය භාර සහකාර වතු අධිකාරී- වලහන්දුව රජ්‍ය වතුයාය |

# සංවිධාන ව්‍යුහය


සංවිධාන ව්‍යුහය
සභාපති
සාමාන්‍යාධිකාරී HM 1-1
ප්‍රාදේශීය කාර්යාලය
ප්‍රධාන කාර්යාලය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -වැවිලි (HM 1-1)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-පාලන /මානව සම්පත් (HM 1-1)
සාමාන්‍යාධිකාරී-මූල්‍ය
අභ්‍යන්තර විගණක (MM 1-1)
කළමණාකරු-වැවිලි (MM 1-1)
වතු අධිකාරී (14xMM 1-1)
සහකාර වතු අධිකාරී (22 X JM 1-1)
සහකාර කළමණාකරු (JM 1-1)
කළමණාකරු-පාලන/මානව සම්පත් (MM 1-1 )
පරිපාළන නිලධාරී (JM 1-1)
කළමණාකරු-නීති (MM 1-1)
කළමණාකරු ප්‍රසම්පාදන (MM 1-1)
සහකාර කළමණාකරු ප්‍රසම්පාදන (JM 1-1)
කළමණාකරු අළවි (MM 1-1)
සහකාර කළමණාකරු අළවි (JM 1-1)
සහකාර කළමණාකරු ප්‍රවාහන (JM 1-1)
තොරතුරු තාක්ෂණ නිලධාරී (JM 1-1)
ගණකාධිකාරී (MM 1-1)
සහකාර ගණකාධිකාරී (JM 1-1)
කළමණාකරු-ඉඩම් (MM 1-1)
ඉඩම් නිලධාරී (JM 1-1)
සහකාර කළමණාකරු වැවිලි (JM 1-1)
විගණන නිලධාරී (JM 1-1)

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් තේ වතුවල පිහිටීම




**රූපය 02- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තේ වතු ව්‍යාප්තිය**

## සභාපතිතුමාගේ සමාලෝචනය 2023



නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව " ලස්සන රටක් යහපත් ජීවිතයක්" යන අරමුණ ඇතිව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වඩාත් ඵලදායී ලෙස මෙහෙයවීම මාගේ ඒකායන අරමුණ වේ. 2025 වර්ෂයේ පෙබරවාරි මස, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපති ලෙස වැඩභාර ගන්නා ලද අවස්ථාව වන විට සංස්ථාවේ වාර්ෂික වාර්තා 2022 වර්ෂය දක්වා පාර්ලිමේන්තු ගත කර තිබූ අතර 2023, 2024 වාර්ෂික වාර්තාවන් පිළියෙල කර නොතිබිණි. ඒ අනුව, එම වර්ෂයන්හි වාර්ෂික වාර්තා පිළියෙල කිරීම කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් මා විසින් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව විගණකාධිපති වාර්තාව තත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

ශ්‍රී ලංකා රාජය වැවිලි සංස්ථාවට අයත් මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 10,989.86 වන අතර තේ,රබර් හා දැව වගාවවන් සහිත වතුයායන් 17ක වගා කටයුතු සිදු කරනු ලබයි. මෙම ඉඩම් තුළ පවතින ඌන උපයෝජිත ඉඩම් හඳුනාගෙන වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් මා විසින් ලබා දෙන ලදී.

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාව රු.මි. 92.67ක අලාභයක් වාර්තාවී ඇති අතර පෙර වර්ෂයේදී සංස්ථාව රු.මි. 19.67ක ලාභයක් අත් කර ගෙන තිබිණි.

සංස්ථාවේ 2023 වර්ෂය තුළ අමු තේ දළු අස්වැන්න කිලෝ ග්‍රෑම් 5,089,280 දක්වා පහත වැටී ඇති අතර නිමි තේ නිෂ්පාදනයද කිලෝ ග්‍රෑම් 1,133,281 දක්වා පහත වැටී ඇත. වේ. එම ප්‍රමාණය 2022 වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 31 % හා 27% පහළ යාමකි. නිෂ්පාදන පිරිවැටුම 23 % කින් හා ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගය (NSA) 16.5 % කින් වැඩි වී ඇත. සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන "සංස්ථා තේ" විකුණුම් අදායම පසුගිය වසරට සාපේක්ෂව 2023 වර්ෂයේදී 45 % කින් වර්ධනය වී ඇත.
සංස්ථාව 2023 වර්ෂය තුළ රසායනික පොහොර මිල ගණන් ඉතා අධික වූ බැවින් නිසි කෘෂිකාර්මික ක්‍රමවේදයන් යටතේ තේ වගාව සඳහා පොහොර යෙදීම සම්පූර්ණයෙන්ම අඩාල වී ඇති අතර, සංස්ථාවේ දළු අස්වැන්න හා නිමි තේ නිෂ්පාදනය පහත වැටීමට ප්‍රධානම හේතුව ද මෙය වී ඇත. ඒ අනුව තේ ක්ෂේත්‍ර යේ ඵලදායිතාවය අඩුවී ඇති අතර මෙම තත්ත්වය ඊළග වර්ෂයේ අමු දළු අස්වැන්නටද දැඩි ලෙස බලපා හැකි බවට ද පුරෝකථනය කල හැකිය.

සංස්ථාව හෙක්ටයාර 160ක භූමි ප්‍රමාණයක නව වගා ව්‍යාපෘතියක් 2022 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, මෙම ව්‍යාපෘතිය සඳහා යොදවනු ලැබූ ප්‍රාග්ධන ආයෝජනයන්හි ප්‍රතිඵලයක් වශයෙන් ඉදිරි වර්ෂයන්හි සංස්ථාවේ ආදායම වැඩිකර ගැනීමේ හැකියාවක් පවතින බව මාගේ නිරීක්ෂණයයි.

සංස්ථාවේ තේ, රබර්, දැව අදායම් වැඩි කරගැනීම ප්‍රධාන ඉලක්කයන් ලෙස හඳුනා ගැනීම සිදු කළ යුතු අතරම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන් ලෝක උරුමයක් වන නකල්ස් රක්ෂිතය වටා පිහිටා ඇති බැවින් ඉතා සුන්දර ස්ථාන රාශියක් අප වතුයායන් තුළ පිහිටා ඇත. රිවර්ස්ටන් පිවිසුම් මාර්ගය,

දන්කන්ද වැව හා  කඳවුරු භූමිය, 360 දර්ශන පථය, තැලිය වැටුන ඇල්ල, ජෝඩු ඇල්ල, සාරි ඇල්ල, වැවතැන්න කඳවුරු භූමිය හා ජලාශය ඇතුළු අලංකාර භූ දර්ශන රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන් තුළ පිහිටා ඇත. දැනට මෙම ස්ථාන නැරඹීමට දේශීය හා විදේශීය සංචාරකයන් විශාල පිරිසක් පැමිණෙන අතර ඔවුන්ට අවශ්‍යය ඉතා සීමිත පහසුකම් සැපයීමෙන් දැනට යම් ආදායමක් සංස්ථාව ලබන අතර හොඳ පහසුකම් සැපයීම මඟින් ඉහළ ආදායමක් ලබා ගත හැකි බව මාගේ නිරීක්ෂණයයි.
ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට අයත් තේ කර්මාන්තශාලා  09ක් පැවතුන ද ඒ අතරින් කර්මාන්තශාලා 04ක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. 2023 වර්ෂයේදී අගය දාමය වැඩිකර ගැනීමේ අරමුණින් ගෝමර තේ කර්මාන්තශාලාව නවීකරණ කටයුතු සිදු කර තිබූ අතර අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් අවශ්‍ය පරිදි මිළ දී ගෙන තිබිණි. 2023 වර්ෂය අවසාන වන විට ගෝමර කර්මාන්තශාලාව ආරම්භ කිරීමට අවශ්‍ය වර්ණය අනුව වෙන්කිරීමේ යන්ත්‍රය ද (Colour Separator) මිලදී ගැනීම සිදු කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය 1994 වර්ෂයේ සිට කුලී පදනම මත ලබා ගන්නා ගොඩනැගිල්ලක් තුළ පවත්වා ගෙන යන අතර  2023 වර්ෂයේ දී සංස්ථාවට අයත් දෙමටගොඩ පිහිටි පරිශ්‍රයෙහි ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කිරීම තුළින් වාර්ෂිකව දරන ලද   රු. මි. 5.79 කුලී  වියදම ඉතිරි කර ගැනීමට හැකියාව ලැබී තිබිම සුවිශේෂී කරුණක් බව නිරීක්ෂණය කරමි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් 2000 වර්ෂයේ සිට 2023.12.31 දින දක්වා නොගෙවන ලද ව්‍යවස්ථාපිත දීමනා මුදල රු.මි. 1,445.50 ක්  පමණ වේ. සංස්ථාව වෙත ප්‍රමාණවත් ආදායමක් නොලැබීම මෙයට ප්‍රධානතම හේතුව වී ඇත. මෙම වටිනාකම තුළ උපචිත සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය (EPF) රු.මි. 677.36 ක්, සේවක භාරකාර අරමුදල් දායකත්වය (ETF) රු.මි. 47.42 ක්, වතු සේවක අර්ථසාධක සංගමයේ (Estate Staffs' Provident Society-ESPS) දායකත්වය රු.මි. 73.31, වතු අධිකාරීවරුන් හා සහකාර වතු අධිකාරීවරුන්ගේ අර්ථසාධක අරමුදල් යොමු කරනු ලබන ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමයේ (Ceylon Planters' Provident Society- CPPS) දායකත්වය රු.මි. 18.16 ක් සහ පාරිතෝෂික දීමනා වටිනාකම වන රු.මි. 629.25 ක් ද ඇතුළත් වේ. මෙයට අමතරව හිඟ ව්‍යවස්ථාපිත දීමනා නොගෙවීම හේතුවෙන් ගෙවිය යුතු අධිභාර වටිනාකම රු.මි. 595.93 ක් ද ඇතුළත්ව සමස්ත ගෙවිය යුතු මුදල රුපියල් මිලියන 2,041.43 ක් වේ.

විශ්‍රාමික සේවක සේවිකාවන් මෙම ව්‍යවස්ථාපිත ගෙවීම් ඉල්ලා අධිකරණයේ ගොනු කර ඇති නඩු කටයුතු වෙනුවෙන් මෙම ආයතනය නිෂ්කාර්ය වියදමක් දැරීමට සිදුව ඇත.  මේ හේතුවෙන් වර්තාමානයේ සේවයේ නියුතු සේවකයන්ගේ ව්‍යවස්ථාපිත දීමනා නිසි පරිදි ගෙවීමට නොහැකිවී ඇති අතර 2023  වර්ෂය තුළ ව්‍යවස්ථාපිත දීමනා නොගෙවීම මත අලුතින් නඩු 95 ප්‍රමාණයක් සංස්ථාවට එරෙහිව පවරා ඇති බව වාර්තාවේ. සේවකයින්ගේ මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා බේරුම් කර අවසන් කිරීම කඩිනමින් සිදු කළ යුතු බව මාගේ නිරීක්ෂණය වේ.

සංස්ථාවේ තේ දළු අස්වැන්නෙන් හා නිමි තේ නිෂ්පාදනයෙන් ලාභයක් වාර්තා කිරීම සඳහා අමු දළු අස්වැන්න වැඩි කර ගත යුතුව ඇත. එසේම, අමු දළු හා නිමි තේ විකිණීමෙන් ලැබෙන ආදායම සමස්ත වියදම ඉක්මවා යන ආදායමක් බවට පරිවර්තනය කළ යුතුව ඇත. ඒ සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමන කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව නිරීක්ෂණය වේ. එසේම, සංස්ථාවේ දැනට පවතින වගකීම් වලින් නිදහස් වීම, වතුයායන්හි හා කර්මාන්තශාලා මඟින් වැඩි ඵලදායීතාවයක් ලබා ගැනීම සඳහා කර්මාන්තශාලා නිසි නඩත්තුවක් සහිතව නවීන තාක්ෂණය එකතු කිරීමක් සිදු කිරීමට හැකිවන පරිදි ප්‍රාග්ධනය ආයෝජනයන් සිදු කිරීමත් සිදු කළ යුතු බව මාගේ නිරීක්ෂණයයි.

2023 වාර්ෂික වාර්තාව කඩිනමින් සකස් කිරීම සම්බන්ධයෙන් සංස්ථාවේ සාමාන්‍යාධිකාරී ප්‍රමුඛ සියලුම කාර්ය මණ්ඩලය සිදු කරන ලද කැපකිරීම මා අගය කරමි. ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

**ආචාර්ය සිසිර රණතුංග**
**සභාපති**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව**

## සංස්ථාපිත පසුබිම

**නීතිමය පිහිටුවීම**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 1958 දී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත අංක 4 යටතේ පිහිටුවන ලද අතර පසුව 1962 අංක 12 සහ 1979 අංක 49 දරන පනත් මගින් සංශෝධනය කරන ලදී.**

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඓතිහාසික පසුබිම**

1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවා ඇති අතර, ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පවරා දෙනු ලැබූ වතුයායන් සහ රජය සතු වගාකල බිම් සංවර්ධනය කර නගා සිටුවීමත්, වගාව මනා ලෙස කළමනාකරණය කිරීමත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය. තවද, ඉඩම් කොමසාරිස් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමා විසින් පවරා ගන්නා ලද වතුයායන් කළමනාකරණය කර පවත්වාගෙන යාමට පවරාදීම ද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ තවත් අරමුණක් විය.ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ආරම්භයේ සිටම ක්‍රියාත්මක වූයේ රජයට පවරා ඇති වතු කිහිපයක් සමඟ බැවින්, සංස්ථාව පිහිටුවීමේ අරමුණ ඉතා හොඳින් ක්‍රියාත්මක විය. එබැවින් කෙටි කාලයක් තුළ හෙක්ටයාර 15,000 ක පමණ වතු මිලදී ගැනීමට හැකි විය. ශක්තිමත් පනතක් මගින් ස්ථාපිත කිරීම සහ ඒ අනුව නිසි කළමනාකරණය මෙම වර්ධනයට හේතු විය.

1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ සහ 1975 සංශෝධිත පනත යටතේ ජනසතු කරන ලද වතුවලින් වතු 250ක් පමණ සහ පවතින භාරයන් අවලංගු කිරීම නිසා අත්පත් කරගත් වතුවලින් වතු 250ක් පමණ එතෙක් හිමිව තිබූ වතු 25ක් පමණ පවත්වාගෙන ගිය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සංවර්ධනය හා නගාසිටුවීමේ අරමුණ පෙරදැරිව හිමිකර දෙන ලදි. එලෙසම අත්පත් කරගත් අනෙකුත් වතු ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පිහිටුවීමෙන් පසු එම ආයතනය වෙත පවරාදී ඇත.

විශාල වශයෙන් පුළුල් කළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වැඩිදියුණු කිරීමට කළමනාකරණ ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍ය විය. එමනිසා වතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා 1977 දී බලයට පත් රජය විසින් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇත. ඒ අනුව වතු පරිපාලනය විමධ්‍යගත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත 1979 අංක 4 දරන පනත මගින් සංශෝධනය කර ඇත. එම පනතේ 2 වැනි වගන්තියට අනුව ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යන නම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ලෙස සංශෝධනය විය.

තවද, 1979 අංක 49 (සංශෝධිත) පනතේ අංක 6 වැනි වගන්තියට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගමේ අරමුණු පහත පරිදි පුළුල් වී ඇත.

අ) නිසි කෘෂිකාර්මික කළමනාකරණයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා වතු ඉඩම් ප්‍රවර්ධනය කිරීම.

ආ) ඉඩම්වල පවතින වගාවන් ප්‍රතිසංස්කරණය කිරීමෙන් නිසි කළමනාකරණයක් සහ සම්බන්ධීකරණයක් ඇතිව කෘෂිකාර්මික වගාවන් විවිධාංගීකරණය කිරීම.

ඇ) කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම සහ විකිණීම.

ඈ) වතුවල සත්ව පාලනය සංවර්ධනය.

ඉ) වතුවල කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ ස්ථාපිත කිරීම සහ හොඳින් නඩත්තු කිරීම.

ඊ) වැවිලි සංස්ථාවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය සියලුම ක්‍රියා පටිපාටි සහ ක්‍රියාකාරකම් සිදු කිරීම.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු කළමනාකරණය සහ විමධ්‍යගත ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා 1980 වර්ෂය තුළ බොහෝ පියවර ගන්නා ලදී. ඒ අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතට පත්ව ඇත. 1980 පෙබරවාරි මාසයේදී ප්‍රාදේශීය කාර්යාලවල කාර්යසාධනය වැඩි කිරීම සඳහා වැඩි බලතල සහිත ප්‍රාදේශීය මණ්ඩල හතරක් පිහිටුවන ලදී. ඒවා SLSPC I, II, III සහ IV ලෙස නම් කර ඇත. 1984 දී මෙම ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කරමින් බලංගොඩ සහ මාතලේ අවට වතු නිසිලෙස කළමනාකරණය කිරීම සඳහා SLSPC V සහ VI ලෙස නම් කරමින් තවත් මණ්ඩල දෙකක් ස්ථාපිතකර ඇත. මේ ආකාරයට වතු කළමනාකරණය විමධ්‍යගත කළද ප්‍රතිපත්ති සම්පාදනය, අලෙවිකරණය, ගබඩාකරණය සහ මූල්‍ය කටයුතු කොළඹ පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මධ්‍යම මණ්ඩලය මගින් සිදු කරන ලදී.

මෙම ප්‍රතිසංස්කරණවල අකාර්යක්ෂමතාවය සහ අඩු ඵලදායිතාව අවබෝධ කර ගැනීමෙන් පසුව රජය 1992 දී රාජ්‍ය සංස්ථා සහ දේපළ පෞද්ගලික සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ වැවිලි සමාගම් 22ක් පිහිටුවන ලදී. එම ප්‍රාදේශීය වැවිලි සමාගම් 22 වෙත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ලාභදායී සහ ඉහළ කෘෂිකාර්මික ඵලදායිතාවයක් සහිත වතු 402 දිගුකාලීන බදු පදනම යටතේ පවරා දී ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ඉතිරිව තිබුණේ දිගුකාලීන පාඩු ලබන උඩරට සහ පහතරට තේ වල ඇති ලාක්ෂණික ගුණාංග නොමැතිකම හේතුවෙන් අඩු විකුණුම් මිලක් සහිත  මැදරට තේ නිෂ්පාදනය කරන වතුයායන් 55ක් පමණි. මෙම වතු 55 න් වතු 32 ක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් විය. මෙම වතු 32 න් වතු 11 ක් 1993 දී සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමට පවරා දී ඇත. ඒ අනුව, ඉතිරි වතු 11 ක් ඒකාබද්ධ කර වතු 16 ක් පිහිටුවා ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට යටත් කර ඇත. මෙම වතුවල විශාල ප්‍රදේශයක් පැරණි බීජ තේ වලින් සමන්විත වන අතර මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල නකල්ස් කඳුවැටිය අවට ඉඩම් දුර්වල පස් තට්ටුවකින් සමන්විත වේ. එම නිසා මෙම මැදරට වතුවල ස්වභාවිකව කොළ පැහැති දළු අස්වැන්න ඉතා අඩු මට්ටමක පවතී. වෙළෙඳ පොළ මිල පහළ මට්ටමක පැවතීම සහ අස්වැන්න අඩු මට්ටමක පවතින බැවින් මෙම වතු දිගුකාලීන පාඩු සහිත වතු ලෙස සැලකේ.

එසේම 1992 වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සියලුම කාර්ය මණ්ඩලයම විශ්‍රාම ගැන්වීමෙන් සියලු කටයුතු නවතා දමා තිබුණි.1994 දී නව කාර්ය මණ්ඩලයක් බඳවා ගනිමින් මෙහෙයුම් නැවත ආරම්භ කර ඇත. එදා සිට 2006 වර්ෂය දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයට යටත් කර තිබුණි. 2001 සිට 2004 දක්වා කාලය තුළ පාඩු ලබන මෙම සංස්ථාව රජයට බරක් ලෙස සැලකේ. එබැවින් රජයට බරක් වීම අවම කර ගැනීමේ අරමුණින් සමහර වතු සහ වත්කම් දිගුකාලීන බදු පදනම මත ලබා දී ඇත.

ආයෝජන මණ්ඩලයේ නිර්දේශය යටතේ ඇතැම් ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයට බදු දී තිබූ වෛතලාව, වුඩ්සයිඩ්, හෙයාර්පාර්ක්, කොටගහ කර්මාන්තශාලාව වැනි වතු එම ව්‍යාපෘති අසාර්ථක වීම නිසා බදු දුන් පාර්ශව විසින් අත්හැර දමා ඇත. පසුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හෙයාර්පාර්ක් වත්ත සහ කොටගහ කර්මාන්තශාලාව වගකීම් රැසක් සමඟ පවරා ගැනීමට සිදු විය. අයහපත් කළමනාකරණය හේතුවෙන් අනවසර අත්පත් කර ගැනීම් සහ නඩත්තු නොකිරීම හේතුවෙන් වතුයාය වඩ වඩාත් පාඩු ලබන ආකාරය අත්හැර දැමූ හෙයාර්පාර්ක් වත්තෙන් මනාව පිළිබිඹු විය. පසුව වෛතලාව සහ වුඩ්සයිඩ් වතු වෙනත් පෞද්ගලික සමාගමකට පවරා දුන් අතර නිසි කළමනාකාරීත්වය නොමැතිකම හේතුවෙන් එම සමාගම වුඩ්සයිඩ් වත්ත අතහැර වෛතලාව වත්ත පමණක් තම පාලනය යටතේ තබාගෙන ඇත.

2006 දී රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව රාජ්‍ය ව්‍යවසායක ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයෙන් බැහැර කර උපාය මාර්ගික ව්‍යවසායකයින්ගේ ආයතනයේ විෂය පථයට යටත් කරමින් රජයේ උපායමාර්ගික සංවිධානයක් ලෙස කළමනාකරණය කිරීමට නව ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. කළමනාකරණ උපාය මාර්ගික ව්‍යවසායක කළමනාකරණ ආයතනයේ මැදිහත්වීම යටතේ තේ වගාවන් වෙනස් වූවා සේම මෙම වතු පරිපාලනය කිරීමේ ක්‍රමවේදයද වෙනස් විය. ඒ අනුව, වතුයායේ වත්කම් කළමනාකරණය පිළිබඳ නව සංකල්පයක් හඳුන්වා දී ඇත.

සංස්ථාවේ විවිධ වත්කම් එනම්, දැව සම්පත රු. මිලියන 3000ක් වන අතර, කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකිරීමට ශක්‍යතාවක් ඇති ස්ථාන, කාබන් තිරකිරීම ගණනය කිරීම මගින් අලෙවි කිරීම සහ පාඩු ලබන වතුවල භෝග විවිධාංගීකරණය කිරීම මෙම නව සංකල්පය යටතේ හඳුනාගෙන ඇත.

2007 වසරේ නකල්ස් ලෝක උරුම ගැසට් පත්‍රය සමඟින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත්ව තිබූ ඉඩම් ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ලෝක උරුමයට නතුවිය. ඒ අනුව වාණිජ වනවගාව, එනසාල් වගාව ඇති ඉඩම් මෙන්ම තේ වගාව ඇති ඉඩම් ද නකල්ස් රක්ෂිතය යටතට පත්ව ඇත. කෙසේවෙතත්, ඉඩම් ප්‍රමාණය රක්ෂිතය යටතට පත් වූ නිසාත් මායිම් අවිනිශ්චිත වූ නිසාත් වතු කළමනාකරණය මෙන්ම රක්ෂිතය කළමනාකරණය කිරීම ගැටලු සහගත විය.








## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වඩාත් ආකර්ෂණීය ස්ථාන

## කැලෑබොක්ක $360^0$ දර්ශන පථය (වීව් පොයින්ට්)





කැලෑබොක්ක $360^0$ වීව් පොයින්ට් (උස: මීටර් 1,175) ප්‍රචනතා ගමනාන්තයක් බවට පත් විය. කඳු මුදුන මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල මායිමේ පිහිටා ඇති අතර හත්ලේ කුඩා ලෝකාන්තය සහ හුන්නස්ගිරිය කන්ද සැදෙන එකම කඳු මුදුන බෙදා ගනී. කඳුවැටිය උතුරට විහිදෙන අතර නකල්ස්හි බටහිර ස්කන්ධය සමඟ සම්බන්ධ වේ. පැහැදිලි දිනයක, නරඹන්නන්ට මධ්‍යම කඳුකරය, මහනුවර නගරය, සෙම්බුවත්ත වැව සහ නකල්ස් කඳුකරය නිරීක්ෂණය කළහැකි ආකර්ෂණීය ස්ථානයක් වේ.
අමුත්තන්ට නවාතැන් ගැනීමට කඳවුරු බිමක් සහ වතු බංගලා 02ක් ඇත. පැතලි කඳු මුදුනේ මැද භාගයේ නිම කරන ලද හින්දු සිද්ධස්ථානයක් සහ දර්ශන භුක්ති විඳීමට කූරු භාවිතයෙන් සාදන ලද පැල්පතක් ඇත. දහවල් කාලයේදී ප්‍රදේශය ආවරණය වන පරිදි මීදුම නිසා බාධාවකින් තොරව දර්ශන භුක්ති විඳීමට උදෑසන සංචාරය කිරීම වඩා යෝග්‍ය වේ.

## බර්න්සයිඩ්









මහනුවර පිහිටා ඇති, බර්න්සයිඩ් බංගලාව රංගල පොල්ගොල්ල ජලාශයේ සී ප්ලේන් ගුවන් තොටුපළේ සිට සැතපුම් 13 ක් දුරින් පිහිටා ඇති ආකර්ෂණීය ස්ථානයකි. මෙහි නාන කාමර සහිත විශාල නිදන කාමර 03ක් ඇති අතර එහි පුද්ගලයන් 18 දෙනෙකුට නවාතැන් පහසුකම් ලබාදිය හැකිය.

## දන්කන්ද වැව - මිඩ්ලන්ඩ්ස්







දර්ශනීය දන්කන්ද වැව මධ්‍යම පළාතේ ජලාශයක් වන අතර එහි උස මීටර් 957 කි. මෙම දන්කන්ද වැව, කිරිමැටියාරන්දට සහ දංකන්ද වත්තට ආසන්නව සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මිඩ්ලන්ඩ්ස් වතුයායට නුදුරින් පිහිටා ඇත. මාතලේ රිවස්ටන් කලාපයේ, දන්කන්ද වැව ඉස්මත්තේ කඳවුරු බිමක අත්දැකීමක් ලබා ගැනීමට දේශීය විදේශීය සංචාරකයන්ට අවස්ථාව සලසා ඇත.

## හුන්නස්ගිරිය








මහනුවර නගරයේ සිට කිලෝමීටර 22ක දුරින් හා මාතලේ දිස්ත්‍රික්කයේ ඇල්කඩුව ගම්මානයට ආසන්නයේ පිහිටි නකල්ස් කඳු පංතියත් හුන්නස්ෆෝල්ස් දිය ඇල්ලත් දෙස් විදෙස් සංචාරකයින්ගේ සිත්ගත් ආකර්ෂණීය ස්ථානයකි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය මඟින් මෙම දිය ඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් සලසා දී ඇත.

## වැවතැන්න - වූඩ්සයිඩ්










වැවතැන්න කඳවුරු භූමිය, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයෙහි මැදමහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති වූඩ්සයිඩ් රාජ්‍ය වතුයායෙහි පිහිටා ඇති අතර මහනුවර නගරයේ සිට කිලෝමීටර 37.9ක දුරින් පිහිටා ඇත. මෙම සුන්දර කඳවුරු භූමියවෙත යන මාවත තරමක් දුෂ්කර වුව ද එය ඉතා සුන්දර අත්දැකීම් බහුල ගමනකි. මහනුවර සිට වැවතැන්න දක්වා යන අතරමඟදී විස්මිත සහ ලෝක ප්‍රසිද්ධ වික්ටෝරියා වේල්ල (ඩැම්) හමුවීම ද තවත් අපූර්වත්වයකි.

| | |
|---|---|
| <u>**සම්බන්ධීකරණ තොරතුරු**</u> | |
| **සම්බන්ධීකරණ නිලධාරි** | **:** අමිල ජයවර්ධන මහතා |
| **සම්බන්ධීකරණ මධ්‍යස්ථානය** | **:** ප්‍රාදේශීය කායාීලය |
| **ලිපිනය** | **:** ප්‍රාදේශීය කායාීලය, ගල්පිහිල්ල, පන්විල. |
| **දුරකථන අංකය** | **:** 081-5634903 |
| **ෆැක්ස් අංකය** | **:** 081-5634902 |
| **විද්‍යුත් තැපෑල** | **:** regionalofficegp@gmail.com |

## 2023 වර්ෂය තුළ රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් පාලනය වන වතුයායන්හි තත්ත්වය

2023 වර්ෂය ආරම්භයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි කළමනාකරණය යටතේ වතු 17 ක් තිබූ අතර ඉන් වතු 16ක් මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති අතර, වලහන්දුව වතුයාය ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇත

.

**වගුව 01- වතුයායන්හි විස්තර**

| අංකය | වතුයායෙහි නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|---|---|
| 1 | අල්ලකොල්ල | මහනුවර | පන්විල | 819.86 |
| 2 | කොටගඟ | මහනුවර | මැදදුම්බර | 1,059.81 |
| 3 | ගල්පිල්ල | මහනුවර | පන්විල/කුණ්ඩසාලේ | 761.24 |
| 4 | ගෝමර | මහනුවර | පන්විල | 731.13 |
| 5 | හාගල | මහනුවර | පන්විල | 449.49 |
| 6 | හෙයාපාර්ක් | මහනුවර | උඩුකුඹුර | 976.75 |
| 7 | හුන්නස්ගිරිය | මාතලේ | උකුවෙල | 739.72 |
| 8 | කැලැබොක්ක | මහනුවර | පන්විල | 1,370.36 |
| 9 | මිඩ්ලන්ඩ් | මාතලේ | රත්තොට | 1,221.31 |
| 10 | නිකොලඔය | මාතලේ | රත්තොට | 332.41 |
| 11 | ඔපල්ගල | මාතලේ | මැදදුම්බර | 759.10 |
| 12 | රංගල | මහනුවර | මැදදුම්බර | 630.60 |
| 13 | වෛයිතලාව | මහනුවර | මැදදුම්බර | 552.05 |
| 14 | වුඩ්සයිඩ් | බදුල්ල | හල්දුම්මුල්ල | 472.75 |
| 15 | විහාරගල | මහනුවර | මැදදුම්බර | 41.90 |
| 16 | වලහන්දුව | ගාල්ල | අක්මීමණ | 71.38 |
| | **මුළු එකතුව** | | | **10,989.86** |

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය

**වගුව 02 - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (නුවරඑළිය දිස්ත්‍රික්කය )**

| අංකය | දිස්ත්‍රික්කය | වතුයායේ නම | වත්මන් කළමනාකරණ සමාගම |
|---|---|---|---|
| 1 | නුවරඑළිය | වෙදමුල්ල | අගලවත්ත වැවිලි සමාගම |
| 2 | නුවරඑළිය | නායබැද්ද | ආගරපතන වැවිලි සමාගම |
| 3 | නුවරඑළිය | එඩින්බරෝ | කැලණි වැවිලි සමාගම |
| 4 | නුවරඑළිය | ග්ලාස්ගෝ | කැලණි වැවිලි සමාගම |
| 5 | නුවරඑළිය | මහගස්තොට | කැලණි වැවිලි සමාගම |
| 6 | නුවරඑළිය | පේද්‍රෝ | කැලණි වැවිලි සමාගම |
| 7 | නුවරඑළිය | උඩරුදැල්ල | කැලණි වැවිලි සමාගම |
| 8 | නුවරඑළිය | බ්ලින්ක්බොනි | කැලණි වැවිලි වැවිලි සමාගම |
| 9 | නුවරඑළිය | මවුන්ට්ජින් | ජනතා වතු සංවර්ධන මණ්ඩලය |
| 10 | නුවරඑළිය | බෙයාවේල් | තලවාකැලේ වැවිලි සමාගම |
| 11 | නුවරඑළිය | කැල්සි | තලවාකැලේ වැවිලි සමාගම |
| 12 | නුවරඑළිය | ක්ලැරෙන්ඩන් | තලවාකැලේ වැවිලි සමාගම |
| 13 | නුවරඑළිය | ඩෙස්ෆෝර්ඩ් | තලවාකැලේ වැවිලි සමාගම |
| 14 | නුවරඑළිය | මහා-බටහිර | තලවාකැලේ වැවිලි සමාගම |
| 15 | නුවරඑළිය | හොලිරූඩ් | තලවාකැලේ වැවිලි සමාගම |
| 16 | නුවරඑළිය | ලොගී | තලවාකැලේ වැවිලි සමාගම |
| 17 | නුවරඑළිය | මට්ටකැලේ | තලවාකැලේ වැවිලි සමාගම |
| 18 | නුවරඑළිය | තල්ගල් | තලවාකැලේ වැවිලි සමාගම |
| 19 | නුවරඑළිය | රදැල්ල | තලවාකැලේ වැවිලි සමාගම |
| 20 | නුවරඑළිය | සමර්සෙට් | තලවාකැලේ වැවිලි සමාගම |
| 21 | නුවරඑළිය | සෝගම | පුස්සැල්ලාව වැවිලි සමාගම |
| 22 | නුවරඑළිය | රම්බොඩ | පුස්සැල්ලාව වැවිලි සමාගම |
| 23 | නුවරඑළිය | පෙට්‍රෙසෝව් | බගවන්තලාව වැවිලි සමාගම |
| 24 | නුවරඑළිය | පොයිස්ටෝන් | බගවන්තලාව වැවිලි සමාගම |
| 25 | නුවරඑළිය | බෝගවාන | බගවන්තලාව වැවිලි සමාගම |
| 26 | නුවරඑළිය | වැප්ලන් | බගවන්තලාව වැවිලි සමාගම |
| 27 | නුවරඑළිය | කාසල්රි | බගවන්තලාව වැවිලි සමාගම |
| 28 | නුවරඑළිය | එලොපිට්ස් | බගවන්තලාව වැවිලි සමාගම |
| 29 | නුවරඑළිය | බගවන්තලාව | බගවන්තලාව වැවිලි සමාගම |
| 30 | නුවරඑළිය | නෝර්වුඩ් | බගවන්තලාව වැවිලි සමාගම |
| 31 | නුවරඑළිය | කොටියාගල | බගවන්තලාව වැවිලි සමාගම |
| 32 | නුවරඑළිය | ලොයිනෝර් | බගවන්තලාව වැවිලි සමාගම |
| 33 | නුවරඑළිය | මිඩ්ෆෝර්ඩ් | බගවන්තලාව වැවිලි සමාගම |
| 34 | නුවරඑළිය | ඔස්බෝන් / කැල්වර්ටන් | බගවන්තලාව වැවිලි සමාගම |
| 35 | නුවරඑළිය | ටියන්ස්ටින් | බගවන්තලාව වැවිලි සමාගම |
| 36 | නුවරඑළිය | කැම්පියන් | බගවන්තලාව වැවිලි සමාගම |
| 37 | නුවරඑළිය | ලෙතෙන්ටි | බගවන්තලාව වැවිලි සමාගම |
| 38 | නුවරඑළිය | මොරර් | මඩුල්සිම පල්න්ටේෂන් සමාගම |
| 39 | නුවරඑළිය | වෙන්වර් | මඩුල්සිම වතුයාය සමාගම |

| | | | |
|---|---|---|---|
| 40 | නුවරඑළිය | ශාන්ත ජෝන් ඩෙලරි | මඩුල්සීම වතුයාය සමාගම |
| 41 | නුවරඑළිය | තෙරේසියා | මඩුල්සීම වතුයාය සමාගම |
| 42 | නුවරඑළිය | කීව් | මඩුල්සීම වැවිලි සමාගම |
| 43 | නුවරඑළිය | මතුරට | මතුරට වැවිලි සමාගම |
| 44 | නුවරඑළිය | වෙල්සියා | මල්වත්ත නිම්නය වැවිලි |
| 45 | නුවරඑළිය | මස්කෙළිය | මස්කෙළිය වැවිලි සමාගම |
| 46 | නුවරඑළිය | ඇඩම්ස්පීක් | මස්කෙළිය වැවිලි සමාගම |
| 47 | නුවරඑළිය | බ්‍රවුන්ස්වික් | මස්කෙළිය වැවිලි සමාගම |
| 48 | නුවරඑළිය | බ්රවුන්ලෝ | මස්කෙළිය වැවිලි සමාගම |
| 49 | නුවරඑළිය | ඩීන්සයිඩ් | මස්කෙළිය වැවිලි සමාගම |
| 50 | නුවරඑළිය | ග්ලෙනූජී | මස්කෙළිය වැවිලි සමාගම |
| 51 | නුවරඑළිය | ලක්ෂපාන | මස්කෙළිය වැවිලි සමාගම |
| 52 | නුවරඑළිය | මෝකා | මස්කෙළිය වැවිලි සමාගම |
| 53 | නුවරඑළිය | මොරේ | මස්කෙළිය වැවිලි සමාගම |
| 54 | නුවරඑළිය | ක්වීන්ස්ලැන්ඩ් | මස්කෙළිය වැවිලි සමාගම |
| 55 | නුවරඑළිය | ස්ට්‍රස්ත්ස්පෙ | මස්කෙළිය වැවිලි සමාගම |
| 56 | නුවරඑළිය | ක්රේග් | මස්කෙළිය වැවිලි සමාගම |
| 57 | නුවරඑළිය | ෆර්හැම් | මස්කෙළිය වැවිලි සමාගම |
| 58 | නුවරඑළිය | ශාන්ත ක්ලෙයාර් | මස්කෙළිය වැවිලි සමාගම |
| 59 | නුවරඑළිය | තලවාකැලේ | මස්කෙළිය වැවිලි සමාගම |
| 60 | නුවරඑළිය | බින්ඔය | වටවල වැවිලි සමාගම |
| 61 | නුවරඑළිය | ෂැනන් | වටවල වැවිලි සමාගම |
| 62 | නුවරඑළිය | උවාකැලේ | වටවල වැවිලි සමාගම |
| 63 | නුවරඑළිය | තංගකැලේ | වටවල වැවිලි සමාගම |
| 64 | නුවරඑළිය | කැරොලිනා | වටවල වැවිලි සමාගම |
| 65 | නුවරඑළිය | ශාන්ත හෙලීස් | වටවල වැවිලි සමාගම |
| 66 | නුවරඑළිය | හොට්වෙල් | වටවල වැවිලි සමාගම |
| 67 | නුවරඑළිය | ඇල්ටන් | හොරණ වැවිලි සමාගම |
| 68 | නුවරඑළිය | ෆෙයාලොන් | හොරණ වැවිලි සමාගම |
| 69 | නුවරඑළිය | ගවරවිල | හොරණ වැවිලි සමාගම |
| 70 | නුවරඑළිය | මහනිල්ලු | හොරණ වැවිලි සමාගම |
| 71 | නුවරඑළිය | ස්ටොක්හෝම් | හොරණ වැවිලි සමාගම |

වගුව 03 - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (කළුතර දිස්ත්‍රික්කය )

| අංකය | දිස්ත්‍රික්කය | වතුයායේ නම | වත්මන් කළමනාකරණ සමාගම |
|---|---|---|---|
| 1 | කළුතර | පාර්ට් ඔෆ්ක්ලයිඩ් කොටස | අගලවත වැවිලි සමාගම |
| 2 | කළුතර | පයාගල | අගලවත වැවිලි සමාගම |
| 3 | කළුතර | ක්ලයියිඩ් | අගලවත්ත වැවිලි සමාගම |
| 4 | කළුතර | කිරිවන්කැටිය | අගලවත්ත වැවිලි සමාගම |
| 5 | කළුතර | මොහොමඩි | අගලවත්ත වැවිලි සමාගම |
| 6 | කළුතර | පිඹුර | අගලවත්ත වැවිලි සමාගම |
| 7 | කළුතර | දුම්බර | අගලවත්ත වැවිලි සමාගම |
| 8 | කළුතර | ලාගෝස් | කොටගල වැවිලි සමාගම |
| 9 | කළුතර | අරුපොලකන්ද | කොටගල වැවිලි සමාගම |
| 10 | කළුතර | ඩෙල්කීත් | කොටගල වැවිලි සමාගම |
| 11 | කළුතර | ඇදුරගල | කොටගල වැවිලි සමාගම |
| 12 | කළුතර | ගීකියනකන්ද | කොටගල වැවිලි සමාගම |
| 13 | කළුතර | හැගල්ල | කොටගල වැවිලි සමාගම |
| 14 | කළුතර | හැඩිගල්ල | කොටගල වැවිලි සමාගම |
| 15 | කළුතර | මිල්ලෑව | කොටගල වැවිලි සමාගම |
| 16 | කළුතර | පාදුක්ක | කොටගල වැවිලි සමාගම |
| 17 | කළුතර | පර්ත් | කොටගල වැවිලි සමාගම |
| 18 | කළුතර | රයිගම | කොටගල වැවිලි සමාගම |
| 19 | කළුතර | සොරණ | කොටගල වැවිලි සමාගම |
| 20 | කළුතර | උස්ක්වැලි | කොටගල වැවිලි සමාගම |
| 21 | කළුතර | වෝගන් | කොටගල වැවිලි සමාගම |
| 22 | කළුතර | ඩෙල්කිත් | කොටගල වැවිලි සමාගම |
| 23 | කළුතර | එලදූව | නමුණුකුල වැවිලි සමාගම |
| 24 | කළුතර | මිරිස්වත්ත | නමුණුකුල වැවිලි සමාගම |
| 25 | කළුතර | පල්ලේගොඩ | නමුණුකුල වැවිලි සමාගම |
| 26 | කළුතර | සිරිකඳුර | නමුණුකුල වැවිලි සමාගම |
| 27 | කළුතර | අඹතැන්න | බලංගොඩ වැවිලි සමාගම |
| 29 | කළුතර | ෆ්රොසෙස්ටර් | හොරණ වැවිලි සමාගම |
| 30 | කළුතර | හල්වතුර | හොරණ වැවිලි සමාගම |
| 31 | කළුතර | හිල්ස්ට්රීම් | හොරණ වැවිලි සමාගම |
| 32 | කළුතර | කොබෝවැල්ල | හොරණ වැවිලි සමාගම |
| 33 | කළුතර | මිල්ලකන්ද | හොරණ වැවිලි සමාගම |
| 34 | කළුතර | මිරිස්හේන | හොරණ වැවිලි සමාගම |
| 35 | කළුතර | නිවුවැටල් | හොරණ වැවිලි සමාගම |

වගුව 04 - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (රත්නපුර දිස්ත්‍රික්කය )

| අංකය | දිස්ත්‍රික්කය | වතුයායේ නම | වත්මන් කළමනාකරණ සමාගම |
|---|---|---|---|
| 1 | රත්නපුර | දෙල්ගොඩ | අගලවත්ත වැවිලි සමාගම |
| 2 | රත්නපුර | දොලොස්වෙල | අගලවත්ත වැවිලි සමාගම |
| 3 | රත්නපුර | කිරිබත්ගල | අගලවත්ත වැවිලි සමාගම |
| 4 | රත්නපුර | නිරිඇල්ල /නිරිවත්ත | අගලවත්ත වැවිලි සමාගම |
| 5 | රත්නපුර | නොරගල | අගලවත්ත වැවිලි සමාගම |
| 6 | රත්නපුර | පිංකන්ද | අගලවත්ත වැවිලි සමාගම |
| 7 | රත්නපුර | වට්ටපොත | අගලවත්ත වැවිලි සමාගම |
| 8 | රත්නපුර | ගලේබොද්ද | ආගරපත්න වැවිලි සමාගම |
| 9 | රත්නපුර | මවුස්සා | උඩප්පුස්සැල්ලාව වතුයාය සමාගම |
| 10 | රත්නපුර | පැල්මඩුල්ල | කහවත්ත වැවිලි සමාගම |
| 11 | රත්නපුර | පොරනුව | කහවත්ත වැවිලි සමාගම |
| 12 | රත්නපුර | එකරැල්ල | කහවත්ත වැවිලි සමාගම |
| 13 | රත්නපුර | එන්ඩනේ | කහවත්ත වැවිලි සමාගම |
| 14 | රත්නපුර | හෝප් | කහවත්ත වැවිලි සමාගම |
| 15 | රත්නපුර | හුණුවැල්ල | කහවත්ත වැවිලි සමාගම |
| 16 | රත්නපුර | යටදොල | කහවත්ත වැවිලි සමාගම |
| 17 | රත්නපුර | ඕපාත | කහවත්ත වැවිලි සමාගම |
| 18 | රත්නපුර | රිල්හේන | කහවත්ත වැවිලි සමාගම |
| 19 | රත්නපුර | වැල්ලඳුර | කහවත්ත වැවිලි සමාගම |
| 20 | රත්නපුර | ඇහැලියගොඩ | පුස්සැල්ලාව වතුයාය සමාගම |
| 21 | රත්නපුර | දුරම්පිටිය | පුස්සැල්ලාව වතුයාය සමාගම |
| 22 | රත්නපුර | කීරගල | පුස්සැල්ලාව වතුයාය සමාගම |
| 23 | රත්නපුර | පුස්සැල්ල | පුස්සැල්ලාව වතුයාය සමාගම |
| 24 | රත්නපුර | සන්ඩර්ලන්ඩ් | පුස්සැල්ලාව වතුයාය සමාගම |
| 25 | රත්නපුර | ඇහැලියගොඩ | පුස්සැල්ලාව වතුයාය සමාගම |
| 26 | රත්නපුර | කැම්පියන් | බගවන්තලාව වැවිලි සමාගම |
| 27 | රත්නපුර | ෆාම්ගාඩන් කොටසක් | බලංගොඩ වැවිලි සමාගම |
| 28 | රත්නපුර | මහවෙල | බලංගොඩ වැවිලි සමාගම |
| 29 | රත්නපුර | රයි | බලංගොඩ වැවිලි සමාගම |
| 30 | රත්නපුර | ඊගස්ලන්ඩ් | බලංගොඩ වැවිලි සමාගම |
| 31 | රත්නපුර | බලන්ගොඩ | බලංගොඩ වැවිලි සමාගම |
| 32 | රත්නපුර | සිසිල්ටන් | බලංගොඩ වැවිලි සමාගම |
| 33 | රත්නපුර | ගලතුර | බලංගොඩ වැවිලි සමාගම |
| 34 | රත්නපුර | මිල්ලවිටිය | බලංගොඩ වැවිලි සමාගම |
| 35 | රත්නපුර | මතුවාගල | බලංගොඩ වැවිලි සමාගම |
| 36 | රත්නපුර | තල්වත්ත | බලංගොඩ වැවිලි සමාගම |
| 37 | රත්නපුර | පෙතියාගල | බලංගොඩ වැවිලි සමාගම |
| 38 | රත්නපුර | රඹුක්කන්ද | බලංගොඩ වැවිලි සමාගම |
| 39 | රත්නපුර | වලබොඩ | බලංගොඩ වැවිලි සමාගම |
| 40 | රත්නපුර | වාවිල | බලංගොඩ වැවිලි සමාගම |

| | | | |
|---|---|---|---|
| 41 | රත්නපුර | විකිලිය | බලංගොඩ වැවිලි සමාගම |
| 42 | රත්නපුර | රාස්සගල | බලංගොඩ වැවිලි සමාගම |
| 43 | රත්නපුර | මද්දකන්ද | බලංගොඩ වැවිලි සමාගම |
| 44 | රත්නපුර | සපුමල්කන්ද | බලංගොඩ වැවිලි සමාගම |
| 45 | රත්නපුර | පෙරියල් නොවන | බලංගොඩ වැවිලි සමාගම |
| 46 | රත්නපුර | ලංකාබෙරිය | මතුරට වැවිලි සමාගම |
| 47 | රත්නපුර | පනිල්කන්ද | මතුරට වැවිලි සමාගම |
| 48 | රත්නපුර | හේයි | මස්කෙළිය වැවිලි සමාගම |
| 50 | රත්නපුර | මාදම්පේ/දිප්දීන් | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 51 | රත්නපුර | ඇග්බර්ත් | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 52 | රත්නපුර | ඇලර්ටන් | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 53 | රත්නපුර | ඩෙපෙඩීන් | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 54 | රත්නපුර | හයරි | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 55 | රත්නපුර | ලොල්ලුපිටිය | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 56 | රත්නපුර | ස්ප්‍රින්ග්වුඩ් | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 57 | රත්නපුර | හපුගස්තැන්න | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 58 | රත්නපුර | අළුපොල | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 59 | රත්නපුර | ගලබොඩ | හපුගස්තැන්න වැවිලි සමාගම |

**වගුව 05 - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (ගාල්ල දිස්ත්‍රික්කය )**

| අංකය | දිස්ත්‍රික්කය | වතුයායේ නම | වත්මන් කළමනකරණ සමාගම |
|---|---|---|---|
| 1 | ගාල්ල | ලේල්වල | ඇල්පිටිය වැවිලි සමාගම |
| | ගාල්ල | ගුලුගහකන්ද | ඇල්පිටිය වැවිලි සමාගම |
| 3 | ගාල්ල | දිවිතුර | ඇල්පිටිය වැවිලි සමාගම |
| 4 | ගාල්ල | කැටන්දොල | ඇල්පිටිය වැවිලි සමාගම |
| 5 | ගාල්ල | නාගොඩ සමූහ | ඇල්පිටිය වැවිලි සමාගම |
| 6 | ගාල්ල | රත්නවල සහ නාගොඩ | ඇල්පිටිය වැවිලි සමාගම |
| 7 | ගාල්ල | ඇල්පිටිය | ඇල්පිටිය වැවිලි සමාගම |
| | ගාල්ල | බෙන්තොට | ඇල්පිටිය වැවිලි සමාගම |
| 9 | ගාල්ල | ඉහළකන්ද | ඇල්පිටිය වැවිලි සමාගම |
| 10 | ගාල්ල | මාපලගම | ඇල්පිටිය වැවිලි සමාගම |
| 11 | ගාල්ල | ඇල්පිටිය | ඇල්පිටිය වැවිලි සමාගම |
| 12 | ගාල්ල | මොරගල | තලවාකැලේ වතුයාය සමාගම |
| 13 | ගාල්ල | පිටියගොඩ | තලවාකැලේ වතුයාය සමාගම |
| 14 | ගාල්ල | වලහන්දූව | තලවාකැලේ වතුයාය සමාගම |
| 15 | ගාල්ල | වත්තේගොඩ | තලවාකැලේ වතුයාය සමාගම |
| 16 | ගාල්ල | බද්දේගම | නමුණුකුල වැවිලි සමාගම |
| 17 | ගාල්ල | වල්පිට | නමුණුකුල වැවිලි සමාගම |
| 18 | ගාල්ල | ඇග්රොක් | නමුණුකුල වැවිලි සමාගම |
| 19 | ගාල්ල | වැවේගොඩවත්ත | නමුණුකුල වැවිලි සමාගම |
| 20 | ගාල්ල | පොල්ගහවිල්ල | නමුණුකුල වැවිලි සමාගම |
| 21 | ගාල්ල | පිල්ලගොඩවල්ලි | නමුණුකුල වැවිලි සමාගම |
| 22 | ගාල්ල | අඳුන්කැලේ | නමුණුකුල වැවිලි සමාගම |

| | | | |
|---|---|---|---|
| 23 | ගාල්ල | මොන්රෝවියා | නමුණුකුල වැවිලි සමාගම |
| 24 | ගාල්ල | තංගල්ල | වටවල වැවිලි සමාගම |
| 25 | ගාල්ල | ඉහළ හෝමදොල | වටවල වැවිලි සමාගම |
| 26 | ගාල්ල | නාකියාදෙණිය | වටවල වැවිලි සමාගම |
| 27 | ගාල්ල | හෝමදොල | වටවල වැවිලි සමාගම |
| 28 | ගාල්ල | නාකියාදෙණිය ආර්.ඊ | වටවල වැවිලි සමාගම |
| 29 | ගාල්ල | ස්ටොක්සාලන්ඩ් | වටවල වැවිලි සමාගම |
| 30 | ගාල්ල | නාකියාදෙණිය ඕ.එෆ් | හපුගස්තැන්න වැවිලි සමාගම |

**වගුව 06 - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (මාතර දිස්ත්‍රික්කය )**

| අංකය | දිස්ත්‍රික්කය | වතුයායේ නම | වත්මන් කළමනාකරණ සමාගම |
|---|---|---|---|
| 1 | මාතර | තල්ගස්වෙල | ඇල්පිටිය වැවිලි සමාගම |
| 2 | මාතර | ගල්ලින්ද | ඇල්පිටිය වැවිලි සමාගම |
| 3 | මාතර | දෙනියාය | තලවාකැලේ වැවිලි සමාගම |
| 4 | මාතර | හැන්ඩ්ෆර්ඩ් | තලවාකැලේ වැවිලි සමාගම |
| 5 | මාතර | කිරිවංගඟ | තලවාකැලේ වැවිලි සමාගම |
| 6 | මාතර | කොබෝමෙල්ල | තලවාකැලේ වැවිලි සමාගම |
| 7 | මාතර | ඉන්දෝලා | තලවාකැලේ වැවිලි සමාගම |
| 8 | මාතර | තැන්නහේන | නමුණුකුල වැවිලි සමාගම |
| 9 | මාතර | ඇල්ලකන්ද | නමුණුකුල වැවිලි සමාගම |
| 10 | මාතර | හුලංදූව | නමුණුකුල වැවිලි සමාගම |
| 11 | මාතර | අකුරැස්ස | නමුණුකුල වැවිලි සමාගම |
| 12 | මාතර | හලාල්ලා | නමුණුකුල වැවිලි සමාගම |
| 13 | මාතර | බෙල්මන්ට් | නමුණුකුල වැවිලි සමාගම |
| 14 | මාතර | දකුණු වාලි කන්ද | නමුණුකුල වැවිලි සමාගම |
| 15 | මාතර | බෙවර්ලි | මතුරට වැවිලි  සමාගම |
| 16 | මාතර | එනසල්වත්ත | මතුරට වැවිලි සමාගම |
| 17 | මාතර | දිද්දෙනිපොත | මතුරට වැවිලි සමගම |
| 18 | මාතර | අනිල්කන්ද | මතුරට වැවිලි සමාගම |
| 19 | මාතර | විල්පිට | මතුරට වැවිලි සමාගම |
| 20 | මාතර | අණ්ඩපාන | මතුරට වැවිලි සමාගම |

වගුව 07 - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (බදුල්ල දිස්ත්‍රික්කය )

| අංකය | දිස්ත්‍රික්කය | වතුයායේ නම | වත්මන් කළමනාකරණ සමාගම |
|---|---|---|---|
| 1 | බදුල්ල | දඹතැන්න | ආගරපතන වැවිලි සමාගම |
| 2 | බදුල්ල | ග්ලෙනෝර් | ආගරපතන වැවිලි සමාගම |
| 3 | බදුල්ල | ගෝනමොටුව | ආගරපතන වැවිලි සමාගම |
| 4 | බදුල්ල | හපුතලේ | ආගරපතන වැවිලි සමාගම |
| 5 | බදුල්ල | පිටරත්මලේ | ආගරපතන වැවිලි සමාගම |
| 6 | බදුල්ල | උඩවේරිය | ආගරපතන වැවිලි සමාගම |
| 7 | බදුල්ල | උසාවිය | ආගරපතන වැවිලි සමාගම |
| 8 | බදුල්ල | රොහ්ම්පටන් | ආගරපත්න වැවිලි සමාගම |
| 9 | බදුල්ල | කහගල්ල | ආගරපතන වැවිලි සමාගම |
| 10 | බදුල්ල | උද්‍යානය | උඩපුස්සැල්ලාව වතුයාය සමාගම |
| 11 | බදුල්ල | හිඳගල | නමුණුකුල වැවිලි සමාගම |
| 12 | බදුල්ල | කිනෙලන් | නමුණුකුල වැවිලි සමාගම |
| 13 | බදුල්ල | පිංගරාව | නමුණුකුල වැවිලි සමාගම |
| 14 | බදුල්ල | දකුණු මැද්දකුඹුර | බලංගොඩ වැවිලි සමාගම |
| 15 | බදුල්ල | අයිස්ලැබ් | මල්වත්ත නිම්නය වැවිලි සමාගම |
| 16 | බදුල්ල | අම්පිටියකන්ද | මස්කෙළිය වැවිලි සමාගම |
| 17 | බදුල්ල | කොස්ලන්ද | මස්කෙළිය වැවිලි සමාගම |
| 18 | බදුල්ල | ලියනගහවැල්ල | මස්කෙළිය වැවිලි සමාගම |
| 19 | බදුල්ල | මහකන්ද | මස්කෙළිය වැවිලි සමාගම |
| 20 | බදුල්ල | පූනගල්ල | මස්කෙළිය වැවිලි සමාගම |
| 21 | බදුල්ල | ගවරකැලේ | වටවල වැවිලි සමාගම |
| 22 | බදුල්ල | විහාරගල | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 23 | බදුල්ල | නාහවිල | හපුගස්තැන්න වැවිලි සමාගම |
| 24 | බදුල්ල | නිව්බර්ග් | හපුගස්තැන්න වැවිලි සමාගම |

වගුව 08 - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (මහනුවර දිස්ත්‍රික්කය )

| අංකය | දිස්ත්‍රික්කය | වතුයායේ නම | වත්මන් කළමනාකරණ සමාගම |
|---|---|---|---|
| 1 | මහනුවර | මාවුස්සාකන්ද | ඇල්කඩුව වැවිලි සමාගම |
| 2 | මහනුවර | දක්වාරි සමූහය | උඩපුස්සැල්ලාව වතුයාය සමාගම |
| 3 | මහනුවර | මඩුල්කැලේ | උඩපුස්සැල්ලාව වතුයාය සමාගම |
| 4 | මහනුවර | ශ්‍රේට්වැලී | ජනතා වතු සංවර්ධන මණ්ඩලය |
| 5 | මහනුවර | ගලහ | ජනතා වතු සංවර්ධන මණ්ඩලය |
| 6 | මහනුවර | උඩුවෙල | ජනතා වතු සංවර්ධන මණ්ඩලය |
| 7 | මහනුවර | අල්ලකොල්ල | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 8 | මහනුවර | හාගල්ල | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 9 | මහනුවර | වටකැලේ | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 10 | මහනුවර | රංගල සමූහය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 11 | මහනුවර | කැලැබොක්ක | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 12 | මහනුවර | කන්දකැටිය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |

| | | | |
|---|---|---|---|
| 13 | මහනුවර | ෆර්න්ඩේල් | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 14 | මහනුවර | කොටගඟ | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 15 | මහනුවර | දෙහිගොල්ල/එනසල්වත්ත/ලූල්වත්ත | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 16 | මහනුවර | දෙල්පතනාඔය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 17 | මහනුවර | ගුමරා | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 18 | මහනුවර | කොබොනිල්ලා | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 19 | මහනුවර | ගැරන්ඩියෙල්ලා | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 20 | මහනුවර | වයිතලාව සමූහ | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 21 | මහනුවර | අඹුරුවැල්ල | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 22 | මහනුවර | ගාල්ලකැලේ සමූහ | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 23 | මහනුවර | හතලේ | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 24 | මහනුවර | හුන්නස්ගිරිය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 25 | මහනුවර | ට්‍රැෆර්ඩ්හිල් | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 26 | මහනුවර | පිළිස්සුම් පැත්ත | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 27 | මහනුවර | නකල්ස් | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 28 | මහනුවර | තුනිස්ගල | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 29 | මහනුවර | රක්සාව | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 30 | මහනුවර | ගල්පිල්ල | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 31 | මහනුවර | හෙයර්පාර්ක් | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 32 | මහනුවර | වටකැටිය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 33 | මහනුවර | ග්‍රීන්වුඩ්/දික්ඔය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 34 | මහනුවර | වුඩ්සයිඩ් | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |

**වගුව 09 - වතුයායන්වල වර්තමාන පරිපාලන තත්වය (මාතලේ දිස්ත්‍රික්කය )**

| අංකය | දිස්ත්‍රික්කය | වතුයායේ නම | වත්මන් කළමනාකරණ සමාගම |
|---|---|---|---|
| 1 | මාතලේ | නාලන්දාව | ඇල්කඩුව වැවිලි සමාගම |
| 2 | මාතලේ | හතමුණගල | ඇල්කඩුව වැවිලි සමාගම |
| 3 | මාතලේ | මිල්ලවාන | ඇල්කඩුව වැවිලි සමාගම |
| 4 | මාතලේ | බණ්ඩාරපොල | ඇල්කඩුව වැවිලි සමාගම |
| 5 | මාතලේ | කන්දේනුවර | ඇල්කඩුව වැවිලි සමාගම |
| 6 | මාතලේ | උකුවෙල | ඇල්කඩුව වැවිලි සමාගම |
| 7 | මාතලේ | ඕවල | ඇල්කඩුව වැවිලි සමාගම |
| 8 | මාතලේ | හපුගස්පිටිය | ඇල්කඩුව වැවිලි සමාගම |
| 9 | මාතලේ | පන්සල්තැන්න | ඇල්කඩුව වැවිලි සමාගම |
| 10 | මාතලේ | ඇල්කඩුව සමූහ | ඇල්කඩුව වැවිලි සමාගම |
| 11 | මාතලේ | හුණුගල | ඇල්කඩුව වැවිලි සමාගම |
| 12 | මාතලේ | පිටකන්ද | ඇල්කඩුව වැවිලි සමාගම |
| 13 | මාතලේ | රත්වත්ත | ඇල්කඩුව වැවිලි සමාගම |
| 14 | මාතලේ | හපුගහලන්ද | ඇල්කඩුව වැවිලි සමාගම |
| 15 | මාතලේ | සලාගම | ඇල්කඩුව වැවිලි සමාගම |

| | | | |
|---|---|---|---|
| 16 | මාතලේ | මහෞසා | උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම |
| 17 | මාතලේ | ගම්මඩුව | ගම්මඩුව වැවිලි සමාගමට බදුදී ඇත |
| 18 | මාතලේ | ඉන්දෝලා | තලවකල්ලේ වැවිලි සමාගම |
| 19 | මාතලේ | ලෙබනන් සමූහය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 20 | මාතලේ | ඔපල්ගල | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 21 | මාතලේ | දන්කන්ද | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 22 | මාතලේ | කතරන්තැන්න | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 23 | මාතලේ | මිඩ්ලන්ඩ් | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 24 | මාතලේ | නිකොලඔය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 25 | මාතලේ | බඹරගල්ල | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 26 | මාතලේ | මිඩ්කාර් | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 27 | මාතලේ | නාගල්ල | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |
| 28 | මාතලේ | බටහිර මාතලේ | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව |

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මිලදී ගත් වතු පිළිබඳ විස්තර

## වගුව 10 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මිලදී ගත් වතු පිළිබඳ විස්තර

| අංකය | වතුයායේ නම | දිස්ත්‍රික්කය | මිලදීගත් දිනය | වර්තමාන කළමනාකරණය | ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර |
|---|---|---|---|---|---|
| 1 | වෙදමුල්ල | නුවරඑළිය | 1973.09.01 | අගලවත්ත වැවිලි සමාගම | 484.62 |
| 2 | රොහැම්ටන් | බදුල්ල | 1974 .0315 | ආගරපතන වැවිලි සමාගම | 100.61 |
| 3 | ගලේබොද්ද | රත්නපුර | 1974.07.01 | ආගරපතන වැවිලි සමාගම | 752.63 |
| 4 | ඇල්පිටිය | ගාල්ල | 1975.06 01 | ඇල්පිටිය වැවිලි සමාගම | 785.02 |
| 5 | හල්ගොල්ල ** | කෑගල්ල | 1974.10.23 | කෑගල්ල වැවිලි සමාගම | 16006 .88 |
| 6 | ඩෙල්කිත් | කළුතර | 1975.05.19 | කොටගල වැවිලි සමාගම | 1223.38 |
| 7 | ගලහ * | මහනුවර | 1975.07.01 | ජනවසම | 694.33 |
| 8 | මවුන්ට් ජීන් * | නුවරඑළිය | 1975 .07.01 | ජනවසම | 456.52 |
| 9 | ග්‍රේට්වැලි * | මහනුවර | 1974.01.01 | ජනවසම | 320.24 |
| 10 | උඩුවෙල * | මහනුවර | 1973.05 .31 | ජනවසම | 659 .51 |
| 11 | රම්බොඩ ** | නුවරඑළිය | 1973.09.01 | පුස්සැල්ලාව වැවිලි සමාගම | 765.18 |
| 12 | සොගම ** | නුවරඑළිය | 1971.12.30 | පුස්සැල්ලාව වැවිලි සමාගම | 476.11 |
| 13 | ඇහැලියගොඩ | රත්නපුර | 1975 .08.01 | පුස්සැල්ලාව වැවිලි සමාගම | 410.93 |
| 14 | මතුරට ** | නුවරඑළිය | 1975.05.15 | බලංගොඩ වැවිලි සමාගම | 278.54 |
| 15 | සවුත් මැදකුඹුර ** | බදුල්ල | 1974.02.01 | බලංගොඩ වැවිලි සමාගම | 505.26 |
| 16 | සපුමල්කන්ද | රත්නපුර | 1975.08.01 | බලංගොඩ වැවිලි සමාගම | 646.96 |
| 17 | නන්පේරියල් | රත්නපුර | 1975.0519 | බලංගොඩ වැවිලි සමාගම | 203.64 |
| 18 | විකිලිය | රත්නපුර | 1974.10.23 | බලංගොඩ වැවිලි සමාගම | 805.67 |
| 19 | රාස්සගල | රත්නපුර | 1974.10.23 | බලංගොඩ වැවිලි සමාගම | 776.49 |
| 20 | මැද්දකන්ද | රතනපුර | 1974.10.23 | බලංගොඩ වැවිලි සමාගම | 676.11 |
| 21 | කැම්පියන් | රත්නපුර | 1975 0 .01 | බොගවන්තලාව වැවිලි සමාගම | 848.99 |
| 22 | ලෙතන්ට් | නුවරඑළිය | 1974.07.01 | බොගවන්තලාව වැවිලි සමාගම | 203.24 |
| 23 | අයිස්ලැබ් | බදුල්ල | 1973.11.26 | මල්වත්ත වැලි වැවිලි සමාගම | 382.59 |
| 24 | තිස්පනේ | මහනුවර | 1972.01.01 | මහවැලි ව්‍යාපෘතියට ලබා දී ඇත. | 384.62 |
| 25 | දියදාව | මාතර | 1980 වසර | මොරවක්කොරලේ සමුපකාර සමිතිය | 13.2258 |
| 26 | හොට්විල් | නුවරඑළිය | 1975.07.01 | වටවල වැවිලි සමාගම | 412.15 |
| 27 | සෙන්ට් හේලීස් | නුවරඑළිය | 1974.07.01 | වටවල වැවිලි සමාගම | 172.87 |
| 29 | හපුගස්තැන්න | රත්නපුර | 1971 .12.30 | හපුගස්තැන්න වැවිලි සමාගම | 1709 .31 |
| 30 | අලුපොල | රත්නපුර | 1972 .12.30 | හපුගස්තැන්න වැවිලි සමාගම | 1228 .74 |
| 31 | ගලබොඩ | රත්නපුර | 1973 .12.30 | හපුගස්තැන්න වැවිලි සමාගම | 376.92 |
| 32 | කැරොලිනා | නුවරඑළිය | 1974 .07.01 | හපුගස්තැන්න වැවිලි සමාගම | 1063.56 |

*ජනවසම විසින් කළමණාකරණය කරමින් පවතී .

** ජනවසම විසින් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදු දී ඇත .

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හෙක්ටයාර ප්‍රකාශයේ සාරාංශය




රූපය 04 - හෙක්ටයාර ප්‍රකාශයේ සාරාංශය 2023

# හෙක්ටයාර ප්‍රකාශය , ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව -2023

## වගුව 11 - හෙක්ටයාර ප්‍රකාශය

| වතුයායේ නම | තේ වගා කළ ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) | | | | රබර් | නැවත තේ/රබර් වගාව/ පාළු පැල සිටුවීම / තවාන් | මුළු හෙක්ටයාර ප්‍රමාණය | වාණිජ/ඉන්ධන දැව වගාව | සුළු අපනයන භෝග | කාර්ය මණ්ඩලය සහ කම්කරුවන්ට බෙදා දුන් ඉඩම් ප්‍රමාණය | නකල්ස් රක්ෂිතයට අයිති ඉඩම් ප්‍රමාණය | වෙනත්/අත් හැර දැමූ ඉඩම් ප්‍රමාණය | මුළු ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රිකිළි තේ | ඇට තේ | එකතුව | කොන්ත්‍රාත් පදනම මත දළු නෙලීමට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය | හෙක්ටයාර | හෙක්ටයාර | තේ + රබර් හෙක්ටයාර | හෙක්ටයාර | හෙක්ටයාර | හෙක්ටයාර | හෙක්ටයාර | හෙක්ටයාර | හෙක්ටයාර |
| අල්ලකොල්ල | 114.95 | 149.75 | 264.70 | 122.50 | - | 17.00 | 404.20 | 81.63 | 68.60 | - | 200.51 | 64.92 | 819.86 |
| කොටගඟ | 34.42 | 215.80 | 250.22 | 170.97 | - | 19.00 | 440.19 | 7.80 | 53.69 | - | - | 558.13 | 1,059.81 |
| ගල්පිල්ල | 165.01 | 5.00 | 170.01 | 37.31 | - | 7.04 | 214.36 | 91.49 | 5.85 | 4.65 | - | 444.89 | 761.24 |
| ගෝමර | 116.73 | 65.50 | 182.23 | 152.36 | - | 12.00 | 346.59 | 44.50 | - | - | 74.80 | 265.24 | 731.13 |
| හාගල | 77.78 | 91.80 | 169.58 | 84.66 | | 17.00 | 271.24 | 89.62 | - | - | - | 88.63 | 449.49 |
| හෙයාපාර්ක් | | 131.50 | 131.50 | 196.50 | - | 16.00 | 344.00 | - | 55.00 | - | - | 577.75 | 976.75 |
| හුන්නස්ගිරිය | 37.78 | 149.14 | 186.92 | 34.21 | - | 6.85 | 227.98 | 7.00 | 51.32 | - | - | 453.42 | 739.72 |
| කැලෑබොක්ක | 278.24 | 90.97 | 369.21 | 299.41 | - | 38.71 | 707.33 | 15.00 | 148.31 | - | - | 499.72 | 1,370.36 |
| මිඩ්ලන්ඩ් | 123.91 | 60.42 | 184.33 | 65.17 | - | 14.34 | 263.84 | 211.84 | 266.78 | - | - | 478.85 | 1,221.31 |
| නිකොලඔය | 47.14 | - | 47.14 | 3.64 | - | 2.00 | 52.78 | 18.00 | 48.32 | - | - | 213.31 | 332.41 |
| ඔපල්ගල | 48.90 | 69.10 | 118.00 | 13.00 | - | 6.80 | 137.80 | 86.00 | 148.50 | - | - | 386.80 | 759.10 |
| රංගල | 85.44 | 48.35 | 133.79 | 128.95 | | 30.50 | 293.24 | - | 7.50 | - | - | 329.86 | 630.60 |
| වෛතලාව | 39.20 | 31.00 | 70.20 | 74.69 | - | 5.33 | 150.22 | 45.89 | | - | - | 355.94 | 552.05 |
| වූඩ්සයිඩ් | 5.00 | - | 5.00 | 185.31 | - | 15.00 | 205.31 | 30.77 | 1.00 | - | - | 235.67 | 472.75 |
| විහාරගල | 0.81 | 27.33 | 28.14 | - | - | | 28.14 | | | - | - | 13.76 | 41.90 |
| වලහන්දූව | 1.50 | - | 1.50 | - | 29.72 | 8.80 | 40.02 | | 18.00 | - | - | 13.36 | 71.38 |
| | | | | | | | | | | | | | |
| **Total** | **1,176.81** | **1,135.66** | **2,312.47** | **1,568.68** | **29.72** | **216.37** | **4,127.24** | **729.54** | **872.87** | **4.65** | **275.31** | **4,980.25** | **10,989.86** |

# තේ අමු දළු අස්වැන්න 2014-2023

## වගුව 12 - තේ අමු දළු අස්වැන්න

| වතුයාය | තේ -අමු දළු (කිලෝ ග්‍රෑම්) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2014** | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** |
| අලකොළ | 769,499 | 787,217 | 705,364 | 759,745 | 734,923 | 617,413 | 755,844 | 812,281 | 680,267 | 578,619 |
| කොටගඟ | 194,663 | 216,383 | 170,940 | 205,002 | 293,452 | 253,262 | 303,817 | 298,549 | 211,277 | 160,814 |
| ගල්පීල්ල | 665,646 | 690,856 | 675,717 | 775,779 | 790,235 | 681,020 | 833,568 | 897,867 | 641,974 | 597,572 |
| ගෝමර | 486,583 | 547,711 | 667,328 | 764,337 | 743,270 | 706,865 | 849,230 | 920,770 | 735,007 | 530,548 |
| හාගල | 682,702 | 682,097 | 429,360 | 482,980 | 547,672 | 412,474 | 578,153 | 586,514 | 450,306 | 371,874 |
| හෙයාර්පාර්ක් | 375,497 | 298,837 | 229,330 | 252,911 | 298,088 | 252,867 | 362,826 | 349,541 | 254,513 | 228,510 |
| හුන්නස්ගිරිය | 431,449 | 578,320 | 515,374 | 528,226 | 496,959 | 487,032 | 544,822 | 556,800 | 442,136 | 364,267 |
| කැලැබොක්ක | 1,331,815 | 1,608,769 | 1,373,408 | 1,382,689 | 1,468,809 | 1,435,669 | 1,780,625 | 1,911,748 | 1,572,439 | 919,016 |
| කුඩාඔය | - | - | - | - | - | 2,581 | 18,791 | 20,558 | - | - |
| මිඩ්ලන්ඩ් | 395,511 | 586,442 | 438,614 | 503,015 | 586,207 | 494,211 | 520,382 | 518,951 | 424,062 | 321,430 |
| නිකොළොය**** | 458 | 1,122 | 1,550 | 2,979 | 159,993 | 138,379 | 191,445 | 187,163 | 145,973 | 111,028 |
| ඔපල්ගල | 297,287 | 301,755 | 247,751 | 305,494 | 354,023 | 263,246 | 399,514 | 347,170 | 312,415 | 264,534 |
| රංගල | 521,922 | 678,266 | 604,332 | 492,346 | 606,262 | 579,595 | 662,545 | 641,661 | 528,504 | 431,795 |
| වෛතලාව*** | | | | | 228,362 | 157,356 | 211,812 | 249,160 | 202,098 | 167,837 |
| විහාරගල | - | - | - | - | - | 9,267 | 20,116 | 25,471 | 19,432 | **17,451** |
| වූඩ්සයිඩ් ** | | | | | 22,153 | 44,463 | 68,485 | 60,799 | 39,320 | 23,985 |
| එකතුව | **6,153,032** | **6,977,775** | **6,059,068** | **6,455,503** | **7,330,409** | **6,535,701** | **8,101,974** | **8,385,002** | **6,659,725** | **5,089,280** |
| | | | | | | | | | | |
| වතුයාය | | | | | | | | | | |
| | **2014** | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** |
| වලහන්දූව | 40,140 | 36,809 | 37,522 | 42,470 | 33,395 | 28,122 | 29,660 | 19,063 | 15,166 | 3,189 |

**** නිකොළොය රාජ්‍ය වතුයාය 2010-2013 සිට මිඩ්ලන්ඩ්ස් සමග ඒකාබද්ධ කෙරිණි

*** වෛතලාව රාජ්‍ය වතුයාය 2008-2017 සිට මරුති සමාගම විසින් කළමනාකරණය කෙරේ

** 2018 වර්ෂයට පෙර, වූඩ්සයිඩ් වතුයාය පිටතට පවරා දී තිබුණි

* රබර් කිරිවල DRC අගය කිලෝග්‍රෑම් වලට පරිවර්තනය කර ඇත (Dry Rubber Content)




රූපය 05 - ලබාගත් අමු දළු අස්වැන්න




රූපය 06 - ලබාගත් රබර් අස්වැන්න (ලේටෙක්ස්)

# හෙක්ටයාරයකට ලබාගත් අමු තේ දළු අස්වැන්න හා රබර් අස්වැන්න 2014-2023

### වගුව 13 - අමු දළු තේ දළු ප්‍රමාණය හා රබර් අස්වැන්න - හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම්

| වතුයාය | අමු තේ දළු ප්‍රමාණය - හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2013** | 2,014 | 2,015 | 2,016 | 2,017 | 2,018 | 2,019 | 2,020 | 2,021 | 2,022 | 2,023 |
| අලකොළ | 2,660 | 2,321 | 2,293 | 2,121 | 2,479 | 2,367 | 2,032 | 2,513 | 2,692 | 2,282 | 1,974 |
| කොටගහ | 1,400 | 1,060 | 860 | 819 | 935 | 930 | 809 | 1,028 | 922 | 751 | 610 |
| ගල්පිහිල්ල | 3,819 | 2,926 | 2,981 | 2,916 | 3,656 | 3,901 | 3,362 | 4,183 | 5,257 | 3,765 | 3,511 |
| ගෝමර | 3,363 | 3,121 | 3,363 | 3,084 | 3,451 | 3,139 | 3,027 | 3,677 | 4,359 | 3,700 | 2,846 |
| හාගල | 3,223 | 2,772 | 2,716 | 2,447 | 2,781 | 2,883 | 2,241 | 3,141 | 3,170 | 2,590 | 2,143 |
| හෙයාපාර්ක් | 1,633 | 1,274 | 995 | 674 | 795 | 1,260 | 1,102 | 1,491 | 1,506 | 1,273 | 1,329 |
| හුන්නස්ගිරිය | 2,828 | 2,181 | 2,744 | 2,749 | 2,823 | 2,599 | 2,548 | 2,844 | 2,900 | 2,302 | 1,948 |
| කැලෑබොක්ක | 3,079 | 2,353 | 2,828 | 2,888 | 2,777 | 2,651 | 2,553 | 3,617 | 3,986 | 3,480 | 2,071 |
| කුඩාඔය | - | - | - | - | - | - | 70 | 488 | 571 | | |
| මිඩ්ලන්ඩ් | 2,460 | 2,084 | 2,167 | 1,995 | 2,293 | 2,585 | 2,204 | 2,334 | 2,321 | 2,321 | 1,738 |
| නිකොළොය | | 1,772 | 1,702 | 2,544 | 2,884 | 3,218 | 2,860 | 3,715 | 3,901 | 3,053 | 2,338 |
| ඔපල්ගල | 3,972 | 2,944 | 2,814 | 2,309 | 2,940 | 4,013 | 2,999 | 4,317 | 4,021 | 2,546 | 2,216 |
| රංගල | 3,256 | 2,553 | 3,247 | 2,916 | 2,316 | 2,581 | 2,660 | 2,723 | 2,869 | 2,372 | 3,020 |
| වෙවතලාව | - | - | - | - | - | 2,688 | 2,093 | 2,894 | 3,132 | 2,443 | 2,220 |
| විහාරගල | - | - | - | - | - | - | 223 | 480 | 608 | 464 | 417 |
| සාමාන්‍ය | **2,828** | 2,298 | 2,433 | 2,386 | 2,474 | 2,537 | 2,282 | 2,768 | 2,949 | 2,486 | 2,040 |
| වතුයාය | රබර් (ලේටෙක්ස්) - හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් | | | | | | | | | | |
| | **2013** | **2014** | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** |
| වලහන්දූව | 690 | 618 | 566 | 577 | 649 | 510 | 430 | 474 | 457 | 363 | 162 |




රූපය 07 - හෙක්ටයාරයකට ලබාගත් අමු දළු අස්වැන්න




රූපය 08 - හෙක්ටයාරයකට ලබාගත් රබර් (ලේටෙක්ස්) අස්වැන්න

## වාර්ෂික වර්ෂාපතනය

**වගුව 14 - වාර්ෂික වර්ෂාපතනය 2023**

| වාර්ෂික වර්ෂාපතනය - 2023 | |
|---|---|
| **වතුයාය** | **වර්ෂාපතනය (මි.මි.)** |
| අලකොළ | 2093 |
| කොටගහ | 2951 |
| ගල්පීල්ල | 2029 |
| ගෝමර | 3122 |
| හාගල | 3085 |
| හෙයාර්පාර්ක් | 3136 |
| හුන්නස්ගිරිය | 1496 |
| කැලෑබොක්ක | 3523 |
| මිඩ්ලන්ඩ් | 4192 |
| නිකොළොය | 2309 |
| ඔපල්ගල | 1680 |
| රංගල | 5034 |
| වෛතලාව | 2424 |




ඉහත විස්තර වලට අනුව, 2023 වර්ෂය පුරාවටම බටහිර මැද රට කලාපයට හොඳ වර්ෂාපතනයක් ලැබී තිබුණි.

## පසුගිය වර්ෂ 03 සඳහා පොහොර භාවිතය

**වගුව - 15 පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක සංසන්දනාත්මක නිෂ්පාදන පිරිවැය**

| වර්ෂය | භාවිතා කළ පොහොර ප්‍රමාණය (මෙ.ටොන්) | පොහොර පිරිවැය (රු.) | භාවිත කළ වල් නාශක ප්‍රමාණය (ලීටර/කි.ග්‍රෑ) | වල් නාශක පිරිවැය (රු.) |
|---|---|---|---|---|
| **2021** | 552 | 15,924,100 | 3844 ලීටර | 10,222,571 |
| | | | 692 කි.ග්‍රෑම් | 2,698,800 |
| **2022** | 65.5 | 24,715,000 | 16 ලීටර | 55,100 |
| | | | 1400 කි.ග්‍රෑම් | 11,780,000 |
| **2023** | 206 | 30,852,000 | 4300 ලීටර | 11,497,500 |
| | | | 750 කි.ග්‍රෑම් | 4,425,000 |

2023 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් නිෂ්පාදනය කරනු ලැබූ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 173.90ක් වූ අතර බටහිර මධ්‍යම කලාපයේ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 204.14ක් විය. ඒ අනුව, 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ විකුණුම් අනුපාතය, බටහිර මධ්‍යම කලාපයේ විකුණුම් අනුපාතයට වඩා රුපියල් 30.24කින් අඩු අගයක පවත්වා ගෙන ඇත.

## පසුගිය වසර 03ක සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන වියදම

වගුව 16 – පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක සංසන්දනාත්මක නිෂ්පාදන පිරිවැය

| වර්ෂය | අමු තේ දළු කිලෝ ග්‍රෑමයකට නිෂ්පාදන පිරිවැය (රුපියල්) | | | | | |
|---|---|---|---|---|---|---|
| | දළු නෙලීම | ක්ෂේත්‍ර වැඩ | පොහොර | වල්නාශක | පොදු වියදම් | එකතුව |
| **2021** | 47.94 | 12.61 | 5.02 | 6.00 | 32.78 | 104.35 |
| **2022** | 55.57 | 16.72 | 1.87 | 10.87 | 48.57 | 133.60 |
| **2023** | 54.45 | 19.12 | 7.22 | 18.13 | 74.64 | 173.55 |




රූපය 09 – පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු තේ දළු කිලෝ ග්‍රෑම් එකක සංසන්දනාත්මක නිෂ්පාදන පිරිවැය

ඒ අනුව අමු දළු කිලෝග්‍රෑම් එකක සමස්ත නිෂ්පාදන වියදමෙන් පොහොර පිරිවැය ඉතා අඩුය. නිෂ්පාදන පිරිවැයේ විශාල පංගුවක් ගන්නා අමු දළු නෙලීමේ සහ පොදු වියදම් කළමනාකරණය නොකර පොහොර පිරිවැය පාලනය කර ඇති බැවින් අපේක්ෂිත අස්වැන්න අඩු වී ඇත. පාලන අධිකාරිය සහ කළමනාකාරීත්වය මේ තත්ත්වය වටහා නොගැනීම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පවතින දිගුකාලීන පාඩුවට එක් හේතුවක් වී ඇත.

## තේ නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව දැනට තේ නිෂ්පාදන කර්මාන්තශාලා දහයක් ඇති අතර එයින් සී.ටී.සී තේ කර්මාන්තශාලා හතරක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. කැලැබොක්ක,මිඩ්ලන්ඩ්ස්, රංගල සහ ගෝමර තේ කර්මාන්තශාලා හතර මගින් අපගේ වතුයායන් කිහිපයකින් ලබා ගන්නා අමු දළුවලින් නිමි තේ නිෂ්පාදනය කරයි. අගය දාමය වැඩිකිරීමේ අරමුණින් නවීන තාක්ෂනය අනුව නවීකරණය වූ ගෝමර කර්මාන්ත ශාලාව නිමි තේ නිෂ්පාදන සඳහා මෙම වසරේ පටන් දායක විය. එහෙත් රංගල තේ කර්මාන්ත ශාලාව 2023 වසර ආරම්භයේදීම නවීකරණ කටයුතු සඳහා ක්‍රිය විරහිත කරන ලදී.

**වගුව 17- කර්මාන්ත ශාලාවන්ට අදාළ අමු දළ නිෂ්පාදනය ,නිමි තේ නිෂ්පාදනය, නිෂ්පාදන පිරිවැය හා ශුද්ධ විකුණුම් සාමාන්‍ය සංසන්දනාත්මක - 2022-2023**

| කර්මාන්තශාලාව | අමු තේ දළු (කිලෝ ග්‍රෑම්) | | නිමි තේ (කිලෝ ග්‍රෑම්) | | නිපදවූ නිමි තේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස | | නිෂ්පාදන පිරිවැය - කිලෝ ග්‍රෑම් එකකට රුපියල් | | ශුද්ධ විකුණුම් සාමාන්‍ය - කිලෝ ග්‍රෑම් එකකට රුපියල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022 | 2023 | 2022 | 2023 | 2022 | 2023 | 2022 | 2023 | 2022 | 2023 |
| කැලෑබොක්ක | 1,572,439 | 1,054,377 | 338,159 | 226,748 | 21.51 | 21.51 | 437.27 | 941.55 | 425.39 | 792.30 |
| මිඩ්ලන්ඩ් | 422,289 | 705,450 | 93,120 | 150,270 | 22.05 | 21.30 | 687.17 | 1,030.16 | 752.84 | 781.42 |
| රංගල | 528,504 | - | 115,654 | - | 21.88 | - | 692.54 | - | 785.62 | - |
| ගෝමර | - | 518,566 | - | 113,147 | - | 21.82 | - | 974.06 | - | 778.55 |
| එකතුව | **2,523,232** | **2,278,393** | **546,933** | **490,165** | | | | | | |




**රූපය 10 – නිමි තේ නිෂ්පාදනය**




**රූපය 11 – කර්මාන්ත ශාලාවන්ට අදාල අමු තේ දළු ප්‍රමාණය නිෂ්පාදනය**

වගුව 18- කර්මාන්තශාලා පිළිබඳ විස්තර

| කර්මාන්තශාලාව | පිහිටි දිස්ත්‍රික්කය | නිෂ්පාදනය කරන තේ වර්ගය | පෙරීමේ ධාරිතාවය (කිලෝ ග්‍රෑම්) | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| කොටගහ | මහනුවර | ඕතඩොක්ස් | 1290 | අක්‍රිය |
| ගෝමර | මහනුවර | ඕතඩොක්ස් | 8000 (සමස්ත ධාරිතාවය) | ක්‍රියාත්මකයි |
| හාගල | මහනුවර | ඕතඩොක්ස් | 1419 | අක්‍රිය |
| හුන්නස්ගිරිය | මාතලේ | සීටීසී | 1720 | අක්‍රිය |
| කැලැබොක්ක | මහනුවර | සීටීසී | 12000(සමස්ත ධාරිතාවය) | ක්‍රියාත්මකයි |
| මිඩ්ලන්ඩ් | මාතලේ | සීටීසී | 1400 | ක්‍රියාත්මකයි |
| දන්කන්ද | මාතලේ | ඕතඩොක්ස් | 860 | අක්‍රිය |
| නිකොළොය | මාතලේ | ඕතඩොක්ස් | 645 | අක්‍රිය |
| රංගල | මහනුවර | සීටීසී | 1500 | ක්‍රියාත්මකයි |

අපගේ වතුයායන්වලින් ලැබෙන අස්වැන්න අඩුවීමත් කර්මාන්තශාලාවල පවතින පැරණි යන්ත්‍රසූත්‍ර මඟින් නිෂ්පාදන කටයුතු සිදුකිරිමත් නිසා නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ මට්ටමක පැවතීම සහ නිෂ්පාදන අලෙවි වන ඉතා අඩු මිල යන හේතු මත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබේ.

මේ තත්ත්වය මඟහරවා ගැනීමේ අරමුණින් 2022 වර්ෂයේ ආරම්භ කරන ලද හෙක්ටයාර 160ක් අලුතින් නැවත තේ වගා වැඩසටහන 2023 වසරේදී සාර්ථකව නිමකරන ලදී . එකී ප්‍රාග්ධන ආයෝජනය මගින් ඉදිරි වර්ෂ 2 කින් පසු ලැබෙන නව දළු අස්වැන්න මගින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අදායම වැඩි කරගැනීමට හැකිවනු ඇත.

මිඩ්ලන්ඩ්ස් තේ කර්මාන්තශාලාව මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි එකම සී.ටී.සී තේ කර්මාන්තශාලාවයි. කැලැබොක්ක තේ කර්මාන්ත ශාලාව සහ අගය දාමය වැඩිකර ගැනීමේ අරමුණින් නවීකරනය කරන ලද ගෝමර තේ කර්මාන්තශාලා මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

කැලැබොක්ක තේ කර්මාන්තශාලාව



.

මිඩ්ලන්ඩ්ස් තේ කර්මාන්තශාලාව



රංගල තේ කර්මාන්ත ශාලාව



## නවීකරණය කරන ලද ගෝමර තේ කර්මාන්ත ශාලාව











සංස්ථා තේ
සංස්ථා තේ

# සංස්ථා තේ

දේශීය වෙළඳපොළට සංස්ථා තේ ලබා දීම තුළින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තේ මිල, තේ වෙන්දේසිය තුළ උච්චාවචනය වීමෙන් ඇතිවන තාවකාලික මූල්‍ය අර්බුදයන්ට සහනයක් ලබා දීම පිණිස 2016 වර්ෂයේ නොවැම්බර් මස "සංස්ථා තේ" නිෂ්පාදනය ආරම්භ කරන ලදී.

වගුව 19- සංස්ථා තේ අලෙවිවූ ප්‍රමාණය- මාසිකව වර්ෂ 2021 ,2022 හා 2023 සංසන්දනාත්මකව

| මාසය | අලෙවි වූ තේ ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | | |
|---|---|---|---|
| | 2021 | 2022 | 2023 |
| ජනවාරි | 5,234 | 4,249 | 5369 |
| පෙබරවාරි | 3,695 | 3,891 | 4258 |
| මාර්තු | 6,103 | 6,753 | 8737 |
| අප්‍රේල් | 2,619 | 4,297 | 4733 |
| මැයි | 7,592 | 1,857 | 3742 |
| ජූනි | 4,420 | 4,506 | 3924 |
| ජූලි | 5,436 | 2,791 | 3920 |
| අගෝස්තු | 3,988 | 3,189 | 4627 |
| සැප්තැම්බර් | 5,242 | 2,486 | 4720 |
| ඔක්තෝම්බර් | 5,227 | 4,755 | 1775 |
| නොවැම්බර් | 4,089 | 2,749 | 3958 |
| දෙසැම්බර් | 6,685 | 5,532 | 4066 |
| **එකතුව** | **60,330** | **47,054** | **53,828** |







රූපය 12 – සංස්ථා තේ අලෙවිය මාසිකව (2021-2023)

# තේ අළෙවි අදායම (2021-2023)

වගුව 20 - සංස්ථා තේ අළෙවි අදායම (2021-2023)

| මාසය | සංස්ථා තේ අළෙවි අදායම (රුපියල්) | | |
|---|---|---|---|
| | 2021 | 2022 | 2023 |
| ජනවාරි | 3,869,097 | 3,253,889 | 6,756,307 |
| පෙබරවාරි | 2,712,282 | 3,206,595 | 5,533,657 |
| මාර්තු | 4,403,836 | 5,272,726 | 11,273,455 |
| අප්‍රේල් | 1,937,444 | 3,520,163 | 6,992,072 |
| මැයි | 5,383,608 | 1,586,140 | 6,804,747 |
| ජූනි | 3,144,305 | 3,455,808 | 6,682,242 |
| ජූලි | 3,928,085 | 2,296,128 | 6,522,387 |
| අගෝස්තු | 2,916,045 | 2,570,631 | 7,570,718 |
| සැප්තැම්බර් | 3,819,845 | 2,638,365 | 7,826,502 |
| ඔක්තෝම්බර් | 3,795,002 | 6,193,980 | 3,006,145 |
| නොවැම්බර් | 3,212,859 | 3,531,687 | 6,471,611 |
| දෙසැම්බර් | 5,097,536 | 7,360,445 | 6,092,555 |
| **එකතුව** | **44,219,944** | **44,886,555** | **81,532,397** |




රූපය 13 – සංස්ථා තේ අළෙවි අදායම (2021-2023)

# රබර් නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව පවතිනුයේ එක් රබර් වතුයායක් පමණි. එය ගාල්ල දිස්ත්‍රික්කයේ වලහන්දූව ප්‍රදේශයේ පිහිටා ඇත. වර්ෂ තුනක් සඳහා මුළු රබර් කිරි නිෂ්පාදනය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව 21- වර්ෂ තුනක් සඳහා මුළු රබර් නිෂ්පාදනය

| වර්ෂය | ලේටෙක්ස් (කිලෝ ග්‍රෑම්) | මුළු වියදම (කිලෝ ග්‍රෑම්) | ලාභය / (අලාභය) (රු.) | ශුද්ධ විකිණුම් අගය (රු.) | නිෂ්පාදන පිරිවැය කිලෝ ග්‍රෑම් එකකට (රු.) | කිලෝ ග්‍රෑමයකට ලාභය / (අලාභය) (රු.) |
|---|---|---|---|---|---|---|
| 2023 | 3189 | 4,273,444.08 | (2,858,364.48) | 443.74 | 1340.06 | (896.32) |
| 2022 | 15,166 | 12,777,203.34 | (4,510,520.06) | 545.08 | 842.49 | (297.41) |
| 2021 | 19,063 | 13,117,780.90 | (5,286,725.15) | 410.80 | 688.13 | (277.33) |




රූපය 14 - රබර් නිෂ්පාදනය (2021-2023)

# භාණ්ඩාගාර ප්‍රතිපාදන

මෙම වසරේදි පසුගිය වසර මෙන් වැටුප් හා එදිනෙදා වියදම් කළමනාකරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය මඟින් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගෙන නොමැත.

**වගුව 22 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් පිළිබඳ සාරාංශය**

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| මෙහෙයුම් වියදම් (කම්කරු වේතන සහ කාර්ය මණ්ඩල වැටුප්) | - | - | - | |
| ව්‍යවස්ථාපිත ගෙවීම් (සේවක අර්ථ සාධක අරමුදල /සේවක භාරකාර අරමුදල /පාරිතෝෂික) | - | - | - | 63.90 |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සංවර්ධන කටයුතු (ඌන උපයෝජන ඉඩම්වල තේ නැවත වගාව) | - | 14.00 | 178.64 | |
| මුළු ලැබීම් (රුපියල් මිලියන ) | - | 14.00 | 178.64 | 63.90 |

# 2023වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සහ 2023 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය අනුව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පහත පරිදි නිරූපණය වේ

### වගුව 23 – 2023 -2022 වර්ෂයන් සඳහා සංසන්දනාත්මක මූල්‍ය කාර්ය සාධනය -

| විස්තරය | 2023 ඇස්තමේන්තුව | වාර්ෂික ගිණුම් - 2023 | වෙනස % | 2022 ඇස්තමේන්තුව | වාර්ෂික ගිණුම් - 2022 | වෙනස % |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| සැකසූ තේ - නිෂ්පාදන පිරිවැය (C.O.P.) | 763.41 | 802.62 | 5.14 | 540.51 | 642.69 | 18.90 |
| ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.) රුපි./කිග්‍රෑ | 800.98 | 875.06 | 9.25 | 451.33 | 741.64 | 64.32 |
| රබර් - නිෂ්පාදන පිරිවැය (C.O.P.) රුපි./කිග්‍රෑ | 714.50 | 1,340.06 | 87.55 | 355.51 | 958.03 | 169.48 |
| - ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.) | 450.00 | 443.74 | -1.39 | 440.00 | 559.99 | 27.27 |
| ඇස්තමේන්තුගත නිෂ්පාදනය - සැකසූ තේ (කිග්‍රෑ) | 2,037,288 | 1,134,951 | (44.29) | 2,303,748 | 1,432,199 | (37.83) |
| ඇස්තමේන්තුගත නිෂ්පාදනය - රබර් (කිග්‍රෑ) | 22,500 | 3,189 | (85.83) | 35,000 | 15,166 | (56.67) |
| | | | | | | |
| | | | | | | |
| **ආදායම - රුපියල්** | | | | | | |
| සැකසූ තේ සහ තේ දළු | 1,699,700,331 | 1,011,201,027 | 59.49 | 1,039,753,783 | 1,062,170,754 | 83.60 |
| රබර් (ලේටෙක්ස්) | 10,125,000 | 1,414,816 | 13.97 | 15,400,000 | 8,492,760 | 60.01 |
| **මුළු ආදායම** | **1,709,825,331** | **1,012,615,843** | **59.22** | **1,055,153,783** | **1,070,663,514** | **83.30** |
| අඩු කළා: නිෂ්පාදන පිරිවැය - රුපියල් | | | | | | |
| සැකසූ තේ සහ තේ දළු | 1,555,278,627 | 910,936,665 | 58.57 | 1,245,187,558 | 920,456,572 | 73.92 |
| රබර් | 16,076,197 | 4,273,445 | 26.58 | 12,442,718 | 14,529,483 | 116.77 |
| **මුළු නිෂ්පාදන පිරිවැය - රුපියල්** | **1,571,354,824** | **915,210,110** | **58.24** | **1,257,630,276** | **934,986,055** | **74.35** |
| | | | | | | |
| **දළ ලාභය/(පාඩුව) - වතුයාය - රුපියල්** | **138,470,507** | **97,405,733** | **70.34** | **(202,476,493)** | **135,677,459** | **(67.01)** |
| | | | | | | |
| එක් කළා: වෙනත් ආදායම් - රුපියල් | | | | | | |
| වෙනත් ආදායම් - වතුයාය | 821,870,441 | 122,905,534 | 14.95 | 639,124,814 | 135,306,929 | 21.17 |
| වෙනත් ආදායම් - ප්‍රධාන කාර්යාලය | 83,676,350 | 12,838,350 | 15.34 | 92,261,600 | 24,647,066 | 26.71 |
| | | | | | | |
| **මුළු වෙනත් ආදායම් - වතු සහ ප්‍රධාන කාර්යාලය** | **905,546,791** | **135,743,884** | **14.99** | **731,386,414** | **159,953,995** | **21.87** |
| | | | | | | |
| **මුළු ආදායම - රුපියල්** | **1,044,017,297** | **233,149,617** | **22.33** | **528,909,921** | **295,631,454** | **55.89** |
| | | | | | | |
| අඩු කළා: වියදම් - රුපියල් | | | | | | |
| පරිපාලන වියදම් - වතුයාය | 114,247,005 | 94,054,032 | 82.33 | 101,390,813 | 95,337,572 | 94.03 |
| -ප්‍රධාන කාර්යාලය | 72,340,117 | 109,520,497 | 151.40 | 58,722,326 | 83,774,137 | 142.66 |
| පුද්ගල වියදම් - ප්‍රධාන කාර්යාලය | 71,630,222 | 49,200,419 | 68.69 | 67,141,244 | 45,758,326 | 68.15 |
| මූල්‍ය ගාස්තු - වතුයාය | 9,594,182 | 6,808,618 | 70.97 | 8,808,560 | 6,366,715 | 72.28 |
| -ප්‍රධාන කාර්යාලය | 40,800,000 | 66,239,953 | 162.35 | 39,800,000 | 44,722,944 | 112.37 |
| **මුළු වියදම - රුපියල්** | **308,611,526** | **325,823,519** | **105.58** | **275,862,943** | **275,959,694** | **100.04** |
| | | | | | | |
| **ලාභය/(පාඩුව) - වතු සහ ප්‍රධාන කාර්යාලය - රුපියල්** | **735,405,771** | **(92,673,902)** | **(12.60)** | **253,046,978** | **19,671,760** | **7.77** |

# මානව සම්පත් කළමණාකරණය



# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මානව සම්පත්

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය පහත වගුවෙන් නිරූපණයවේ.

**වගුව 24 – රාජ්‍ය වැවිලි සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය**

| තනතුර | අනුමත තනතුරු ගණන | | |
|---|---|---|---|
| | ස්ථිර | කොන්ත්‍රාත් | අනියම් |
| ප්‍රධාන කාර්යාලය | | | |
| සභාපති | 1 | | |
| සාමාන්‍යාධිකාරී | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි- මූල්‍ය | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි- පාලන | 1 | | |
| කළමණාකරු -පාලන/පිරිස් | 1 | | |
| කළමණාකරු- අලෙවි | 1 | | |
| කළමණාකරු - නීති | 1 | | |
| කළමණාකරු - ඉඩම් | 1 | | |
| කළමණාකරු - පාලන | - | | |
| කළමණාකරු - ප්‍රසම්පාදන | 1 | | |
| අභ්‍යන්තර විගණක | 1 | | |
| ගණකාධිකාරි | 1 | | |
| ජ්‍යේෂ්ඨ වතු අධිකාරී | 1 | | |
| වතු අධිකාරී | 14 | | |
| සහකාර වතු අධිකාරී | 22 | | |
| සහකාර කළමණාකරු - වැවිලි | 1 | | |
| සහකාර කළමණාකරු - ප්‍රවාහන | 1 | | |
| සහකාර කළමණාකරු - අලෙවි | 1 | | |
| සහකාර කළමණාකරු - ප්‍රසම්පාදන | 1 | | |
| සහකාර ගණකාධිකාරි | 1 | | |
| ඉඩම් නිලධාරි | 1 | | |
| තොරතුරු තාක්ෂණ නිලධාරි | 1 | | |
| පරිපාලන නිලධාරි | 1 | | |
| අලෙවි ප්‍රවර්ධන නිලධාරි | | 1 | |
| මුදල් එකතු කිරීමේ නිලධාරි | | 1 | |
| පරිපාලන සහායක | - | | |
| ගිණුම් සහකාර | 1 | | |
| විගණන නිලධාරි | 1 | | |
| පුද්ගලික සහකාර -සභාපති | 1 | | |
| පුද්ගලික සහකාර - සාමාන්‍යාධිකාරි | 1 | | |
| පරිපාලන නිලධාරි - විගණන | 1 | | |
| පරිපාලන සහකාර | 28 | | |
| වැඩ සුපරික්ෂක | 0 | | |
| රියදුරු | 8 | | |
| කාර්යාල සහායක | 3 | | |
| කම්කරු | 5 | | |
| ප්‍රාදේශීය | | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි- වැවිලි | 1 | | |
| වැවිලි කළමණාකරු | 1 | | |
| සහකාර කළමණාකරු | 1 | | |
| සහකාර ගණකාධිකාරි | - | | |
| කළමනාකරණ සහකාර | 2 | | |
| ජ්‍යේෂ්ඨ සහකාර ලිපිකරු | | | |
| කණිෂ්ඨ ලිපිකරු | | | |
| කාර්යාල සහායක | - | | |
| **එකතුව** | **110** | **2** | **-** |

2023 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකරණ, අධීක්ෂණ සහ නිෂ්පාදන කාර්ය මණ්ඩලය පහත වගුවෙන් නිරූපණය වේ.

**වගුව 25 – රාජ්‍ය වැවිලි සංස්ථාවේ සතු මානව සම්පත්**

| වතුයාය | වතු අධිකාරිවරුන් ගණන | සහකාර වතු අධිකාරිවරුන් ගණන | කාර්යය මණ්ඩලය | | කම්කරුවන් | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් | |
| අලකොළ | 1 | 1 | 20 | - | 254 | 0 | 276 |
| කොටගහ | 1 | 1 | 12 | 2 | 148 | 0 | 164 |
| ගල්පිල්ල | 1 | 1 | 23 | 1 | 157 | 25 | 208 |
| ගෝමර | 1 | 3 | 29 | - | 209 | 27 | 269 |
| හාගල | 1 | 1 | 12 | - | 144 | 0 | 158 |
| හෙයාර්පාර්ක් | 1 | 1 | 8 | - | 89 | 9 | 108 |
| හුන්නස්ගිරිය | 1 | 2 | 14 | - | 174 | 1 | 192 |
| කැලෑබොක්ක | 1 | 3 | 38 | - | 701 | 49 | 792 |
| මිඩ්ලන්ඩ් | 1 | 2 | 20 | - | 201 | 32 | 256 |
| නිකොළොය | 1 | 1 | 5 | - | 5 | 30 | 42 |
| ඔපල්ගල | 1 | 0 | 8 | - | 54 | 11 | 74 |
| රංගල | 1 | 1 | 20 | - | 183 | 7 | 212 |
| වලහන්දුව | | 1 | 9 | - | 13 | 37 | 60 |
| වෛතලාව | 1 | | 5 | - | 60 | 0 | 66 |
| වුඩ්සයිඩ් | 1 | - | 5 | - | 6 | 24 | 36 |
| විහාරගල | | 1 | 1 | - | 39 | 2 | 43 |
| ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාලය | - | - | 54 | | | | 54 |
| එකතුව | **14** | **19** | **283** | **3** | **2437** | **254** | **3010** |

2023 වසර අවසන් වන විට ප්‍රධාන කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල කාර්ය මණ්ඩල සංඛ්‍යාව 54ක් වූ අතර, 2022 වර්ෂයේදීද එම අගය 60ක් වාර්තා කර ඇත. රුපියල් මිලියන 45.8.ක් 2022 වර්ෂයේදී මෙම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සඳහා වැය කර ඇති අතර 2023 වර්ෂයේදී රුපියල් මිලියන 49.2ක් වැය කර ඇත. 2022 ට සාපේක්ෂව 2023 දී රු.මිලියන 34ක් එනම් 7.4%කින් කාර්ය මණ්ඩල වැටුප් වැඩිවී ඇත. 2022 වසර අවසන් වන විට වතු අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් ඇතුළු කාර්යාල කාර්ය මණ්ඩලය සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය 299ක් වූ අතර 2023 වර්ෂයේදී එය 283ක් ලෙස අඩු අගයක් වාර්තා කර ඇත. 2022 වර්ෂයේදී රුපියල් මිලියන 125.47ක් මෙම කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා වැය කර ඇති අතර 2023 වර්ෂයේදී ඒ සඳහා රු. මිලියන 138.83ක් වැයකර ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල සහ විගණන කමිටු රැස්වීම්

*සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් හා විගණන කමිටු රැස්වීම් 04ක් පවත්වා ඇත.*

***වගුව 26 – අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණන කමිටු රැස්වීම්***

| අංකය | රැස්වීමේ නම | රැස්වීමේ දිනය | රැස්වීමේ අංකය |
|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | 2023.01.24 | 35 |
| | | 2023.03.09 | 36 |
| | | 2023.03.27 | 37 |
| | | 2023.04.24 | 38 |
| | | 2023.05.29 | 39 |
| | | 2023.06.26 | 40 |
| | | 2023.07.41 | 41 |
| | | 2023.08.25 | 42 |
| | | 2023.10.02 | 43 |
| | | 2023.10.27 | 44 |
| | | 2023.11.28 | 45 |
| | | 2023.12.22 | 46 |
| | | | |
| 2 | විගණන කමිටු රැස්වීම් | 2023.03.22 | 1 |
| | | 2023.06.09 | 2 |
| | | 2023.09.07 | 3 |
| | | 2023.12.08 | 4 |

2023 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයට රජයේ විගණකාධිපතිවරයා හිතකර මතයක් එනම් තත්ත්වාගණය කල මතයක් ලබාදී ඇත. දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අයහපත් අදහස් ලැබී ඇති අතර, එය නිවැරදි කර ගැනීමට හැකි වී ඇත.

# මුල්‍ය වාර්තා 2023



## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**ශ්‍රී ලංකා රුපියල්වලින්.**

| **දෙසැම්බර් 31 වන දිනට** | සටහන | පිටු අංක | **2023** | **2022** |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 13 | 1,362,996,754 | 1,194,116,372 |
| ජීවවිද්‍යාත්මක වත්කම් -පාරිභෝජ්‍ය | 9 | 15 | 3,361,498,115 | 3,360,565,296 |
| ආයෝජන දේපළ | 10 | 16 | 1,611,520,641 | 1,611,520,641 |
| ස්ථාවර තැන්පතු | | | - | 9,785,400 |
| විලම්භිත වත්කම් | 26 | 21 | 350,984 | 394,857 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | | **6,336,366,494** | **6,176,382,566** |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 11 | 17 | 86,221,740 | 67,399,258 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 12 | 17 | 309,421,777 | 301,442,535 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 13 | 18 | 5,088,843 | 109,537,932 |
| **මුළු ජංගම වත්කම්** | | | **400,732,360** | **478,379,725** |
| **මුළු වත්කම්** | | | **6,737,098,854** | **6,654,762,290** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | | |
| දායකත්ව ප්‍රාග්ධනය | 14 | 18 | 6,136,392,851 | 6,072,492,850 |
| රඳවාගත් ආදායම් | | | (2,355,053,627) | (2,258,965,172) |
| **මුළු ස්කන්ධය** | | | **3,781,339,224** | **3,813,527,678** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 15 | 18 | 584,181,197 | 643,923,619 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | | **584,181,197** | **643,923,619** |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 16 | 19 | 2,156,877,357 | 1,949,734,849 |
| බැංකු ණය | 16.1 | 19 | 79,310,000 | 100,000,000 |
| බැංකු අයිරා | 13 | 18 | 135,391,076 | 147,576,144 |
| **මුළු ජංගම වගකීම්** | | | **2,371,578,433** | **2,197,310,994** |
| **මුළු වගකීම්** | | | **2,955,759,630** | **2,841,234,612** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | | **6,737,098,854** | **6,654,762,290** |

පිටු අංක 5 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බව යටින් අත්සන් කර ඇති අය විසින් සහතික කරනු ලැබේ.

**එස්.අයි.එම්. හසන් මයා**

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය*

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් අනුමත කර අත්සන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| **ශ්‍රීමාල් විජේසේකර මයා** | **වයි.කේ. වැගොඩපොළ මයා** | **ආර්.එම්.එස්.පී.එස් බණ්ඩාර මයා** |
| සභාපති/ප්‍රධාන විධායක නිළධාරී | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

***2024 ක් වූ පෙබරවාරි මස 27 වන දාදීය.***

| ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව | | | | |
|---|---|---|---|---|
| ආදායම් ප්‍රකාශය | | | | |
| | | | | |
| ශ්‍රී ලංකා රුපියල්වලින් | | | | |
| දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වර්ෂය | සටහන් | පිටු අංක. | **2023** | **2022** |
| | | | | |
| | | | | |
| ආදායම | 17 | 20 | **1,012,615,844** | **1,070,663,514** |
| | | | | |
| විකුණුම් පිරිවැය | | | (915,210,110) | (934,986,055) |
| | | | | |
| **දළ ලාභය / (අලාභය)** | | | **97,405,733** | **135,677,459** |
| වෙනත් ආදායම් | 18 | 20 | 134,729,318 | 157,979,459 |
| පරිපාලන වියදම් | 19 | 20 | (252,774,948) | (224,870,036) |
| **මෙහෙයුම් ලාභය / (අලාභය)** | | | **(20,639,897)** | **68,786,883** |
| | | | | |
| මූල්‍ය ආදායම් | 18 | 20 | **1,014,565** | **1,974,535** |
| මූල්‍ය වියදම් | 20 | 20 | (73,048,571) | (51,089,659) |
| | | | | |
| **කාල සීමාව සඳහා ලාභය/ (අලාභය).** | | | **(92,673,903)** | **19,671,760** |
| | | | | |

පිටු අංක 5 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | | | | |
|---|---|---|---|---|
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය | | | | ශ්‍රී ලංකා රුපියල්වලින්. |
| | | | | |
| 2023 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා | | | | |
| | ප්‍රාග්ධනය | ඉඩම් දායකත්වය | සමුච්චිත ලාභය/(පාඩුව | එකතුව |
| | රු. | රු. | රු. | රු. |
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | 3,673,250,925 | 2,220,601,926 | (2,127,008,077) | 3,766,844,774 |
| භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන | 178,640,000 | - | - | 178,640,000 |
| වසරෙහි ලාභය | - | - | 19,671,760 | 19,671,760 |
| පෙර වසරෙහි ගැළපීම් (සටහන 25) | - | - | (151,628,855) | (151,628,855) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **3,851,890,925** | **2,220,601,926** | **(2,258,965,172)** | **3,813,527,679** |
| | | | | |
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | **3,851,890,925** | **2,220,601,926** | **(2,258,965,172)** | **3,813,527,679** |
| භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන | 63,900,000 | - | - | 63,900,000 |
| වසරෙහි ලාභය | - | - | (92,673,903) | (92,673,903) |
| පෙර වසරෙහි ගැළපීම් (සටහන 25) | - | - | (3,414,552) | (3,414,552) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **3,915,790,925** | **2,220,601,926** | **(2,355,053,627)** | **3,781,339,224** |
| | | | | |
| පිටු අංක 5 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ. | | | | |

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

### මූදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපිය ල්වලින්

| දෙසැම්බර් 31 වන අවසන් වන වර්ෂය සඳහා | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| බදුකරණයට පෙර ශුද්ධ ලාභය /(පාඩුව) | | **(92,673,903)** | **19,671,760** |
| **ගැළපීම් :** | | | |
| ජීවවිද්‍යාත්මක වත්කම් ක්ෂයවීම් | 8.1 | 4,723,618 | 3,426,102 |
| වත්කම් ක්ෂයවීම් | 8 | 14,197,209 | 11,105,732 |
| විලම්භිත වත්කම් ක්‍රමක්ෂය කිරීම | | 43,873 | 43,874 |
| මූල්‍ය වියදම් | 20 | 73,048,571 | 51,089,659 |
| මූල්‍ය ආදායම | 18 | (1,014,565) | (1,974,535) |
| පාරිතෝෂික වෙන්කිරීම් | 15 | 32,279,972 | 35,498,178 |
| විගණන ගාස්තු වෙන්කිරීම් | | 580,599 | 692,504 |
| රක්ෂණ වෙන්කිරීම් | | 1,490,093 | 1,035,757 |
| රජයේ ප්‍රදාන හා ආධාර | 18 | (2,655,167) | (592,667) |
| පෙර වර්ෂයේ ගැළපීම් | 25 | (3,414,552) | (151,628,855) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර ලාභය** | | **26,605,748** | **(31,632,493)** |
| | | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්** | | | |
| තොග (වැඩිවීම්)/ අඩුවීම් | | (18,822,482) | (3,538,062) |
| වෙළඳ හා වෙනත් ලැබීම් (වැඩිවීම්)/ අඩුවීම් | | (7,979,242) | (53,058,002) |
| ජංගම වගකීම් (වැඩිවීම්)/ අඩුවීම් | | 149,505,740 | 325,198,986 |
| **මෙහෙයුම්වලින් උත්පාදනය කරන ලද මුදල්** | | **122,704,016** | **268,602,921** |
| | | | |
| පාරිතෝෂික ගෙවීම් | | (22,738,709) | (25,682,747) |
| මූල්‍ය පිරිවැය ගෙවීම් | 20 | (51,394,143) | (42,952,373) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්** | | **75,176,912** | **168,335,308** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහයන්** | | | |
| මූල්‍ය ආදායම් | 18 | 1,014,565 | 1,632,892 |
| රජයේ ප්‍රදාන හා ආධාර | 18 | 2,655,167 | 592,667 |
| භාණ්ඩගාර ප්‍රදාන ලැබීම් | 14 | 63,900,000 | 178,640,000 |
| ස්ථාවර තැන්පතු ආපසුගැනීම් | | 9,785,400 | - |
| දේපළ, පිරියත හා උපකරණවලට වන එකතුකිරීම් | 8 | (187,693,245) | (252,702,032) |
| පාරිභෝජ්‍ය ජීවවිද්‍යාත්මක වත්කම්වලට වන එකතුකිරීම් | 9 | (932,819) | (4,209,531) |
| බැංකු ණය ආපසු ගෙවීම - මහජන බැංකුව | | (20,690,000) | - |
| ස්ථිර අයිරා පහසුකම පියවීම | | (35,480,000) | - |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | - | (359,413) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **(167,440,932)** | **(76,405,417)** |
| | | | |
| **මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම් /(අඩුවීම්)** | | **(92,264,019)** | **91,929,891** |
| | | | |
| **මුදල් හා මුදල් හා සමාන දෑ හි වෙනස්වීම්** | | | |
| කාලසීමාව ආරම්භයේදී | 13 | (38,038,213) | (129,968,104) |
| වසරෙහි වැඩිවීම/ (අඩුවීම) | | (92,264,019) | 91,929,891 |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ** | 13 | **(130,302,233)** | **(38,038,213)** |
| | | | |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ (සටහන13)** | | | |
| අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල් | | | |
| - ප්‍රධාන කාර්යාලය | | 3,125,608 | 105,048,534 |
| - වතුයායන් | | 1,963,235 | 4,489,398 |
| බැංකු අයිරා | | (135,391,076) | (147,576,144) |
| | | **(130,302,233)** | **(38,038,213)** |

# 2023 දෙසැම්බර් 31න් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශ සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ආයතනික තොරතුරු

**සාමාන්‍ය**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (සංස්ථාව) යනු 1958 අංක 4 දරන පනත යටතේ 1958 දී සංස්ථාපිත කර ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති රජයේ සංස්ථාවකි. එය කොළඹ 10, සිරි ධම්ම මාවතේ, අංක 257 හි පිහිටා ඇත.

සංස්ථාව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස දොළහක කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කරන අතර මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලාත්මක කරයි.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

තේ නිෂ්පාදනය සහ සැකසූ නිමි තේ, තේ නිෂ්පාදනය හරහා අලෙවි කිරීම, රබර් කිරි සහ සුළු හෝ අපනයන භෝග (කරාබු නැටි, ගම්මිරිස්, එනසාල්, කුරුඳු ආදිය) විකිණීම සහ සංස්ථාවේ වාණිජ දැව සිටුවීම සහ විකිණීම.

## 2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

සාධාරණ වටිනාකමට අගයන ලද ජීව විද්‍යාත්මක වත්කම් හැර, වෙනත් ඓතිහාසික පිරිවැයක පදනමක් මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

## 3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 3.1.1 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සංස්ථාව විසින් පහත සඳහන් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනී.

### 3.1.2 දේපල පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කිරීම් සහ සමුච්චිත හායන පාඩු ඇතිනම් ඒවා අඩුකිරීමෙන් පසුවය. එවැනි පිරිවැයක් තුල දේපල, පිරියත හා උපකරණවල ආංශික කොටස් ආදේශ කිරීමේ පිරිවැය සහ හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, දිගුකාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වේ. දේපල, පිරියත හා උපකරණවල සුවිශේෂී කොටස් අන්තරයක් සහිතව ආදේශ කිරීමට අවශ්‍ය වන්නේ නම්, සංස්ථාව එසේ ආදේශ කරන ලද කොටස හඳුනාගැනීමෙන් තොරව බැහැර කරන අතර, ඊට අදාල ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත, ක්‍රමක්ෂය කළ හැකි නව කොටසක් හඳුනාගැනීමට ලක් කරයි. මේ හා සමානව, යම් ප්‍රධාන පෙළේ විමර්ශනය කිරීමක් සිදුකළහොත්, හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, එහි පිරිවැය, ආදේශකයක් ලෙස එම පිරියත හා උපකරණයෙහි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම තුල හඳුනාගැනේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය හටගත් පිරිවැය ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ.

### 3.1.3 ක්ෂය කිරීම

මිලදීගත් දිනයේ සිට බැහැර කරන දිනය දක්වා වර්ෂය තුල අත්පත්කරගත් හා බැහැර කරන ලද දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය කිරීම් සිදු කෙරේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය සහ දේපල, පිරියත හා උපකරණවල ක්ෂය කිරීමේ අනුපාත පහත සඳහන් පරිදි වේ:

| අයිතමය | ප්‍රයෝජ්‍ය ආයුකාලය | අනුපාතය |
|---|---|---|
| ගොඩනැඟිලි | වසර 20 | 5% |
| මෝටර් රථ | වසර 4 | 25% |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | වසර 8 | 12.5% |
| කාර්යාල උපකරණ | වසර 8 | 12.5% |
| යන්ත්‍ර | වසර 8 | 12.5% |
| පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර | වසර 3 | 33.33% |

### 3.1.4 ජීවවිද්‍යාත්මක වත්කම්

ජීවවිද්‍යාත්මක වත්කම් යම් ජීවී සත්ත්වයෙකුට හෝ පැළෑටියකට අදාල වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41ට අනුව, ජීවවිද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් යම් පොදු ලක්ෂණ කිහිපයක් ඇත, එනම්, (අ) වෙනස් වීමට ඇති හැකියාව (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හැකියාව) (ආ) වෙනස්වීම කළමනාකරණය කරගැනීම (එම ක්‍රියාවලිය සිදුවීම සඳහා අවශ්‍ය තත්ත්වයන් වැඩිදියුණුකිරීමෙන් ජීවවිද්‍යාත්මක පරිවර්තනය වීම සඳහා කළමනාකරණය මගින් පහසුකම් සලසයි. එවැනි කළමනාකරණයක් මගින් කෘෂිකාර්මික කටයුතු වෙනත් කටයුතුවලින් වෙන් කර දක්වයි. උදාහරණයක් ලෙස, කළමනාකරණය නොකරන ලද මූලාශ්‍ර මගින් අස්වැන්න ලබාගැනීම) සහ (ඇ) වෙනස්වීම ගණනය කිරීම (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හෝ එමගින් ඇති වූ වෙනස දෛනික කළමනාකරණ කාර්යයක් ලෙස ගණනය කර, අධීක්ෂණය කෙරේ.)
ජීවවිද්‍යාත්මක වත්කම්, ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (bearer biological assets) සහ පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් (consumable biological assets) ලෙස දෙවැදෑරුම් වේ.

#### 3.1.4.1 ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (Bearer Biological Assets)

පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් හැර අන් වත්කම් ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, සංස්ථාවට අදාළව තේ පඳුරු, රබර් ගස් හා ඕනෑම ක්ෂේත්‍ර වගාවක් වැනි ප්‍රධාන පෙළේ වැවිලි කටයුත්තක් ඊට අයත් විය හැකිය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් ලබා දී ඇති විකල්පය පරිදි හා 2023 වසරෙහි සිට දේපළ, පිරියත හා උපකරණ යටතේ දැක්වෙන පරිදි යම් සමුච්චිත ක්ෂය කිරීමක් හා යම් සමුච්චිත හායන පාඩුවක් අඩු කර ලැබෙන පිරිවැයට මෙහි අගය ඉදිරියට ගෙන යනු ලැබේ.

ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය පහත සඳහන් පරිදි වේ:

| | | | |
|---|---|---|---|
| පොල් | වසර 25 | කොකෝවා | වසර 20 |
| ගම්මිරිස් | වසර 15 | කුරුඳු | වසර 25 |
| රබර් | වසර 35 | සාදික්කා | වසර 30 |
| කරාබුනැටි | වසර 50 | ඉඟුරු | වසර 01 |
| කෝපි | වසර 25 | තේ | වසර 100 |
| පුවක් | වසර 40 | | |
| එනසාල් | වසර 20 | | |

### 3.1.4.2 පරිභෝජනය කළ හැකි ජීව විද්‍යාත්මක වත්කම්

කෘෂිකාර්මික නිෂ්පාදිතයක් ලෙස අස්වැන්න ලබාගත හැකි හෝ ජීවවිද්‍යාත්මක වත්කම් ලෙස අලෙවි කළ හැකි වත්කම් පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, ඊට දැව ඇතුළත් වේ. කෘෂිකාර්මික නිෂ්පාදිත වෙළඳපොලට රැගෙන යාම සඳහා අවශ්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත අලෙවි පිරිවැය අඩු කර ලැබෙන සාධාරණ වටිනාකමට මෙකී නිෂ්පාදිත අගය කෙරේ. ඇගයීම මත යම් ලාභයක් හෝ පාඩුවක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගැනේ.

### 3.1.4.3 විලම්භිත වත්කම්

කල් තබන ලද වත්කම් වාර්ෂිකව 10%ක අනුපාතයට ක්‍රමක්ෂය කෙරේ.

### 3.1.5 ආයෝජන දේපල

ප්‍රාග්ධන ඇගයීම සඳහා සහ/හෝ කුලී ආදායම් ඉපැයීම සඳහා තබාගත් දේපල ආයෝජන දේපල තුළ අන්තර්ගත වේ. අදාල ගණුදෙණු පිරිවැය හා ඉන් අනතුරුව යම් දේපලකට එකතු කිරීම, යම් දේපලක් ආදේශ කිරීම හෝ අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් හටගත් පිරිවැය ඇතුලු පිරිවැයට මෙම දේපල මූලික වශයෙන් ගණනය කෙරේ. ඉන්පසුව සිදු කෙරෙන ගණනය කිරීම් ද සමුච්චිත ක්‍රමක්ෂය කිරීමෙන් අඩු කර ලැබෙන පිරිවැයට සිදු කෙරේ.

### 3.1.6 දැනට සිදු කරගෙන යන ප්‍රාග්ධන කාර්යයන් (Capital work in progress)

වර්ෂය තුල හට ගත්, එහෙත් ශේෂ පත්‍රය සකස් කරන දිනට ප්‍රාග්ධනීයකරණය නොකරන ලද ප්‍රාග්ධන වියදම්, දැනට සිදු කෙරෙන ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුල ප්‍රාග්ධනීයකරණය කරන ලද සහ භාවිත කළ ප්‍රාග්ධන වත්කම්, දේපල, පිරියත හා උපකරණවලට මාරු කර ඇත.

### 3.1.7 කල්බදු පහසුකම්

යම් පහසුකම් සැලසීමක් කල්බදු පහසුකමක් හෝ ඊට කල්බදු පහසුකමක් ඇතුළත් වන්නේද යන්න තීරණය කිරීම, එකී පහසුකමේ අන්තර්ගතය මත පදනම් වන අතර, එම පහසුකම් සැලසීම සපුරාලීම, යම් නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිත කිරීම මත සහ එමගින් වත්කම භාවිත කිරීමට අයිතිය ලබාදෙන්නේද යන්න මත රඳා පවතී.

**මූල්‍ය කල්බදු පහසුකම්**

වත්කම්හි අයිතියට ආනුශංගික වන, එහෙත් අත්‍යවශ්‍යයෙන් නීතිමය හිමිකම් නොවන සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු අන්දමින් ප්‍රතිපාර්ශ්වයන් වෙත මාරු කරන ගිවිසුම්, මූල්‍ය කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ.සංස්ථාව මූල්‍ය කල්බදු පහසුකම් යටතේ කල්බදු පහසුකම ලබාගන්නා බවට පත්වන විට, කල්බදු පහසුකමට යටත් වත්කම් ප්‍රාග්ධනීයකරණය කර, 'දේපල, පිරියත හා උපකරණ' තුල ඇතුළත් කරන අතර, කල්බදු පහසුකම් සපයන්නා හට ඇති කෙරෙන වගකීමේ බැඳීම 'කල්බදු ණයහිමිකරුවන්' තුල ඇතුළත් කෙරේ. වත්කමේ සාධාරණ වටිනාකමට හෝ වටිනාකම අඩු මට්ටමක පවතී නම්, අවම කල්බදු ගෙවීම්වල වත්මන් වටිනාකමට මූල්‍ය කල්බදු පහසුකමක් හා ඊට අදාල වගකීම මූලික වශයෙන් හඳුනාගැනේ. වගකීමේ ශේෂය මත ස්ථිර පොලී අනුපාතයක් ලබා දිය හැකි පරිදි කල්බදු පහසුකම තුල සැඟවුණු පොලී අනුපාතය මත පදනම්ව කල්බදු කාලසීමාව තුල 'ශුද්ධ පොලී ආදායම' තුල ගෙවිය යුතු මූල්‍ය ගාස්තු හඳුනාගැනේ.

**මෙහෙයුම් කල්බදු**

අනෙකුත් සියලුම කල්බදු පහසුකම් මෙහෙයුම් කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ. සංස්ථාව කල්බදු පහසුකම ලබාදෙන්නා බවට පත්වන විට, කල්බදු දී ඇති වත්කම් ශේෂ පත්‍රය තුල හඳුනා නොගැනේ. කල්බදු කාලසීමාවන් තුල මෙහෙයුම් කල්බදු යටතේ ගෙවිය යුතු හා ලැබිය යුතු කුලී ගාස්තු සෘජු රේඛීය පදනම මත ගිණුම්ගත කෙරෙන අතර, පිළිවෙලින් 'පරිපාලන වියදම්' සහ 'වෙනත් මෙහෙයුම් ආදායම්'හි ඇතුළත් කෙරේ.

### 3.2.1 තොග/භාණ්ඩ ලේඛන

පෙර පිවිසි පෙර නිකුත්(First in first out) පදනම මත අගයන ලද, යල්පැන ඇති හා සෙමින් ක්‍රියාකරන අයිතමයන් සඳහා දීමනා ලබාදීමෙන් අනතුරුව, පිරිවැයට හා නිෂ්කාශනය කළ හැකි ශුද්ධ උපලබ්ධි අගයට (Net Realizable Value) හෝ මින් කවර හෝ අඩු අගයකට භාණ්ඩ ලේඛන හඳුනාගැනේ.

**භාණ්ඩ ලේඛන ගණනය කිරීම**

### 3.2.2 භාණ්ඩ ලේඛනවල පිරිවැය

**අමුද්‍රව්‍ය**
යම් ආනුශංගික වියදමක් ද සහිතව මිලදීගැනීම්වල පිරිවැය.

**දැනට සිදු කරගෙන යන කාර්යයන්**
අමුද්‍රව්‍ය පිරිවැය හා විචලනය වන මුළු නිෂ්පාදන වියදම්.

**නිම කර ඇති භාණ්ඩ**
අමුද්‍රව්‍ය පිරිවැය හා විචලනය වන මුළු නිෂ්පාදන වියදම්.

### 3.2.3 මුදල් හා මුදල් සමානයන්

මුදල් හා මුදල් සමානයන් තුළ අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්, ස්ථාවර තැන්පතු ආයෝජන, අතිශයින් ඉහළ ද්‍රවශීලතාවකින් යුතු, මාස හයකින් හෝ ඊට අඩු කාලයකින් නියම ලෙස කල් පිරෙන වෙනත් කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ. ශේෂ පත්‍රයේ ජංගම වගකීම්හි ණය ගැනීම් තුළ බැංකු අයිරා අගයන් පෙන්නුම් කෙරේ.

### 3.2.4 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබාගැනීමේ අරමුණින් සිදු කරන පර්යේෂණ කටයුතු සඳහා දරන වියදම්, ඒවා හටගැනීමේදී ලාභාලාභ තුළ හඳුනාගැනේ.

## 4. වගකීම් හා ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

### 4.1.1 *අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාමික පාරිතෝෂික*

1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව, සංස්ථාව පාරිතෝෂිත ගෙවීමට බැඳී සිටියි. සංස්ථාව සමඟ අඛණ්ඩ වසර පහක කාලසීමාවක් සම්පූර්ණ කිරීම මත පමණක් යම් සේවකයෙකු හට පාරිතෝෂිත පිළිබඳ වග

කීමක් ඇති කෙරේ. මෙම වගකීම සපුරාලීම පිණිස, ශේෂ පත්‍රය තුල යම් ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යයි. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදන හා වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර වෙනස ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.

මෙම වගකීම සඳහා බාහිර වශයෙන් අරමුදල් නොසැපයේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් යටතේ වර්ග කෙරේ.

### 4.1.2 *අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාමික පාරිතෝෂිත*

සංස්ථාව මගින් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා දායකත්ව මුදල් සපයනු ලැබේ. අදාළ රෙගුලාසිය හා සමගාමීව, අදාල දායකත්ව අරමුදල් මගින් මෙම දායකත්ව මුදල් ආවරණය කෙරේ. සේවකයින් ආවරණය කරනු ලබන සැලසුම් සඳහා දායකත්වය ලබාදීමේ වගකීම ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

***සේවක අර්ථසාධක අරමුදල***
සංස්ථාව හා සේවකයින් විසින් මූලික වැටුප මත 12%ක් සංස්ථාවෙන්ද, 10%ක් සේවකයින්ගෙන්ද දායක මුදලක් ලබා දෙයි.

**සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදල**
සංස්ථාව විසින් මූලික වැටුප මත සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදලට 3%ක දායක මුදලක් ලබා දෙයි.

## 5. ආදායම් ප්‍රකාශය

මෙම ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය වෙනුවෙන්, වියදම් ක්‍රමවේදය මගින් සාධාරණ ලෙස සංස්ථාවේ කාර්යසාධනයේ අංග නිරූපණය වන හෙයින්, එකී ක්‍රමවේදයේ කාර්යයන් සඳහා අනුගත වේ.

### 5.1.1 *ආදායම් හඳුනාගැනීම*

සංස්ථාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාව සහිත මට්ටම දක්වා ආදායම් හඳුනාගැනෙන අතර, ගෙවීම සිදු කෙරෙන අවස්ථාව නොසලකා හරිමින් සාධාරණ ලෙස ආදායම් ගණනය කළ හැකිය. ගිවිසුම්ගත ආකාරයෙන් අර්ථනිරූපිත ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින්, ලද හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ වටිනාකමට ආදායම් ගණනය කෙරේ.

ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ පරිපාටිය ද සපුරාලිය යුතුය.

**භාණ්ඩ අලෙවි කිරීම**
සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදාහැරීම මත භාණ්ඩවල අයිතියේ සුවිශේෂී අවදානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත විතැන් වන විටදී, භාණ්ඩ අලෙවියෙන් ලද ආදායම් හඳුනාගැනේ.

**සේවා සැපයීම**
සේවා සපයන ලද හෝ ඉටු කරන ලද ගිණුම්කරණ කාලසීමාවේ සපයනු ලබන සේවාවන්ගෙන් ලද ආදායම් හඳුනා ගැනේ.

**වෙනත් ආදායම්**
වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගැනේ. මීට ප්‍රධාන වශයෙන් ආදායම් කළමනාකරණය කිරීම, ලියාපදිංචි ගාස්තු, ගස් සම්බන්ධ ටෙන්ඩර්වලින් ලද ආදායම් හා කල්බදු කුලී ආදායම් අයත්වේ.

### 5.1.2 වියදම්

ව්‍යාපාරය මෙහෙයවීමේදී හටගන්නා සියලුම වියදම් වර්ෂය සඳහා ලාභයට අයත්වන ආදායම් තුළ අන්තර්ගත කෙරේ. අලුත්වැඩියා කිරීම් හා නවීකරණය කිරීම්, එම වියදම් හටගන්නා වර්ෂයේ ලාභාලාභ තුළ අන්තර්ගත කෙරේ.

### 5.1.3 මූල්‍ය වියදම්

යම් වත්කමක් අපේක්ෂිත ලෙස භාවිත කිරීමට හෝ අලෙවි කිරීමට හෝ සූදානම් කරන තෙක් සැලකිය යුතු කාලසීමාවක් අත්‍යවශ්‍යයෙන්ම වැය වන එකී වත්කම අත්පත්කරගැනීමට, ඉදි කිරීමට හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම දායක වන ණයට ගැනීමේ පිරිවැය, අදාල වත්කම්හි පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කෙරේ. අනෙකුත් සියලුම ණයගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුල වියදම් සේ සැලකේ. සංස්ථාවේ මූල්‍ය වියදම් අයිරාව මත පොලිය, මුදල් මත කොමිස් ගාස්තු, ණය පොලී (බැංකු හා වෙනත්) හා තැරැව්කරුවන්ගේ පොලී යනාදියෙන් සමන්විත වේ.

## 6. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනිම සහ පසුකාලීන ගණනය කිරීම්

## 6.1 මූල්‍ය වත්කම්

### 6.1.1 මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39හි විෂය පථය තුළ පවතින මූල්‍ය වත්කම්, යෝග්‍ය පරිදි ලාභ හෝ පාඩු, ණය හා ලැබිය යුතු, කල්පිරීමට තබා ඇති ආයෝජන සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර, මූලික හඳුනාගැනීමේදී සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම පිළිබඳව නිර්ණය කරයි.
සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර, ඊට අතිරේකව, ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට නොවන වත්කම් සම්බන්ධයෙන් සෘජුවම ගණුදෙණු පිරිවැයට අදාලව හඳුනාගැනේ.
සංස්ථාවේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන ස්ථාවර තැන්පතු, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු හා අනෙකුත් තැන්පතු ඇතුළත් වේ. ඉහත මූල්‍ය වත්කම් පහත සඳහන් ජංගම වත්කම් යටතේ පෙන්නුම් කරයි..

### 6.1.2 පසුකාලීන ගණනය කිරීම්

පසුකාලීනව මූල්‍ය වත්කම් ගණනය කිරීම පහත සඳහන් ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී..

#### 6.1.2.1 ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් තුළ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූලික වශයෙන් හඳුනාගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් අලෙවි කිරීමේ හෝ නුදුරු කාලයකදී නැවත මිලදීගැනීමේ අරමුණින් අත්පත්කරගන්නේ නම්, එකී වත්කම් අලෙවිය සඳහා තබාගන්නා ලද වත්කම් සේ වර්ගීකරණය කෙරේ. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට ලද කිසිදු මූල්‍ය වත්කමක් නොවීය.

#### 6.1.2.2 ණය හා ලැබිය යුතු

ණය හා ලැබිය යුතු යනු සක්‍රීය වෙළඳපොලක් තුල සඳහන් නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, පසුකාලීනව එවැනි මූල්‍ය වත්කම්, හායනය කිරීම් අඩු කර ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ. යම් වට්ටමක් හෝ අත්පත්කරගැනීමක් මත රක්ෂණ වාරිකයක් හා EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කෙරේ. මෙම EIR ක්‍රමක්ෂය කිරීම මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුළ ඇතුළත් කෙරේ. හායනය මගින් හටගන්නා පාඩු මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය පිරිවැය තුළ හඳුනාගැනේ.

### 6.1.2.3 කල් පිරීමට තබා ඇති ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හා ස්ථාවර කල්පිරීම් කල් පිරෙන තෙක් රඳවාගැනීමේ සද්භාවය සහ හැකියාව සංස්ථාව සතු වන විට, එවැනි වත්කම් කල් පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, කල් පිරීමට තබා ඇති ආයෝජන, හායනය අඩු කර, ඵලදායී පොලී ක්‍රමවේදය අනුගමනය කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. අත්පත්කරගැනීමක් මත යම් වට්ටමක් හෝ රක්ෂණ වාරිකයක් සහ EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුල ඇතුළත් කෙරේ. හායනයෙන් ජනනය වන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගැනේ. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කල් පිරීමට තබා ඇති කිසිදු ආයෝජනයක් නොමැත.

### 6.1.2.4 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යන්නට ස්කන්ධ හා ණය ඇපකර යනාදිය ඇතුළත් වේ. ස්කන්ධ ආයෝජන විකිණීමට ඇති සේ වර්ගීකරණය කරනුයේ, අලෙවිය සඳහා ඇති හෝ ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකම සඳහා යනුවෙන් වර්ගීකරණය කර නොමැති හෙයිනි. මෙම කාණ්ඩයේ ණය ඇපකර යනු අවිනිශ්චිත කාලසීමාවක් සඳහා තබා ගැනීමට අපේක්ෂා කරන, ද්‍රවශීලතා අවශ්‍යතාවලට සහ වෙළඳපොල තත්ත්වයන්හි වෙනස්කම්වලට ප්‍රතිචාරී ලෙස අලෙවි කළ හැකි ඇපකර වේ.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව විකිණීමට ඇති කිසිදු මූල්‍ය ආයෝජනයක් නොමැත.

### 6.1.2.5 හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් මූල්‍ය වත්කමක් (හෝ අදාල වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ ඒ හා සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගැනීමෙන් තොරව බැහැර කරනුයේ,

i). එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වූ විට;

ii). සංස්ථාව මගින් එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරාදුන් විට හා 'pass-through' ක්‍රමය යටතේ යම් තෙවන පාර්ශ්වයක් වෙත කිසිදු ආකාරයක ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහ ගෙවීමට යම් වගකීමක් භාර ගත් විට; සහ එමෙන්ම

(අ) සංස්ථාව විසින් සැලකිය යුතු ලෙස වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දී ඇති විට; හෝ

(ආ) සංස්ථාව විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පවරා දී හෝ රඳවා ගෙන නොමැති නමුත්, වත්කමේ පාලනය පවරා දී ඇති විට.

### 6.1.2.6 මූල්‍ය වත්කම් හායනය වීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හායනය වී ඇති බවට යම් වාස්තවික සාක්ෂියක් පවතීද යන්න සංස්ථාව විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම අගයනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුව ඇති යම් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක ප්‍රතිඵලයක් ලෙස හායනය සිදු ව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් හා සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකි එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත එම පාඩු සිදු කරන ලද සිදුවීම මගින් බලපෑමක් සිදු කර ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් එකී මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩය හායනය වී ඇතැයි සැලකිය යුතුය.

යම් ණයගැතියන් හෝ ණයගැතියන් කාණ්ඩයකට සුවිශේෂී මූල්‍ය දුෂ්කරතාවකට මුහුණ දෙමින් සිටින බව, පොලී හෝ ප්‍රධාන ගෙවීම් වංචා කිරීම හෝ පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට පත්වන

බව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානය කිරීමකට සූදානම් වන බව සහ වංචාවන් සමඟ සහසම්බන්ධ වන ගෙවුම් හිඟ හෝ ආර්ථික තත්ත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ තුල ගණනය කළ හැකි අඩුවීමක් ඇති බවට නිරීක්ෂණය කළ හැකි දත්ත මගින් පෙන්නුම් කරන විටෙක හායනය වීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. දැනට සංස්ථාව විසින් ලැබිය යුතු වෙළඳ සඳහා නිශ්චිත ප්‍රතිපාදනයක් හඳුනාගෙන ඇත.

### 6.1.2.7 ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව විසින් පළමුව තනි තනි වශයෙන් වැදගත් හෝ එසේ තනි තනි වශයෙන් සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් හායනය වීමක් ඇති බවට වාස්තවික සාක්ෂි පවතින්නේද යන්න අගයනු ලබයි. සුවිශේෂී වන හෝ නොවන යම් තනි තනි වශයෙන් අගයන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් හායනය වීමක් පිළිබඳ කිසිදු වාස්තවික සාක්ෂියක් නොමැති බවට සංස්ථාව නිර්ණය කරන්නේ නම්, ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුල එම වත්කම ඇතුළත් කර, හායනය වීම සම්බන්ධයෙන් සාමූහික ලෙස ඇගයේ. හායනය වීම සම්බන්ධයෙන් තනි තනි වශයෙන් අගයන ලද සහ හායනය වීමක් හඳුනාගත් හෝ එසේ අඛණ්ඩව සිදු වන බව හඳුනාගත් වත්කම් සාමූහික හායන ඇගයුමක් තුළ ඇතුළත් නොකෙරේ.

යම් හායන පාඩුවක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, වත්කමේ ඉදිරියට ගෙන යන ශේෂය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (දැනට සිදුව නොමැති අනාගතයේ අපේක්ෂා කරන ණය පාඩු හැර) වෙනස ලෙස එම පාඩුවේ ප්‍රමාණය ගණනය කෙරේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම සඳහා එම මූල්‍ය වත්කමේ මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් ලබා දෙයි.

## 6.2 මූල්‍ය වගකීම්

**මූලික හඳුනාගැනීම හා ගණනය කිරීම**

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වගකීම් හෝ ණය හා ණයගැනීම් හෝ යෝග්‍ය පරිදි ඵලදායී සීමාවක් තුල සීමාසහිත මූල්‍ය උපකරණ ලෙස හඳුනාගෙන ඇති ව්‍යුත්පන්න ලෙස ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39හි විෂයපථය තුල පවතින මූල්‍ය වගකීම් වර්ගීකරණය කෙරේ. සංස්ථාව විසින් මූලික හඳුනාගැනීම්වලදී සිය වගකීම් වර්ගීකරණය පිළිබඳව තීරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබුවද, ණය හා ණයගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය පිරිවැය ඔස්සේ ඉදිරියට ගෙන යනු ලබයි. මීට ඍජුවම අදාල වන ගණුදෙණු පිරිවැය ඇතුළත් වේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් තුල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු සහ බැංකු අයිරා ඇතුළත් වේ.

**පසුකාලීන ගණනය කිරීම්**
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
යම් වගකීමක් යටතේ පවතින මූල්‍ය වගකීමක් ඉටු කළ විට හෝ අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට එම වගකීම හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

## 7. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පළමු වරට අදාළ කරගැනීම (SLFRS/LKAS)

2012 ජනවාරි මස 01 දින සිට බලාත්මක වන, ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රමිතිකරණ ප්‍රමිතීන් හා ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පළමු වරට සංස්ථාව විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය ඇතුලු සහ ඒ දක්වා කාලසීමාවන් සඳහා සංස්ථාව විසින් මුල් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සිය මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදි.

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

### මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

**8** දේපළ, පිරියත හා උපකරණ

| ප්‍රධාන කාර්යාලය | සින්නක්කර ඉඩම් | ගොඩනැගිලි | උපකරණ | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | පරිගණක | මෝටර් වාහන | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| පිරිවැය හෝ තක්සේ රුකිරීම් | | | | | | | |
| **2023 ජනවාරි 1 දිනට** | **4,031,845** | **4,959,427** | **12,356,634** | **7,194,236** | **5,657,052** | **66,115,401** | **100,314,594** |
| එකතුකිරීම් | - | - | 1,920,735 | 2,315,890 | 1,063,099 | 1,396,574 | **6,696,298** |
| බැහැරකිරීම් | - | - | - | - | - | - | - |
| මාරුකිරීම් | - | - | - | - | - | - | - |
| **2023 දෙසැම්බර් 31 දිනට** | **4,031,845** | **4,959,427** | **14,277,369** | **9,510,126** | **6,720,151** | **67,511,974** | **107,010,892** |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| **2023 ජනවාරි 1 දිනට** | - | **4,959,384** | **10,951,980** | **3,953,031** | **4,777,732** | **66,094,153** | **90,736,280** |
| වසරෙහි ක්ෂයවීම් | - | - | 391,320 | 810,774 | 372,046 | 123,316 | **1,697,455** |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | - | - | - |
| **2023 දෙසැම්බර් 31 දිනට** | - | **4,959,384** | **11,343,300** | **4,763,804** | **5,149,778** | **66,217,469** | **92,433,735** |
| **ශුද්ධ පොත් අගය** | | | | | | | |
| **2023 දෙසැම්බර් 31 දිනට** | **4,031,845** | **43** | **2,934,069** | **4,746,322** | **1,570,373** | **1,294,505** | **14,577,157** |

| වතුයායන් | ඉඩම් | ගොඩනැගිලි | උපකරණ | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | පරිගණක | මෝටර් වාහන | යන්ත්‍රෝපකරණ | හිමිකම් කියන වෙනත් වත්කම් | ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (සටහන 8.1) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය හෝ තක්සේරුකිරීම් | | | | | | | | | | |
| **2023 ජනවාරි 1 දිනට** | **645,345,972** | **184,104,453** | **23,299,859** | **5,523,633** | **1,035,022** | **84,200,574** | **144,279,268** | **6,705,259** | **803,300,611** | **1,897,794,650** |
| එකතුකිරීම් | - | 17,462,389 | 5,621,416 | 2,767,500 | 141,700 | | 30,950,415 | | 124,053,527 | **180,996,947** |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | - | - | - | (32,286) | - | **(32,286)** |
| මාරුකිරීම් | - | - | - | - | - | - | - | - | (6,500) | **(6,500)** |
| බැහැරකිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| **2023 දෙසැම්බර් 31 දිනට** | **645,345,972** | **201,566,842** | **28,921,275** | **8,291,133** | **1,176,722** | **84,200,574** | **175,229,683** | **6,672,973** | **927,347,638** | **2,078,752,811** |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | | | | |
| 2023 ජනවාරි 1 දිනට | - | 120,775,860 | 19,509,922 | 627,160 | 896,470 | 72,527,146 | 110,280,810 | 6,672,972 | 381,966,254 | **713,257,870** |
| වසරෙහි ක්ෂයවීම් | - | 4,106,237 | 1,089,429 | 363,295 | 100,879 | 879,842 | 5,960,071 | - | 4,723,618 | **17,223,372** |
| මාරුකිරීම්/නිවැරදි කිරීම් | | | | | | | | | (19,711) | **(19,711)** |
| **2023 දෙසැම්බර් 31 දිනට** | - | **124,882,097** | **20,599,351** | **990,455** | **997,348** | **73,406,988** | **116,240,882** | **6,672,972** | **386,541,844** | **730,333,213** |
| **ශුද්ධ පොත් අගය** | | | | | | | | | | |
| **2023 දෙසැම්බර් 31 දිනට** | **645,345,972** | **76,684,745** | **8,321,924** | **7,300,678** | **179,374** | **10,793,586** | **58,988,802** | **1** | **540,805,794** | **1,348,419,597** |
| ශුද්ධ පොත් අගය ප්‍රධාන කාර්යාලය සහ වතුයාය **2023** දෙසැම්බර් **31** දිනට (එකතුව) | **649,377,816** | **76,684,788** | **11,255,993** | **12,047,000** | **1,749,747** | **12,088,091** | **58,988,802** | **1** | **540,805,794** | **1,362,996,754** |

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

### මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

8.1 ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම්

ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් ඒවායේ පිරිවැයට සමුච්චිත ක්ෂයවීම් ගැලපීමෙන් පසුව ගිණුම් වල පවත්වා ගෙන යනු ලැබේ.

| ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් | තේ මේරූ වගාව | නොමේරූ වගාව | වෙනත් බෝග නොමේරූ වගාව | පොල් | ගම්මිරිස් | රබර් | කෝපි | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය හෝ තක්සේරුකිරීම් | | | | | | | | | |
| 2023 ජනවාරි 1 දිනට | 506,883,377 | 253,243,396 | - | 3,870,374 | 3,709,621 | 15,270,484 | 1,565,492 | 18,757,867 | 803,300,611 |
| එකතුකිරීම් | 1,777,648 | 103,816,149 | 16,527,314 | | | - | | 1,932,417 | 124,053,527 |
| පෙර වර්ෂයේ ගැළපීම් | | | | | | | | | - |
| මාරුකිරීම්/නිවැරදිකිරීම් | (6,500) | - | | - | - | - | - | - | (6,500) |
| බැහැරකිරීම් | - | - | | - | - | - | - | - | - |
| 2023 දෙසැම්බර් 31 දිනට | 508,654,524 | 357,059,545 | 16,527,314 | 3,870,374 | 3,709,621 | 15,270,484 | 1,565,492 | 20,690,284 | 927,347,638 |
| | | | | | | | | | |
| සමුච්චිත ක්ෂයවීම් | තේ නොමේරූ හා මේරූ තේ | නොමේරූ වගාව | නොමේරූ වගාව | පොල් | ගම්මිරිස් | රබර් | කෝපි | වෙනත් | එකතුව |
| 2023 ජනවාරි 1 දිනට | 368,101,655 | - | - | 2,841,452 | 2,527,333 | 5,322,808 | 1,433,107 | 1,739,899 | 381,966,254 |
| වසරෙහි ක්ෂයවීම් | 2,381,862 | - | - | 517,483 | 125,435 | 1,138,502 | 7,702 | 552,635 | 4,723,618 |
| පෙර වර්ෂයේ ගැළපීම් | (140,980) | - | - | | (4,825) | 1,931 | 2,189 | 13,368 | (128,317) |
| මාරුකිරීම්/නිවැරදිකිරීම් | (19,711) | - | - | | | | | | (19,711) |
| බැහැරකිරීම් | - | - | - | - | - | - | - | - | - |
| 2023 දෙසැම්බර් 31 දිනට | 370,322,825 | - | - | 3,358,935 | 2,647,942 | 6,463,241 | 1,442,998 | 2,305,901 | 386,541,844 |
| | | | | | | | | | |
| ශුද්ධ පොත් අගය | | | | | | | | | |
| 2023 දෙසැම්බර් 31 දිනට | 138,331,699 | 357,059,545 | 16,527,314 | 511,439 | 1,061,679 | 8,807,242 | 122,494 | 18,384,383 | 540,805,794 |
| | | | | | | | | | |
| 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | | | | | | | | | 540,805,794 |

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

## මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

### 9 ජීවවිද්‍යාත්මක වත්කම් -පාරිභෝජ්‍ය

| ජීවවිද්‍යාත්මක වත්කම් -පාරිභෝජ්‍ය | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|
| | රු. | රු. |
| **ජීවවිද්‍යාත්මක වත්කම්** | **3,360,565,296** | **3,356,355,765** |
| වසර තුළ එකතුකිරීම් | 932,819 | 4,209,531 |
| **මුළු පාරිභෝජ්‍ය ජීවවිද්‍යාත්මක වත්කම්** | **3,361,498,115** | **3,360,565,296** |

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි වතුයායන්හි පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීම වර්තමානයේදි සිදුකරමින් පවතී.

2023 වර්ෂයේදි, සංස්ථාව විසින් වතුයායන් විසින් ඉදිරිපත් කරන ලද ගස් වව්වෝරු වල නිරවද්‍යතාවය ඒවා තක්සේරු කිරීමට පෙර පරීක්ෂා කරන ලදි.

ගස් වව්වෝරු නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු සුදුසු සහ පිළිගත හැකි ක්‍රමවේදයක් භාවිතා කරමින් පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු.

පහත වගුවේ දැක්වෙන්නේ 2023 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුයායන්හි හි තිබෙන්නාවූ ගස් සංඛ්‍යාවයි.
2018-2023 සඳහා අනුමත වන කළමනාකරණ සැලසුම් අනුව කපා ගත හැකි ගස් සංඛ්‍යාව දෙවන තීරුවේ වෙන වෙනම පෙන්වා ඇත.

| වතුයායෙහි නම | 2023/12/31 දිනට භෞතික සත්‍යාපනයට අනුව (වන කළමනාකරණ සැලැස්මේ ඇති ගස් හැර) මුළු ගස් සංඛ්‍යාව | අනුමත වන කළමනාකරණ සැලැස්මට අනුව 2023.12.31 දිනට කපාගත හැකි සෙසු ගස් සංඛ්‍යාව | 2023.12.31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි වතුයායන්හි පවතින මුළු ගස් සංඛ්‍යාව |
|---|---|---|---|
| අලකොළ රාජ්‍ය වතුයාය | 3,042 | 209 | 3,251 |
| කොටගහ රාජ්‍ය වතුයාය | 4,070 | 1,093 | 5,163 |
| ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය | 10,338 | - | 10,338 |
| ගෝමර රාජ්‍ය වතුයාය | 7,232 | 303 | 7,535 |
| හාගල රාජ්‍ය වතුයාය | 7,517 | - | 7,517 |
| හෙයාපාර්ක් රාජ්‍ය වතුයාය | 3,182 | - | 3,182 |
| හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය | 5,691 | - | 5,691 |
| කැලෑබොක්ක රාජ්‍ය වතුයාය | 7,544 | 7,177 | 14,721 |
| මිඩ්ලන්ඩ්ස් රාජ්‍ය වතුයාය | 10,471 | 782 | 11,253 |
| නිකොළොය රාජ්‍ය වතුයාය | 2,320 | - | 2,320 |
| ඔපල්ගල රාජ්‍ය වතුයාය | 10,523 | 964 | 11,487 |
| රංගල රාජ්‍ය වතුයාය | 5,544 | 45 | 5,589 |
| වෛතලාව රාජ්‍ය වතුයාය | 6,959 | 109 | 7,068 |
| විහාරගල රාජ්‍ය වතුයාය | 791 | - | 791 |
| වූඩ්සයිඩ් රාජ්‍ය වතුයාය | 3,299 | 4,435 | 7,734 |
| වලහන්දුව රාජ්‍ය වතුයාය | 1,051 | - | 1,051 |
| මුළු ගස් සංඛ්‍යාව | **89,574** | **15,117** | **104,691** |

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

### මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

| | | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|
| **10** | **ආයෝජන දේපළ** | රු. | රු. |
| | රජයේ ඉඩම් දායකත්වය | 1,600,601,926 | 1,600,601,926 |
| | ප්‍රාග්ධන අගය වැඩිකිරීම සඳහා දරණ ලද පිරිවැය | 10,918,715 | 10,918,715 |
| | | **1,611,520,641** | **1,611,520,641** |

**10.1 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC) සතු ඉඩම් සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් (RPCs) වෙත පවරා දුන් ඉඩම්.**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC) සහ අනෙකුත් රාජ්‍ය ආයතනය විසින් ගැසට් නිවේදන මගින් ඉඩම් දෙසිය හැත්තෑ හතරක (274) අයිතිය
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා ඇති අතර ඉන් ඉඩම් දෙසිය හතළිහක් (240) ප්‍රාදේශීය වැවිලි සමාගම් විස්සක් (20) වෙත පවරා දී ඇත. .
අදාළ විස්තර පහත පරිදි වේ

| | ගැසට් අංකය | ගැසට් කරන ලද දිනය | පවරනු ලැබූයේ | ශ්‍රී.ලං.රා.වැ.ස ට පවරන ලද ඉඩම් සංඛ්‍යාව | ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබාදුන් ඉඩම් | ශ්‍රී.ලං.රා.වැ.ස සතු ඉඩම් |
|---|---|---|---|---|---|---|
| 1 | 150/12 | 24.07.1981 | ඉ.ප්‍ර.කො | 38 | 38 | - |
| 2 | 569/14 | 02.08.1989 | ඉ.ප්‍ර.කො | 3 | 3 | - |
| 3 | 571/14 | 18.08.1989 | ඉ.ප්‍ර.කො | 1 | 1 | - |
| 4 | 157/13 | 03.04.1975 | වෙනත් රාජ්‍ය ආයතන. | 5 | 5 | - |
| 5 | 181/12 | 27.02.1982 | ඉ.ප්‍ර.කො | 80 | 54 | 26 |
| 6 | 195/6 | 31.05.1982 | ඉ.ප්‍ර.කො | 14 | 9 | 5 |
| 7 | 206/15 | 20.08.1982 | ඉ.ප්‍ර.කො | 1 | - | 1 |
| 8 | 230/12 | 02.02.1983 | ඉ.ප්‍ර.කො | 1 | 1 | - |
| 9 | 439/18 | 06.02.1987 | වෙනත් රාජ්‍ය ආයතන. | 1 | - | 1 |
| 10 | 937/2 | 19.08.1996 | ඉ.ප්‍ර.කො | 7 | 7 | - |
| 11 | 815/10 | 21.04.1994 | ඉ.ප්‍ර.කො | 123 | 122 | 1 |
| **මුළු ඉඩම්** | | | | **274** | **240** | **34** |

**10.2 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු අනෙකුත් ඉඩම් සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත පවරා දුන් ඉඩම්.**

ශ්‍රී.ලං.රා.වැ.ස විසින් ඉඩම් තිහක් (30) මිලදී ගෙන ඇති අතර ගැසට් නිවේදන නොමැතිව රජයේ ආයතන වෙතින් වතු එකොළහක් (11) ලැබී ඇත.

ඉඩම් හතළිස් එකකින් (41) ඉඩම් හතළිහක්ම (40) ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත පවරා ඇති අතර විස්තර පහත පරිදි වේ.

| | ඉඩම් මූලාශ්‍රය | ලද වසර | ඉඩම් සංඛ්‍යාව | ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දුන් | ශ්‍රී.ලං.රා.වැ.ස සතු ඉඩම් | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 1 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 1960 | 4 | 4 | - | - |
| 2 | ඉඩම් කොමසාරිස් | 1968 | 1 | - | - | මහවැලි ව්‍යාපෘතිය වෙත භාරදෙන |
| 3 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 1977 | 6 | 6 | - | - |
| 4 | ශ්‍රී.ලං.රා.වැ.ස විසින් මිලදී ගත් | 1972, 1973, | 30 | 30 | - | - |
| | **මුළු ඉඩම්** | | **41** | **40** | - | |

ඒ අනුව, 1992 වසරේදී ඉඩම් දෙසිය අසූවක් (280) වසර පනස් තුනකට (53) බදු පදනම මත ප්‍රාදේශීය වැවිලි සමාගම් විස්සක් (20) වෙත ලබා දී ඇත.

බදු කාලය 2045 දී අවසන් වේ.

බදු ගිවිසුම්වලට අනුව, සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම, උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම සහ ආගරපතන වැවිලි සමාගම යන සමාගම් විසින්
ශ්‍රී.ලං.රා.වැ.ස වෙත බදු කුලී ගෙවීම් සිදුකරනු ලබන අතර අනෙකුත් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් ලබන බදු කුලී මහා භාණ්ඩාගාරය වෙත ගෙවනු ලැබේ.

ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 ට අනුව, ආයෝජන දේපලක් මුල් අවස්ථාවේදී (මාරු කිරීමේ අවස්ථාවේ) එහි පිරිවැයෙන් මනිනු ලබන අතර පසුව සාධාරණ වටිනාකම්
ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය භාවිතා කරයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වෙත පරිවර්ථනය වන අවස්ථාවේ මාරුකිරීම සිදුකළ දිනයේ බවත්ය.
අධීක්ෂණ අගයන් ලබා ගැනීමට කළමනාකාරීත්වයට නොහැකි වූ අතර ඒ වෙනුවට ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දෙන අවස්ථාවේ වටිනාකම
වතු වල සාධාරණ වටිනාකම ලෙස සැලකේ. එබැවින් 1992 වන විට ඉඩම් වටිනාකම ප්‍රාදේශීය වැවිලි සමාගම්හි ශේෂ පත්‍රවලින් සමානුපාතිකව උපුටා ගන්නා ලදී.
කළමනාකාරිත්වයේ අදහස වන්නේ මෙම ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දුන් දිනට එම ඉඩම්වල පිරිවැය සාධාරණ ලෙස පිළිබිඹු කරන බවත්,
එම අගයන් ගිණුම් පොත්වල ඉදිරියට ගෙන යන බවත්ය.

**2023** වර්ෂය තුළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් ඉඩම් තක්සේරු කිරීම සඳහා මූලික පියවර ගෙන ඇති අතර, අප වෙත අයත් ඉඩම්
තක්සේරු කරන ලෙසත් තක්සේරු කිරීම සඳහා වන මුළු පිරිවැය දන්වන ලෙසත් දන්වමින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිඛිත ඉල්ලීමක් කර ඇත.
පිළිතුරු වශයෙන් ඔවුන් අපගේ ඉඩම් තක්සේරු කිරීම සඳහා ඔවුන්ගේ ගාස්තුව/අයකිරීම ගණනය කිරීමේ සූත්‍රය සම්බන්ධයෙන් අප දැනුවත් කර ඇත.
මෙම ඉඩම් තක්සේරු කිරීම සඳහා ලබා දී ඇති සූත්‍රයට අනුව මෙම තක්සේරු කිරීම් සම්පූර්ණ කිරීමට විශාල මුදලක් අවශ්‍ය වේ යැයි අපි අපේක්ෂා කරමු.
අප මුහුණ දී සිටින වත්මන් මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙවැනි විශාල වියදමක් දැරීමට මේ මොහොතේ හැකියාවක් නොමැත. කෙසේවුවද,
මෙම ඉඩම් තක්සේරු කිරීමේ මූලික පියවර ලෙස, නියමු ව්‍යාපෘතියක් වශයෙන් එක් වතුයායක තක්සේරු කටයුතු සිදුකරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය
අප වෙත උපදෙස් දී ඇති අතර ඉදිරි වසරවලදී සියලුම ඉඩම් තක්සේරු කිරීම ආරම්භ කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

| | | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|
| 11 | තොග | | |
| | | රු. | රු. |
| | නිමි නිෂ්පාදන | 51,878,540 | 20,618,706 |
| | භාවිත කළ හැකි තොග | 34,343,200 | 46,780,552 |
| | | **86,221,740** | **67,399,258** |
| | නිමි නිෂ්පාදන තොගයේ අගය ගණනය කරනු ලැබුවේ පිරිවැය සහ දළ තථ්‍ය අගය (NRV) සලකා බැලීමෙන් පසුවය | | |

| | | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|
| 12 | වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | | |
| | | රු. | රු. |
| | වෙළඳ ණයගැතියන් - ප්‍රධාන කාර්යාලය(අ) | 43,124,085 | 75,654,661 |
| | **අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ ණයගැතියන් සඳහා වෙන්කිරීම්** | (19,879,268) | (19,879,268) |
| | වෙළඳ ණයගැතියන් -සියලු වතුයායන් (ආ) | 251,813,385 | 239,834,659 |
| | **අඩුවීම් - : වතු ණයගැතියන් සඳහා වෙන්කිරීම්** | (59,652,474) | (59,652,474) |
| | වෙනත් ලැබීම්-ප්‍රධාන කාර්යාලය | 61,465,342 | 35,444,728 |
| | අඩුකිරීම් : අඩමාණ ණය-බදු ඉඩම් කුලී සඳහා ප්‍රතිපාදන | (15,780,848) | (15,780,848) |
| | වෙනත් ලැබීම්-සියලු වතුයායන් | 48,331,554 | 45,821,076 |
| | පාරිතෝෂික අත්හිටුවීම් (2012 ශේෂ) | 85,257,147 | 85,257,147 |
| | අඩුවීම් : පාරිතෝෂිත අත්හිටුවීම් සඳහා වෙන්කිරීම් | (85,257,147) | (85,257,147) |
| | | **309,421,776** | **301,442,535** |

| | | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|
| අ). | **වෙළඳ ණයගැතියන් - ප්‍රධාන කාර්යාලයට පහත ශේෂයන් ඇතුළත් වේ** | | |
| | B.C.C. සමාගම | 15,404,568 | 15,404,568 |
| | අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ ණයගැතියන්ගේ විශේෂ අපහායනයන් | (15,404,568) | (15,404,568) |
| | ඇල්කඩුව වතුයාය | 1,916,092 | 1,916,092 |
| | වුඩ්සයිඩ් වතුයාය | 992,125 | 992,125 |
| | අඩුවීම්: අඩමාණ ණය -වුඩ්සයිඩ් සඳහා ප්‍රතිපාදන | (992,125) | (992,125) |
| | ඩක්වාරි | 2,500,000 | 2,500,000 |
| | අඩුවීම්: අඩමාණ ණය -ඩක්වාරි සඳහා ප්‍රතිපාදන | (2,500,000) | (2,500,000) |
| | වෙළඳ ණයගැතියන් | 880,434 | 880,434 |
| | අඩුවීම්: අඩමාණ ණය -වෙළඳ ණයගැතියන් සඳහා ප්‍රතිපාදන | (880,434) | (880,434) |
| | ජී.ජී.මහේන්ද්‍රරත්න | 102,140 | 102,140 |
| | අඩුවීම්: අඩමාණ ණය - ජී.ජී.මහේන්ද්‍රරත්න සඳහා ප්‍රතිපාදන | (102,140) | (102,140) |
| | ගිණුම් ලැබීම් - තේ දළු මිලදී ගන්නන් | 21,031,488 | 53,791,771 |
| | සුළු හා වෙනත් ණයගැතියන් | 297,337 | 67,530 |
| | | **23,244,917** | **55,775,393** |
| ආ). | **වෙළඳ ණයගැතියන් - වතුයායන්ට පහත ශේෂයන් ඇතුළත් වේ.** | | |
| | විවිධ ණයගැතියන් | 38,390,538 | 37,164,388 |
| | පාරිභෝගික ණයගැතියන් | 41,071,407 | 41,071,407 |
| | සුළු ආදායම් ණයගැතියන් | 2,588,530 | 2,588,530 |
| | ජ.න.ව.ස.ම | 1,668,269 | 1,668,269 |
| | නිෂ්පාදනය සඳහා ණයගැතියන් | 726,644 | 726,644 |
| | අඩුවීම්: පැල තවාන් සම්බන්ධයෙන් හඳුනානොගත් ශේෂයන් සඳහා | (10,524,054) | (10,524,054) |
| | අඩුවීම් : වතු ණයගැතියන්ගේ විශේෂ අපහායනයන් | (47,537,070) | (47,537,070) |
| | අඩුවීම් : බොල් ණය සඳහා ප්‍රතිපාදන | (1,591,349) | (1,591,349) |
| | අන්තර් වැවිලි ජංගම ගිණුම් | - | - |
| | වෙනත් ණයගැතියන් - ජංගම ගිණුම් ශේෂයන් | 167,367,998 | 156,615,421 |
| | | **192,160,912** | **180,182,185** |

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

### මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| | | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|
| 13 | **මුදල් හා ඒ හා සමාන දෑ** | | |
| (අ). | **ධන ශේෂයන් :** | රු. | රු. |
| | අතැති හා බැංකුවේ ඇති මුදල් | | |
| | - ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය වැවිලි සමාගම් | 3,125,608 | 105,048,534 |
| | - සියලු වතුයායන් | 1,963,235 | 4,489,398 |
| | | **5,088,843** | **109,537,932** |
| (ආ). | **ඍණ ශේෂයන්** | | |
| | - මහජන බැංකු ජංගම ගිණුම් | **(135,391,976)** | **(147,576,144)** |
| | | | |
| | **වසර අවසානයේදී මුදල් හා ඒ සමාන දෑ** | **(130,302,233)** | **(38,038,213)** |

(ඇ). රු.මි. 130 ක ස්ථිරා අයිරා පහසුකම් මහජන බැංකුව වෙතින් ලබාගන්නා ලද අතර පහත වත්කම් සම්බන්ධයෙන් එම පහසුකම සුරක්ෂිත කර ඇත. ** (යෝජනා වී නොමැති) ගොඩනැඟිල්ලේ වටිනාකම 2023 අගෝස්තු 02 වැනි දින මහජන බැංකුව විසින් පවරන ලද වරලත් තක්සේරු මිනින්දෝරුවරයා විසින් කරන ලද තක්සේරුව මත පදනම් වේ.

**දැනට පවතින ස්ථිර දැනට පවතින ස්ථිර අයිරා පහසුකම් ව්‍යුහය (POD)**

| **ස්ථිර අයිරා සඳහා සුරකුම්** | **සුරකුම් අගය රු.** | **POD අගය රු.** |
|---|---|---|
| ශ්‍රී.ලං.රා.වැ.ස අයත් දෙමටගොඩ ගොඩනැඟිල්ල ** | | 50,000,000 |
| ශ්‍රී.ලං.රා.වැ.ස අයත් දෙමටගොඩ ගොඩනැඟිල්ල ** | 614,000,000 | 50,000,000 |
| ශ්‍රී.ලං.රා.වැ.ස අයත් දෙමටගොඩ ගොඩනැඟිල්ල ** | | 30,000,000 |
| **එකතුව** | | **130,000,000** |

| | | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|
| 14 | **දායක ප්‍රාග්ධනය** | | |
| | | රු. | රු. |
| | රාජ්‍ය දායකත්වය(ප්‍රදාන) | 3,519,802,947.00 | 3,455,902,947 |
| | ඉඩම් සඳහා රාජ්‍ය දායකත්වය | 2,616,589,903 | 2,616,589,903 |
| | | **6,136,392,850** | **6,072,492,850** |

රජයේ සම්පූර්ණ දායකත්වය සමන්විත වන්නේ රජයෙන් (භාණ්ඩාගාරයෙන්) ලැබුණු ප්‍රදානයන් සහ ගැසට් නිවේදන මගින් රජය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හිමිකර දී ඇති/පවරන ලද ඉඩම්වලිනි. සමාලෝචිත වර්ෂය තුළදී හිඟ ව්‍යවස්ථාපිත හිඟ ගෙවීම් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත රු.මි. 63.90 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇත.

| 15 | **සේවක ප්‍රතිලාභ වගකීම්** | ප්‍රධාන කාර්යාලය 2023 | වතුයායන් 2023 | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|---|---|
| | | | | රු. | රු. |
| | ආරම්භක ශේෂය- වතුයායන් | - | 618,432,647 | 618,432,647 | 585,625,960 |
| | ප්‍රධාන කාර්යාලය | 25,489,691 | - | 25,489,691 | 24,515,057 |
| | පාරිතෝෂික අත්හිටුවීම් (2012 ශේෂ) | - | - | - | 85,257,147 |
| | ඌණ /(අතිරික්ත) පාරිතෝෂික වෙන්කිරීම් | 777,458 | 1,887,622 | 2,665,080 | 7,080,643 |
| | වසර සඳහා ප්‍රතිපාදන | 1,330,301 | 30,949,671 | 32,279,972 | 35,498,178 |
| | ගෙවිය යුතු පාරිතෝෂික වෙත මාරු කිරීම් | (2,921,628) | (90,997,889) | (93,919,517) | (94,262,337) |
| | වෙනත් ගනුදෙනු/මාරුකිරීම් | 427,433 | (1,194,108) | (766,675) | 208,970 |
| | | | | | |
| | **2023.12.31 දිනට මුළු සේවක ප්‍රතිලාභ වගකීම්** | **25,103,255** | **559,077,942** | **584,181,197** | **643,923,619** |

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්**

| | | | |
|---|---|---|---|
| **16** | **වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ** | **2023.12.31 දිනට** | **2022.12.31 දිනට** |
| | | රු. | රු. |
| | ප්‍රධාන කාර්යාලය (අ) | 442,622,983 | 348,855,720 |
| | වතුයායන් (ආ) | 1,714,254,373 | 1,600,879,129 |
| | | **2,156,877,356** | **1,949,734,850** |
| | | | |
| **a).** | **ප්‍රධාන කාර්යාලයේ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ අතරට පහත දෑ ඇතුළත් වේ** | **2023.12.31 දිනට** | **2022.12.31 දිනට** |
| | පර්ත් වතුයාය | 6,610,411 | 6,610,411 |
| | ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජ.න.ව.ස.ම) | 97,709,342 | 97,709,342 |
| | අත්තිකාරම් ලැබීම්- නිමි තේ තැරැව්කරුවන් | 48,316,765 | 247,000 |
| | අත්තිකාරම් ලැබීම්- තේ දළු මිලදීගන්නන් | 1,449,988 | 369,340 |
| | අත්තිකාරම් ගෙවීම් - ටෙන්ඩර් පාරිභෝගිකයින් | 1,139,492 | - |
| | සංස්ථා තේ වෙළඳ නියොජිතයෝ වැඩිපුර ගෙවීම් | 6,872 | - |
| | රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව | 28,709,029 | 28,709,029 |
| | පොහොර සංස්ථාව | 35,931,679 | 35,931,679 |
| | හලාවත වැවිලි සමාගම | 41,210,959 | 39,610,959 |
| | ණය - ලංකා බණිජ වැලි | 25,000,000 | 25,000,000 |
| | උපචිත වියදම් | 23,306,903 | 19,277,659 |
| | ගෙවිය යුතු EPF | 22,926,897 | 20,101,188 |
| | ගෙවිය යුතු ESPS | 11,692,077 | 8,965,776 |
| | ගෙවිය යුතු CPPS | 18,135,315 | 14,445,397 |
| | ගෙවිය යුතු E.T.F | 293,615 | 175,062 |
| | ආපසු ගෙවනු ලබන තැන්පතු | 41,402,978 | 38,654,512 |
| | ගෙවිය යුතු පාරිතෝෂික | 3,253,946 | 1,627,943 |
| | ශ්‍රී ලංකා තේ මණ්ඩලය-පොහොර | 6,666,672 | - |
| | ගෙවිය යුතු පොළිය – ම.බැ ණය මි.100 | 20,054,428 | 6,537,285 |
| | වෙනත් ගෙවිය යුතු දෑ | 8,805,616 | 4,883,139 |
| | **එකතුව** | **442,622,983** | **348,855,720** |
| | | | |
| **ආ).** | **වතුයායන් වල වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ අතරට පහත දෑ ඇතුළත් වේ** | **2023.12.31 දිනට** | **2022.12.31 දිනට** |
| | ණය හිමියන් | 6,838,664 | 5,952,080 |
| | නිවාඩුදින ගෙවීම් වෙන්කිරීම් | 993,725 | 1,500,749 |
| | නිවාඩුදින ගෙවීම් | 20,773,747 | 24,014,560 |
| | ඇල්කඩුව වතුයාය | 172,137 | 172,137 |
| | වෙනත් වගකීම් | 102,183,652 | 57,431,311 |
| | වෘත්තීය සමිති | 9,557,646 | 8,714,745 |
| | කාර්ය මණ්ඩලයට සහ කම්කරුවන්ට ගෙවිය යුතු මුදල් | 34,188,575 | 50,066,403 |
| | විගණන ගාස්තු සහ රක්ෂණ සඳහා ප්‍රතිපාදන | 7,700,651 | 8,182,158 |
| | ගෙවිය යුතු E. P. F | 666,314,285 | 617,378,035 |
| | ගෙවිය යුතු E.S.P.S | 61,620,943 | 44,089,555 |
| | ගෙවිය යුතු C.P.P.S. | 24,954 | 24,954 |
| | ගෙවිය යුතු E.T.F. | 49,438,814 | 45,837,829 |
| | ගෙවිය යුතු පාරිතෝෂික | 625,998,758 | 550,685,803 |
| | උපචිත වියදම් | 13,920,970 | 80,865,163 |
| | පැමිණීමේ ප්‍රසාද දීමනා වෙන්කිරීම් | 1,009,067 | 1,192,301 |
| | ගෙවිය යුතු E.P.F අධිභාර | 78,378,572 | 77,726,161 |
| | ගෙවිය යුතු E.T.F අධිභාර | 9,295,631 | 6,427,665 |
| | ගෙවිය යුතු පාරිතෝෂික අධිභාර | 25,843,582 | 20,617,519 |
| | **එකතුව** | **1,714,254,373** | **1,600,879,129** |
| | | | |
| **16.1** | **බැංකු ණය - (මහජන බැංකුව)** | **79,310,000** | **100,000,000** |

2020 අප්‍රේල් මාසයේදී අපගේ මුදල් ප්‍රවාහ හිඟය පියවා ගැනීම සඳහා 2020 අප්‍රේල් 09 වන දින මහජන බැංකුවෙන් ඉහත සඳහන් පරිදි ණය පහසුකම් ලබා ගෙන ඇත්තෙමු. මාස හයක ගෙවීම් කාලසීමාවක් සහ අර්පණ ලිපිය අනුව එකඟ වූ පොලී අනුපාතය AWPLR +2.5 ක් වන මෙම ණය මුදල මහා භාණ්ඩාගාරය විසින් සහතික කරන ලද්දකි. කෙසේවුවද, පසුගිය වසරවලදී අප මුහුණ දුන් දැඩි මුදල් ප්‍රවාහ තත්වය හේතුවෙන්, මිලියන 20.69 ක මුදලක් පමණක් ගෙවීමට හැකි වූ අතර ගෙවිය යුතු පොළිය පමණක් ගෙවමින් සහන කාලය වසරින් වසර දීර්ඝ කරගන්නා ලදි.

වර්තමානයේදී අපි මෙම බැංකු ණය මුදල, හිඟ පොලීද සමඟින් වසර පහක ආපසු ගෙවීමේ කාලයක් සහිත දිගු කාලීන ණය පහසුකමක් බවට පත් කිරීමට කටයුතු කරමින් සිටිමු. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, භාණ්ඩාගාර අනුමැතිය සහ ඇපකරය ද අප විසින් ලබාගෙන ඇති අතර, ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

| | | | |
|---|---|---|---|
| **17** | **ආදායම** | **2023.12.31 දිනට** | **2022.12.31 දිනට** |
| | | රු. | රු. |
| | තේ | 530,705,781 | 347,708,177 |
| | අමු තේ දළු | 462,446,492 | 710,242,379 |
| | සුළු බෝග | 18,048,754 | 4,220,199 |
| | **මුළු ආදායම** | **1,012,615,844** | **1,070,663,514** |

තේ අළෙවි ආදායම තුල කොළඹ තේ වෙන්දේසියේදී නිමි තේ අලවි කිරිමෙන් ලැබෙන ආදායම, සංස්ථා තේ විකුණුම් ආදායම සහ ටෙන්ඩර් මඟින් කසළ තේ විකිණීමෙන් ලබන ආදායමත් ඇතුළත් වේ.

| | | | |
|---|---|---|---|
| **18** | **වෙනත් ආදායම්** | **2023.12.31 දිනට** | **2022.12.31 දිනට** |
| | | රු. | රු. |
| | ගස් ටෙන්ඩර් | 86,053,385 | 96,106,317 |
| | බදු කුලී ආදායම | 18,189,536 | 19,382,258 |
| | කළමනාකරණ ගාස්තු | 10,612,085 | 14,790,199 |
| | මූල්‍ය ආදායම | 1,014,565 | 1,974,535 |
| | හුන්නස්ගිරි දිය ඇල්ලෙන් ලැබෙන ආදායම | 1,369,773 | 180,946 |
| | තවාන් පැළ-විකුණුම් ආදායම | 1,289,152 | 788,439 |
| | ප්‍රවේශපත් ආදායම | 2,205,250 | 2,475,050 |
| | වෙනත් ආදායම්- වතුයායන් හා ප්‍රධාන කාර්යාලය | 11,955,071 | 23,141,784 |
| | සංචාරක බංගලා ආදායම | 399,900 | 521,800 |
| | **වෙනත් ආදායම්හි එකතුව** | **135,743,884** | **159,953,995** |

| | | | |
|---|---|---|---|
| **19** | **පරිපාලන වියදම්** | **2023.12.31 දිනට** | **2022.12.31 දිනට** |
| | | රු. | රු. |
| | පුද්ගල පිරිවැය | 49,200,419 | 45,758,326 |
| | නියත දායකත්වයන් - EPF, CPPS & ESPS (ප්‍රධාන කාර්යාලය) | 4,852,131 | 4,785,954 |
| | නියත දායකත්වය – ETF (ප්‍රධාන කාර්යාලය) | 1,202,980 | 1,155,700 |
| | ක්ෂයවීම් ( ප්‍රධාන කාර්යාලය) | 1,697,455 | 980,000 |
| | පාරිතෝෂික වියදම් (ප්‍රධාන කාර්යාලය) | 1,330,301 | 1,408,962 |
| | වෙනත් පරිපාලන හා විකිණුම් වියදම් - ප්‍රධාන කාර්යාලය | 65,819,110 | 75,443,521 |
| | පාරිතෝෂික වියදම් ( වතුයායන්) | 30,949,671 | 34,089,216 |
| | වෙනත් පරිපාලන වියදම් - වතුයායන් | 63,104,361 | 61,248,356 |
| | **මුළු පරිපාලන වියදම්** | **218,156,428** | **224,870,036** |

| | | | |
|---|---|---|---|
| **20** | **මූල්‍ය වියදම්** | **2023.12.31 දිනට** | **2022.12.31 දිනට** |
| | | රු. | රු. |
| | මුදල් ප්‍රවාහනය මත කොමිස් | 6,808,618 | 6,360,240 |
| | තේ බ්‍රෝකර්වරුන්ගෙන්ලබා ගත් අත්තිකාරම් මත පොලී | 8,050,274 | 1,929,105 |
| | බැංකු ගාස්තු | 1,258,547 | 1,127,602 |
| | බැංකු අයිරා පොළී | 36,729,279 | 24,230,270 |
| | බැංකු ණය පොළී - (මහජන බැංකුව) | 18,601,853 | 15,842,442 |
| | වෙනත් ණය පොළී - හලාවත වැවිලි සමාගම | 1,600,000 | 1,600,000 |
| | **මුළු මූල්‍යමය වියදම්** | **73,048,571** | **51,089,659** |

**21 ආදායම් බදු**

ශ්‍රී.ලං.රා.වැ.ස හි පසුගිය වාර්ෂික ගිණුම්වල ආදායම් බදු ගණනය කිරීම් දක්නට නොලැබේ. මේ හේතුව නිසා සහ අඛණ්ඩව අලාභ ලැබීම නිසා අනාගතයේදී බදු ගෙවිය යුතු ලාභ නොපවතිනු ඇතැයි ද ආදායම් බදු ගෙවීමට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සිදු නොවනු ඇතයිද උපකල්පනය කරනු ලැබේ. පසුගිය වසර විසි හත තුළ (1995 සිට 2021 දක්වා) ශ්‍රී.ලං.රා.වැ.ස ලාභ ලබා ඇත්තේ වසර හතරක් සඳහා පමණි.(කෙසේවුවද, වර්තමානයේදී, අප විසින් ඉදිරිපත් තළ යුතු පෙර වර්ෂ වලට අදාල ආදායම් බදු වාර්තා ඉදිරිපත් කිරීමටත් ඉදිරි වසර වලට අදාළ ආදායම් බදු වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින්නෙමු.). දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟින් සාකච්ඡා පවත්වන ලද අතර ආදායම් බදු වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි ප්‍රගතියක් ලබමින් සිටිමු.

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

### මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

### 22 සබඳතා පාර්ශ්ව ගනුදෙනු

**රජය සහ රාජ්‍ය පාලිත ආයතන සමඟ ගනුදෙනු**

සාමාන්‍ය ක්‍රියාකාරිත්වයේ දී, සංස්ථාව සබඳතා පාර්ශ්වයන් සමඟ ගනුදෙනුවලට එළඹේ. ආශ්‍රිත පාර්ශ්වයන් අතරට; ශ්‍රී ලංකා රජය (සංස්ථාවේ අවසාන හිමිකරු ලෙස ), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය පාලිත ආයතන ඇතුළත් වේ. තනි තනි වශයෙන් වැදගත් වන සහ සාමූහිකව ගත් කලෙක මිස තනිව ගත්කළ වැදගත් නොවන රාජ්‍ය සහ රාජ්‍ය පාලිත ආයතන සමඟ සංස්ථාව විසින් සිදු කරන ලද ගනුදෙනු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| **හිඟ ශේෂයන්** | | |
| **ගෙවිය යුත්තේ** | | |
| රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව | 28,709,029 | 28,709,029 |
| පොහොර සංස්ථාව | 35,931,679 | 35,931,679 |
| හලාවත වැවිලි සමාගම | 41,210,959 | 39,610,959 |
| ලංකා බණිජවැලි සමාගම | 25,000,000 | 25,000,000 |
| ඇල්කඩුව වැවිලි සමාගම | 172,137 | 172,137 |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජ.න.ව.ස.ම) | 97,709,342 | 97,709,342 |
| පර්ත් වතුයාය | 6,610,411 | 6,610,411 |
| | **235,343,557** | **233,743,557** |
| **ලැබිය යුතු වන්නේ** | | |
| ඇල්කඩුව වැවිලි සමාගම | 1,916,092 | 1,916,092 |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජ.න.ව.ස.ම) | 41,071,407 | 41,071,407 |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජ.න.ව.ස.ම) | 1,668,269 | 1,668,269 |
| | **44,655,768** | **44,655,768** |

### 23 බැඳීම් හා අවිනිශ්චිතතාවයන්

දිගු කාලයක් තිස්සේ ව්‍යවස්ථාපිත වගකීම් (EPF, ETF සහ පාරිතෝෂික) නොපියවීම සම්බන්ධයෙන් ශේෂ පත්‍ර දිනය වන විට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකාරිත්වයට එරෙහිව පන්විල, තෙල්දෙණිය සහ මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු කටයුතු 784 ක් ගොනුකර ඇත.2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළ නඩු 163 ක් සම්පූර්ණයෙන් සමථයකට පත් කිරීමෙන් පසු 2023 දෙසැම්බර් 31 වන විට මුළු නඩු 784 ක් විභාග වෙමින් පැවතුණි. තවද, 2023 වර්ෂය තුළ සංස්ථාවට එරෙහිව නව නඩු 95ක් පවරා ඇත.සංස්ථාවේ නීතිඥයින් විසින් ඒම නඩු කටයුතු සංස්ථාවට වාසිදායක ලෙස සිදුවීමට යම් හැකියාවක් ඇතත් ඒසේ සිදුවීමට ඇත්තේ ඉතා සුළු සම්භාවිතාවක් බව දැනුවත් කර ඇත.ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශනවලින් කිසිදු අවිනිශ්චිත වගකීමක් සඳහා ප්‍රතිපාදන සපයා නොමැත.

පෙර වසරවලදී මෙන්ම, 2023 වර්ෂයේදී ද සංස්ථාව විසින් සෑම සතියකම විභාගයට ගැනෙන දිගුකාලයක සිට පැවත එන හිඟ සේවක ව්‍යවස්ථාපිත ගෙවීම්වලට අදාළ නඩු කටයුතු සඳහා අඛණ්ඩව ගෙවීම් සිදු කරන ලදී. 2020 වසරේ සිට 2023 වසරේ සැප්තැම්බර් දක්වා කාලය තුළ සංස්ථාව මහා භාණ්ඩාගාරයෙන් කිසිදු මූල්‍ය ආධාරයක් ලබා නොගෙන මෙම නඩු සඳහා රුපියල් මිලියන 281.04ක් තම අරමුදල්වලින් ගෙවීම් කටයුතු සිදුකර ලදි. කෙසේවුවද, 2023 සැප්තැම්බර් මාසයේ සිට සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් කටයුතු සඳහා හෝ ඊට අදාළ නඩු සමථ කරගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මාසිකව රුපියල් මිලියන 21.3 ක් සංස්ථාව වෙත ගෙවන අතර ඒ අනුව සංස්ථාව වෙත 2023 සැප්තැම්බර් - දෙසැම්බර් කාලසීමාව තුළ මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 63.9 ක් ලැබී ඇත. ප්‍රධාන වශයෙන් නඩු කටයුතු සඳහා විශාල මුදල් ප්‍රවාහයක් පිටතට ගලා යෑම සහ 2021 මාර්තු මස සිට කම්කරු වැටුප රු.1000 (34.5% කින්) ඉහළ යාම නිසා වාර්ෂිකව රු.මි 150.0 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවූ හෙයින් මෙම කාලසීමාව සඳහා අප විසින් මාසික ව්‍යවස්ථාපිත වගකීම් ගෙවා නොමැත. මෙම කාලය තුළදී මාස හතරක් සඳහා පමණක් අප විසින් ව්‍යවස්ථාපිත වගකීම් ගෙවනු ලබා ඇත.

### 24 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති සියලුම වැදගත් සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ හෙළිදරව් කිරීම් සිදු කර ඇත

### 25 පෙර වර්ෂයේ ගැළපීම්

පෙර වර්ෂයේ ගැලපීම්වලට පූර්ව මූල්‍ය වර්ෂවලට අදාළ පහත ගනුදෙනු ඇතුළත් වන අතර වතුයායන් සහ ප්‍රධාන කාර්යාලය විසින් මෙම වර්ෂය තුළ මෙම ගැලපීම් සිදු කරන ලදී.

| විස්තර | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| ගෙවියයුතු පාරිතෝෂික / ප්‍රතිපාදන (අඩු/වැඩි ප්‍රතිපාදන) | 6,022,343 | 12,036,972 |
| පාරිතෝෂික අධිභාර | 227,010 | 12,884,415 |
| සේ.අ.අ අධිභාර | 3,854,975 | 21,415,537 |
| සේ.භා.අ. අධිභාර | 521,454 | 3,472,407 |
| අඩමාන ණයගැතියන් සඳහා වෙන්කිරීම්- අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි | - | 116,036,749 |
| අඩු/වැඩි වශයෙන් දක්වා ඇති ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් | (141,578) | 969,966 |
| හිමිකම් නොපෑ ණය හිමි ශේෂ සඳහා ගැළපීම් | - | (21,797,337) |
| වෙනත් වියදම්/ගැලපීම් | (7,069,652) | 6,610,147 |
| **ඒකතුව** | **3,414,552** | **151,628,855** |

### 26 විලම්භිත වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.4.3 ට අනුව විලම්භිත වත්කම් 10% කින් ක්‍රමක්ෂය කරන ලද අතර ලාභ හා අලාභ ගිණුමේ සාමාන්‍ය ගාස්තු -මාර්ග යටතේ වියදම් ලෙස හර කරගන්නා ලදී.

# විගණන වාර්තාව 2023



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | පීඑල්/ජී/එස්එල්එස්පීසී/01/2023/14 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024 ජූලි 24 දින |

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1958 අංක 04 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 14 වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துாவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13 හි 27 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් සාධාරණ අගයකට ගිණුම්ගත කළ යුතු වුවත් සංස්ථාව සතු වතු 16න් වතු 15කට අයත් හෙක්ටයාර් 10,918ක් වූ ඉඩම වටිනාකම ගණනය කර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම සිදුකළ යුතු වුවත්, සංස්ථාව විසින් රු. 584,181,197ක සේවක ප්‍රතිලාභ ගණනයේදී ආයුගණන ක්‍රමය භාවිතා කර නොතිබූ බැවින් එම අගය අධි හෝ ඌණ ගණනය විය හැකිය.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 හා 30 ඡේද වලට පටහැනිව සංස්ථාවේ වතු 14 ක් පුරා විහිදුනු දැව අස්වනු නෙළිය හැකි ගස් 104,691 ක් නිසි තක්සේරු කිරීමකින් තොරව හෝ සාධාරණ වටිනාකමට අගය කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 3,361,498,115 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඈ) රු.9,991,415 වටිනා රබර්,ගම්මිරිස් සහ කෝපි යනාදි ජීව විද්‍යාත්මක වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 45 ඡේදය ප්‍රකාරව මේරූ සහ නොමේරූ ලෙස වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ගස් විකිණීමෙන් ලැබූ රු. 86,053,385 ක ආදායමින් එම ගස්වල පිරිවැය හඳුනාගෙන ගිණුම් වලට නොගැලපීම නිසා පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් හා ආදායම් අධිගණනය වී තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන්හි දේපළ පිරියත හා උපකරණ වර්ග 06ක පිරිවැය රු. 499,386,228 ක් වුවද ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛනය අනුව එහි අගය රු. 375,367,990 ක් වූයෙන් රු. 124,018,238 ක වෙනසක් නිරීක්ෂණය විය. සංස්ථාව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් ද නඩත්තු කර නොතිබුණි.

(උ) සංස්ථාව සතු මුළු වතුයායන්හි භූමි ප්‍රමාණය හෙක්ටයාර් 147,559 ක් වූ අතර වෙනත් ආයතන සඳහා නිදහස් කළ සහ සංස්ථාවේ පාලනයේ පවතින ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 141,900ක් පමණක් වූයෙන් ඉඩම් හෙක්ටයාර් 5,659ක් සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූ බැවින් එම ඉඩම්වල පැවැත්ම විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ඌ) සංස්ථාවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගෙවියයුතු ණයපොලී ශේෂයෙහි වෙනස්වීම වූ රු. 13,517,143 දෙවතාවක් ගලපා තිබුණි.

(එ) 2022 හා 2023 වර්ෂ අවසානයට ජංගම නොවන වගකීම් යටතේ පැවති රු. 59,742,422 ක පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුම් අතර වෙනස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ගලපා තිබුණි.

(ඒ) වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ තුළ රු. 23,230,823ක පැල තවාන් ශේෂයක් ඇතුළත් කර තිබුණද භෞතික සත්‍යාපනය අනුව පැල තවාන් වටිනාකම රු. 15,951,139ක් වූයෙන් පැළ තවාන් තොගය රු. 7,279,684කින් අධිගණනය වී තිබුණි.

(ඔ) ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාලය සහ වතුයායන් අතර සිදුවන ගනුදෙනු සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුල එකිනෙකට හිලව් නොවූ රු. 167,367,998 ක ශේෂය ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබූ බැවින් එම වටිනාකමින් ජංගම වත්කම් අධිගණනය වී තිබුණි. එසේම මෙම ශේෂය තුල වර්ෂ පහකට වැඩි රු. 4,872,435,761ක හර ශේෂයන් හා රු. 1,906,242,471ක බැර ශේෂයන්ද ඇතුළත්ව තිබුණි.

(ඕ) වතුයායන්වල දේපල පිරියත හා උපකරණවල එකතු කළ අගය රු. 56,943,420 ක් වුවද ඉන් රු. 14,806,302 වටිනා දේපල පිරියත හා උපකරණවලට අදාල වවුචර්, ඉන්වොයිස් සහ අනෙකුත් ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එහි නිරවද්‍යතාවය හා ඊට අදාල ක්ෂය වටිනාකම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය

ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වූවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1.** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.3 (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2.** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 සහ 16 වන වගන්ති හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ II කොටසේ 16(i) සහ 27 වගන්ති | 2000 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු. 689,241,182 ක සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල්, රු. 49,732,429 ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් සහ ඊට අමතරව වතු කාර්යමණ්ඩල අර්ථසාධක අරමුදල සඳහා රු. 73,313,020 ක්ද ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය වෙත රු.18,160,269ක මුදලක්ද සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ගෙවිය යුතු වතු අංශයේ අධිභාර වටිනාකම පිළිවෙලින් රු. 78,378,572 ක් හා රු. 9,295,631 ක් විය. |
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 02 වන කොටසේ 5(1) වගන්තිය | සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් වූ දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත් සංස්ථාව විසින් පසුගිය වර්ෂ සහ සමාලෝචිත වර්ෂයද ඇතුළුව 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම රු. 629,252,704 ක්ද අධිභාර රු. 25,843,582 ක්ද ගෙවිය යුතුව තිබුණි. ඉහත අරමුදල් නොගෙවීම නිසා ඒ සම්බන්ධ නඩු වෙනුවෙන් 2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා රු. 1,933,000 ක නීතිඥ ගාස්තු ගෙවීමටද සංස්ථාවට සිදුවී තිබුණි. |
| (ඇ) | 2017 අංක 24 දරන දේශිය ආදායම් බදු (සංශෝධිත ) පනතේ 90 වගන්තිය හා 93 වගන්තිය | සංස්ථාව විසින් 2023 වර්ෂයේ ස්වයං තක්සේරු පදනම මත අදාල ආදායම් බදු ගෙවා නොමැති අතර ආදායම් බදු වගකීමද ගණනය කර නොතිබුණි. 2022/2023 තක්සේරු වර්ෂයේ ආදායම් බදු වාර්තාවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාරදී නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර සඳහා මාර්ගෝපදේශයේ 3.2 ඡේදය | බඳවාගැනීම් හා උසස්කිරීමේ කාර්ය පටිපාටිය ප්‍රාථමික තනතුරුවලට හැර 2023 දෙසැම්බර් 31 දින වන විටත් සංස්ථාව අනුමත කරවාගෙන නොතිබුණි. |
| (ඉ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය | සංස්ථාව සතු වාහන 122න් ධාවන තත්ත්වයේ නොපවතින වාහන 75 ක් පැවති අතර මින් අලුත්වැඩියා කර භාවිතයට ගතනොහැකි වාහන 57ක් තිබුණද එම වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුනු අතර  අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන18 ද අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදය | සංස්ථාව විසින් 2023 වර්ෂයට අදාළ උපායමාර්ගික සැලැස්ම සකස්කර නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මද වගා ක්ෂේත්‍රයට අදාළව පමණක් සකස් කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

වර්තමානය වන විට සංස්ථාවේ තේ කර්මාන්තශාලා 09 ක් පැවතියද ඉන් කර්මාන්තශාලා 03 ක පමණක් නිෂ්පාදන කටයුතු සිදුකරමින් පැවති අතර  කර්මාන්තශාලා 05 ක් දීර්ඝ කාලයක සිට වසා දමාද එක් තේ කර්මාන්තශාලාවක් 2022 ඔක්තෝබර් සිට නඩත්තු කටයුතු වෙනුවෙන් වසා දමාද තිබුණි. එසේම භාවිතයට නොගන්නා ගෝමර වතු යායේ නකල්ස් බංගලාව නැරඹුම් ස්ථාන කිහිපයකට මැදිව තිබුණද එම බංගලාව අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට සංස්ථාව කටයුතුකර නොතිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) සංස්ථාව සතු වතු 280ක් ප්‍රාදේශීය වතු සමාගම් 20 කට අවුරුදු 53 ක දිගුකාලීන බදු පදනමට පවරා දී තිබූ අතර මූල්‍ය ප්‍රකාශන වල එය රු. 1,611,520,641 ක ආයෝජිත දේපළ ලෙස පෙන්නුම් කලද එම ආයෝජිත වත්කම්වලින් ලැබෙන වාර්ෂික ආදායම ගිවිසුම් අනුව මහා භාණ්ඩාගාරය වෙත යවන බැවින් සංස්ථාවට ආදායම අහිමි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ වෙළඳ හා අනිකුත් ගෙවිය යුතු ශේෂයවූ රු. 442,622,983 තුළ වසර 10 ඉක්මවූ රාජ්‍ය ආයතන 05ක් වෙත ගෙවිය යුතු රු. 228,561,009ක ණය ශේෂයන් නිරවුල් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 309,421,777ක වෙළඳ හා අනිකුත් ලැබිය යුතු ශේෂය තුළ වර්ෂ 04 ඉක්මවූ ශේෂය රු. 63,448,037ක් විය.

(ඇ) 2023 වර්ෂයේදී සංස්ථාවට අයත් සියලුම වතුයායන්වල තේ අස්වැන්න 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 07 සිට සියයට 41 දක්වා පරාසයකින් අඩුවී තිබුණු අතර 2023 වර්ෂයේ රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුළු තේ අස්වැන්න කිලෝග්‍රෑම් 5,089,282 ක් වූ අතර එය 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 24 කින් පමණ පහළ යාමකි. එසේම 2023 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් 9,170,548ක අස්වැන්නක් ලබාගැනීමට ඇස්තමේන්තු කර තිබුණද සියයට 55ක ඉලක්කයක් පමණක් ළඟාකරගෙන තිබුණි. බාහිර වැවිලිකරුවන් වෙත ලබාදී තිබූ භූමි ප්‍රමාණයෙන් තේ කිලෝග්‍රෑම් 940,151ක අස්වැන්නක් අපේක්ෂා කර තිබුණද සත්‍ය වශයෙන් ලබාගෙන තිබුණේ තේ කිලෝග්‍රෑම් 364,597 ක් පමණි. එය අපේක්ෂිත තේ අස්වැන්න හා සැසඳීමේදී සියයට 61ක අඩුවීමකි. සංස්ථාව සතු වතුයායන් 14න් වතු 13ක 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී තේ කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය සියයට 03 සිට සියයට 444 දක්වා ඉහල ගොස් තිබුණි.

(ඉ) සංස්ථාව සතු වතුයායන් 16න් 8ක්ම සමාලෝචිත වර්ෂයේදී අලාභ තත්ත්වයේ පැවති අතර ගෝමර හා කැලෑබොක්ක වතුයායන් 2022 වර්ෂයේ පිළිවෙලින් රු. 8,974,150ක හා රු. 31,396,561ක ලාභ ලැබුවද 2023 වර්ෂයේදී රු. 46,723,873ක හා රු. 16,805,293ක අලාභ ලබා තිබුණි. සංස්ථාවේ සේවක පිරිවැය මුළු පිරිවැය හා සැසඳීමේදී සියයට 50කට වැඩි අගයක් ගෙන තිබුණු අතර හෙයාපාර්ක් වතුයායේ සේවක පිරිවැය එහි මුළු පිරිවැයෙන් සියයට 98 ක්ද එහි විකුණුම් පිරිවැයට සාපේක්ෂව සියයට 112 ක් ගෙන තිබුණි. හුන්නස්ගිරිය, රංගල, භාගල හා වුඩ්සයිඩ් යන වතු යායන්හි සේවක පිරිවැය එම වතුයායන්වල මුළු පිරිවැයෙන් සියයට 80 කට වැඩි මට්ටමක පැවතීම වතුයායන්වල අලාභයට සෘජුවම බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) සංස්ථාව සතු වතුයායන් මැනුම් කටයුතු සිදුකිරීමේදී වතුයායන් 04 ක ගැසට් මඟින් ලද ඉඩම් ප්‍රමාණයට වඩා හෙක්ටයාර් 790 ක් අඩුවෙන්ද එක් වතුයායක හෙක්ටයාර් 3.19ක් වැඩියෙන්ද තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

**<u>ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ *2023* දෙසැම්බර් *31* දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ *2018* අංක *19* දරන ජාතික විගණන පනතේ *12* වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ අතුලත් කරුණු සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පිළිතුරු.</u>**

(1) මූල්‍ය ප්‍රකාශන

**1.2 අඛණ්ඩ පැවැත්ම**

කෙටුම්පත් විගණන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි 2023.12.31 සංස්ථාවේ කාරක ප්‍රාග්ධනය රු.මි.1970.85ක ඍණ අගයක් වාර්තා කර ඇති අතර එදිනට ගෙවිය යුතු සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් වල අගය රු.මි.1459.7 ක් විය. මෙලෙස දීර්ඝ කාලයක පටන් සංස්ථාව තුළ අයහපත් මූල්‍ය තත්වයක් ඇතිවීමට මූලික වශයෙන් හේතු වී ඇත්තේ,

- අපගේ වතුයායන් වල තේ දළු අස්වැන්න ප්‍රශස්ත මට්ටමක නොමැතිවීම. මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් කලට වෙලාවට වතුයායන් වලට පොහොර/ වල්නාශක යෙදීමට නොහැකිවීම දළු අස්වැන්න අඩුවීමට ප්‍රධාන ලෙස බලපා ඇත. තවද පසුගිය වසරවල පැවති අයහපත් කාලගුණික තත්වයන්ද දළු අස්වැන්න අඩු වීම කෙරෙහි බලපා ඇත.

• නිෂ්පාදන පිරිවැය ඉහල යාම
2021 වසරේදී වතු සේවක වැටුප් 30% කට වැඩි ප්‍රතිශතයකින් ඉහළ යාම, පොහොර, වල් නාශක ආදියෙහි මිල ඉතා විශාල ලෙස වැඩිවීම වැනි කරුණු නිසා අපගේ තේ නිෂ්පාදන පිරිවැය විශාල වශයෙන් ඉහළ ගොස් ඇත.
ඉහළ යන නිෂ්පාදන පිරිවැය පියවාගැනීමට තරම් තේ දළු/ නිමි තේ මිල ඉහළ නොයෑම සහ දළු අස්වැන්නේ වැඩිවීමක් සිදු නොවීම සංස්ථාවේ ලාභදායීත්වය පහත බැසීම කෙරෙහි ඍජු ලෙස බලපා ඇත.

• දැව විකිණීමෙන් ලබන ආදායම අඩුවීම
•
2020 - 2021 කාලය තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වයත්, ඉන් පසුව රටේ ඇතිවූ ආර්ථික අර්බුදයන් හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇතිවූ බිඳවැටීම හේතුවෙන් අපගේ වතුයායන් වල ඇති වානිජමය දැව සඳහා වූ ඉල්ලුම පසුගිය වසර හතරක පමණ කාලය තුල සීග්‍ර ලෙස පහත බැස ඇත. මෙයද අප සංස්ථාවේ ලාභ දායිත්වය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.

• අප සංස්ථාව විසින් කොවිඩ් 19 වසංගතය රට පුරා පැවති 2020 වර්ෂයේ දී සේවක වැටුප් ගෙවීම වැනි මෙහෙයුම් කටයුතු සඳහා මහජන බැංකුවෙන් රු.මි. 100ක ණය මුදලක් ලබාගෙන තිබිණි. සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවන් මෙම ණය මුදල නිසි ආකාරව ගෙවීමට නොහැකිවූ අතර 2023.12.31 දින වන විට ගෙවීමට ඉතිරිව තිබූ ණය මුදල රු.මි. 79.3 ක්ද එදිනට බැංකු අයිරාවේ වටිනාකම රු.මි. 135.39ක්ද විය.
අඩු පොලී මුදලක් ගෙවීම තුලින් සංස්ථාවට ලබාගත හැකි මූල්‍යමය ප්‍රතිලාභය සලකා බලා අප විසින් ඉහත සඳහන් ගෙවිය යුතු ණය මුදල සහ බැංකු අයිරාව මහජන බැංකුව සමග සාකච්ඡා කොට වර්ෂ 5 ක දීර්ඝ කාලින ණය මුදලක් බවට 2024 පෙබරවාරි මාසයේ සිට පරිවර්තනය කර ගන්නා ලදී. මේ වන විට අප විසින් දිගුකාලීන ණය මුදලේ වාරික නිසි ආකාරයට ගෙවනු ලැබේ.

මෙවැනි මූල්‍යමය දුෂ්කරතා මධ්‍යයේ වුවද සංස්ථාව සිය මෙහෙයුම් කටයුතු සිදුකරමින් ඉදිරියට යන අතර දීර්ඝ කාලයකට පසු 2022 වසරේදී මිලියන 19.2 ක ලාභයක් වාර්තා කිරීමට සමත් විය. නිසි කලට අපගේ වතුයායන් වලට පොහොර/ වල් නාශක යෙදවිය හැකිනම් ප්‍රශස්ත තේ දළු අස්වැන්නක් ලබාගැනීම තුලින් සංස්ථාව ලාභදායී ආයතනයක් බවට පත් කිරීමට හැකියාවක් ඇති බව කළමනාකරණයේ විශ්වාසයයි. තවද ආයතනයේ ලාභදායීත්වය ඉහල නැංවීම උදෙසා අපගේ වතුයායන්වල පවතින සම්පත්

වලින් ආදායම් ඉපැයිය හැකි ව්‍යාපෘති මොනවාදැයි හඳුනාගෙන ඒවායෙහි නිරත වීමටද සංස්ථාව බලාපොරොත්තු වේ.

සංස්ථාව මුහුණපා සිටින මූල්‍ය දුෂ්කරතාවයට යම් සහනයක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් සංස්ථාව සතු උඩුවෙල වත්ත නමැති ඉඩමෙන් කොටසක් විකිණීමෙන් මුදල් ලබාගැනීමට බලාපොරොත්තු උවත් මේ වනවිට ජනාධිපති කාර්යාලයේ නියමයන්ට අනුව රාජ්‍ය ආයතන වල ඉඩම බැහැර කිරීමට අදාල කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් අප සංස්ථාවට අපේක්ෂා කළ අන්දමට එම ඉඩම විකිණීමෙන් මුදල් ලබාගෙන වගකීම් වලින් යම් ප්‍රමාණයක් හෝ ගෙවා නිම කිරීමට නොහැකි විය.

තවද කැබිනට් තීරණයකට අනුව සංස්ථාවේ පවතින හිඟ සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීම සඳහා 2023 සැප්තැම්බර් මාසයේ සිට මාසිකව රු.මි. 21.3 බැගින් අප සංස්ථාවට ලැබෙන අතර එම මුදල් භාවිතා කොට සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් වලට අදාළ නඩු වාරික ගෙවීම, අර්ථසාධක අරමුදල් සඳහා හිඟ මාසික දායකත්ව මුදල් ගෙවීම සහ පාරිතෝෂික මුදල් ගෙවීම සිදුකරනු ලැබේ. එසේම මේ වන විට අප සංස්ථාවේ මූල්‍ය ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන රේඛිය අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කොට ඇති අතර රාජ්‍ය වැවිලි සංස්ථාව ඇතුළු රාජ්‍ය ආයතන කිහිපයක හිඟ සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකිරීම සඳහා මුදල් ලබාදීම සඳහා කැබිනට් අනුමැතිය ලබාදී ඇත.

**(1.3) මතය සඳහා පදනම**

(අ ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8හි ඡේද අංක 42 සහ 43 ප්‍රකාරව පෙර වර්ෂවලදී සිදුවූ වැරදි අතිතානුයෝගිව ගැලපීමෙන් පසු එම නිවැරදි කිරීම් වලට අදාළ සංසන්දනාත්මක තොරතුරු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල යුතු බව අප පිළිගනිමු. මෙලෙස මූල්‍ය ප්‍රකාශන තුල පෙර වර්ෂ වලට අදාල සන්සන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කරන ආකාරය පිලිබඳව අප විසින් අධ්‍යනය කිරීමෙන් අනතුරුව 2024 වසරේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය තුල ඉදිරිපත් කරන වැරැදි නිවැරදි කිරීම් වලට අදාළ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවේ.

(ආ) සංස්ථා පාලනයේ පවතින වතු වල මූල්‍යමය වටිනාකම තක්සේරු කිරීම සඳහා මෙතෙක් ක්‍රියා නොකිරීමට හේතුව මෙම වතුයායන් ගැසට් මගින් අප වෙත අයිතිය පැවරී ඇතත් මැණුමකින් තොරව එය සිදුව ඇති නිසාය. කෙසේ නමුත් අපගේ ඉල්ලීම මත ,මේ වන විට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත වතු 6ක කැඩස්තර මැනුමක් සිදු කර ඇත.

අප විසින් මිට පෙර තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් අප පාලනයේ ඇති වතු තක්සේරු කිරීම සඳහා යන මුදල සම්බන්ධයෙන් ඇස්තමේන්තුවක් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ නිර්ණායක වලට අනුකුලව, තක්සේරු වටිනාකම ලබා දීමට මුදල් අය කරන ආකාරය දක්වන සූත්‍රය අප වෙත එවා ඇත.

එකී සූත්‍රයට අනුව දැනට මැණුම් අවසන් කර ඇති වතු වල තක්සේරු වටිනාකම ලබා ගැනීම සඳහා යන දළ වියදම කෝටි 15ක් ක් බව පෙනී ගොස් ඇත. එවැනි විශාල මුදලක් වැය කිරීමට තරම් මූල්‍යමය හැකියාවක් අප සතුව නොමැති බැවින්, සංස්ථාවට අයත් ඉඩම් වල වටිනාකම තක්සේරු කිරීම සිදු කර නැත.

කෙසේ වෙතත් ඉඩමක තක්සේරු වටිනාකම බොහෝ විට වසර 5 සඳහා පමණක් භාවිතා කරන අතර, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අප සංස්ථාව, අවස්ථාණුකුලව ලබා ගන්නා තක්සේරු වාර්තා වසර 05 කට පමණක් ලබාදීම ප්‍රයෝගික තත්වය බව අවධානයට යොමු කරවමු.

එමෙන්ම අප සංස්ථාව සතු යම් ඉඩමක්, බාහිර පාර්ශවයකට විකිණීමේ දී හෝ බදු දීමේ දී තක්සේරු වාර්තාවක් එකී බාහිර පාර්ශවයන්ගේ වියදමින් ලබා ගැනීම සිදු වන ක්‍රියාදාමයේ එක් පියවරකි. තවද, අප වතුයායන් කිහිපයකම ඌන උපයෝජනව පවතින අක්කර 300 ට වැඩි ඉඩම් ප්‍රමාණයන්, නව ප්‍රතිව්‍යුහ ගත කරන වැඩපිළිවෙල යටතේ රජයේ මැදිහත් වීම තුලින් ආයෝජකයින් වෙත බදු දීමේ ක්‍රියාවේ දී , එම වතුයායන් වල ඉඩම් සඳහා වූ වටිනාකම ලබා ගැනීම සිදුවීමට නියමිත කාර්යයකි.

ඉහත පසුබිම තුල අප සතු වතුයායන් පිහිටා ඇති ප්‍රදේශ වල වර්තමාන වෙළඳ වටිනාකම සැලකිල්ලට ගෙන එකී වටිනාකම අප වතුයායන් සඳහාද ආදේශ කර දළ වටිනාකමක් නිර්ණය කිරීම සුදුසු බවට විශ්වාස කරන අතර, එම මුදල සංස්ථාව විසින් නඩත්තු කරන වත්කම් ලේඛනයකට ඇතුලත් කිරීම කල හැකි අතර ඒ සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් බලාපොරොත්තු වෙමු.

එකී දළ ඇස්තමේන්තු වටිනාකම ප්‍රමාණවත් නොවේනම්, දීර්ඝකාලයක සිට පැවත එන මෙම ගැටලුව විසදා ගැනීම සඳහා අවශ්‍ය වන මුල්‍යමය ප්‍රතිපාදන අමාත්‍යාංශ මගින් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට නියමිතය.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක **19** හි **57** වගන්තිය අනුව ආයතනයේ සේවා ප්‍රතිලාභ බැදීම් ගණනයේදී ආයු ගණන ක්‍රමය යොදාගත යුතු වුවද මේ සඳහා ආයු ගණකඥවරයෙකු ගේ**(Actuary)** සේවාව ලබා ගත යුතු වේ. මෙම සේවාව ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇත්තේ ආයතන කිහිපයක් වන අතර ඔවුන්ගේ සේවාව ලබා ගැනීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වර්තමානයේ මුහුණපා ඇති මූල්‍ය අර්බුදය හේතුවෙන් මේ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදනය කරගැනීම අපහසු වී ඇති බැවින් මේ සඳහා ඉදිරියේදී අවශ්‍යය පියවර ගැනීමට බලාපොරොත්තුවේ.

(ඈ) සියළුම වතු වලට අදාලව සකස් කල ගස් සංඛ්‍යා දත්ත වාර්තාවල අඩු පාඩු මේ වන විට සකස් කොට අවසන් කරමින් පවතින අතර අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදීද නිර්දේශ කොට ඇති පරිදි දැව සංස්ථා චක්‍රලේඛ අනුව මෙම ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරුකොට 2024 වර්ෂ අවසාන ගිණුම් වෙත ගැලපීම සඳහා ලබාදීමට කටයුතු සිදුකරමින් පවතී.

(ඉ) *අපගේ භෝග වගාවන්ගෙන්* 95% *කටත් වඩා වැඩි අගයක් ගනු ලබන තේ වගාව* 2021 වර්ෂයේ සිට පරිණත හා පරිණත නොවූ වශයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 41 අනුව අප විසින් මූල්‍ය ප්‍රකාශනවල වෙන් කොට ඉදිරිපත් කර ඇත.
තේ හැර අනෙකුත් වගාවන්ද *ඉහත ගිණුම්කරණ ප්‍රමිතියට අනුව* පරිණත සහ පරිණත නොවූ ලෙස වෙන් වෙන් වශයෙන් 2024 මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ සටහන් අංක 8.1 යටතේ ඉදිරපත් කිරීමට බලාපොරොත්තුවෙමු.

(ඊ) 2023 වර්ෂයේදී සංස්ථාව සතු මෝටර් රථ 4ක් රු.698,500/= කට විකුණා ඇති බව සඳහන් කර ඇතත් එලෙස විකුණා ඇත්තේ අප සංස්ථාව සතු වතුයායන් සතුව පැවති පාවිච්චියට ගත නොහැකි, අපහරණය කළ යුතුව තිබූ පැරණි මෝටර් වාහන 4කි. මෙම වාහන විකුණා තිබුනේ අබලි ද්‍රව්‍ය වශයෙන් නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමිනි. එම විකිණීම් වලට අදාල විස්තර පහත පරිදි වේ.

| දිනය | ටෙන්ඩර් අංකය | විස්තරය | මුදල (රු) |
|---|---|---|---|
| 2023.03.20 | SLSPC/Vehicle/T-18/2023 | අබලි මෝටර් සයිකලය | 28,000 |
| 2023.03.20 | SLSPC/Vehicle/T-16/2023 | අබලි මෝටර් ලොරි රථය | 113,000 |
| 2023.03.23 | SLSPC/Vehicle/T-17/2023 | අබලි මෝටර් ලොරි රථය | 367,500 |
| 2023.04.11 | SLSPC/Vehicle/T-28/2023 | අබලි මෝටර් රථය | 190,000 |
| | මුලු වටිනාකම | | 698,500 |

අප විසින් ඉහත අබලි මෝටර් රථ විකුණා ලද මුදල් ගිණුම්ගත කර ඇත්තේ අබලි ද්‍රව්‍ය විකුණුම් ආදායම් ගිණුම (Sales Income - Redundant Items) යටතේ වන අතර වාහන විකුණුම් ආදායමක් ලෙස නොවේය. එබැවින් එම මුදල් ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කොට නොමැත. එසේම මෙම අබලි වාහන වල පිරිවැය මෝටර් රථ පිරිවැයෙන් අඩුකර පෙන්වා

නොතිබීමට සහ සමුච්චිත ක්ෂය ගිණුමෙන් අඩුකර පෙන්වීමට නොහැකි වී ඇත්තේ අප සංස්ථාව සතුව නිවැරදි යාවත්කාලීන ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබීම නිසා ස්ථාවර වත්කම් හඳුනා ගැනීමේ ගැටලුවක් පැවතීමයි. ඉහත වාහන අපහරණය කළ යුතු තත්වයේ පැවති බැවින්, මෝටර්රථ විකිණීමෙන් ලද ලාභය/අලාභය ගණනය කිරීමක්ද සිදුව නොමැත. නමුත් මේ වන විට අපගේ රේඛීය අමාත්‍යාංශයේ ද සහයෝගය ඇතිව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීමේ කටයුතු අරඹා ඇති බැවින් මෙවැනි අඩුපාඩු සිදුවීම ඉදිරියේදී වලක්වා ගත හැකිවනු ඇත.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 17 ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවනු ලැබූ රු.මිලියන 20.69 ක ණය වාරික සහ රු.මිලියන 35.48 බැංකු අයිරා ගෙවීම් මුදල් ප්‍රවාහන ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කල යුතු බව අපි පිළිගනිමු. 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ණය වාරික ආපසු ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කරන බව දන්වා සිටිමු.

(ඌ) අප සංස්ථාව සතු පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් (වානිජ වන වගාවන්) තක්සේරු කිරීමේ කටයුතු ඉදිරියේදී සම්පූර්ණ කිරීමෙන් අනතුරුව කපා ඉවත් කරන ලද ගස්වල පිරිවැය හඳුනාගෙන එම වටිනාකම එමගින් පාරිභොජ්‍ය වත්කම් ශේෂයේ අධි ගණනයක් සිදුවීම වලක්වා ගත හැකිවනු ඇත.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී උපයනු ලද රු.මිලියන 80.05 ක දැව අදායමට අදාල ගස්වල පිරිවැය හඳුනාගෙන එය පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට නොහැකිවූයේ අප වතුයායන් සතුව පවතින ගස් තක්සේරු කිරීමේ කටයුතු මේවනවිට නිම කර නොමැති වීම නිසා විකුණන ලද ගස්වලට අදාළ පිරිවැය හඳුනාගැනීමට නොහැකි වීම නිසාය. නමුත් මේවනවිට එම කටයුත්ත සිදුකරගෙන යමින් පවතින නිසා 2024 වර්ෂයේ අවසන් ගිණුම් පිළියල කරන අවස්ථාව වන විට එම කටයුත්ත අවසන්ව තිබුණහොත් විකුණනු ලැබූ ගස්වල පිරිවැය පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක ශේෂයෙන් අඩුකර පෙන්වීමට හැකි වන අතර එමගින් පාරිභෝජ්‍ය වත්කම් ශේෂයේ අධි ගණනයක් සිදුවිම වලක්වා ගැනීමට හැකිවනු ඇත.

(එ) සමාලෝචිත වර්ෂයේදී උපකරණ හා පරිගණක සඳහා පිළිවෙලින් රු. 21,756.00 ක් සහ රු. 163,929.00 ක් ක්ෂය ගණනය කිරිමේදී අඩුවෙන් ගිණුම්ගත කිරීම තුළින් සමාලෝචිත වර්ෂයේ ලාභය රු. 185,685.00 කින් අධි ගණනය වී ඇතැයි යන ප්‍රකාශය හා එකග වේ.
මෙහිදී ප්‍රධාන කාර්යාලයට අදාලව පරිගණක හා උපාංගයන්ගේ ක්ෂය ගණනය කිරීමේදී ඇතැම් පරිගණක හා උපාංගයන්ට අදාලව 2023 වසරේ මුළු ක්ෂය අගයන්ද, ඇතැම් පරිගණක සහ උපාංග සඳහා ඒවායේ ඵලදායී ජීව කාලයේ අවසන් මාස කිහිපයට අදාල ක්ෂය අගයන්ද, ක්ෂය ගණනය කිරිමේදී මගහැරීයාම නිසා රු. 163,929.00 ක් අඩුවෙන් ක්ෂය ගණනය වි ඇත.
එලෙසම ප්‍රධාන කාර්යාලයට අදාලව උපකරණ ක්ෂය ගණනය කිරිමේදී ඇතැම් උපකරණ වල 2023 වසරේ මුළු ක්ෂය අගයන්ද, ක්ෂය ගණනය කිරිමේදී මගහැරීයාම නිසා රු. 21,756.00 ක් අඩුවෙන් ක්ෂය ගණනය වි ඇත.
ඒ අනුව, 2024 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දි උක්ත අගයන් නිසි ලෙස ගලපා එම ස්ථාවර වත්කම් වලට අදාල සමුච්චිත ක්ෂය අගයන් නිවැරදිව ගණනය කිරීමට බලාපොරොත්තු වේ. තවද, මෙවැනි අතපසුවීම් යලි සිදු නොවීමට ඉදිරියේදි වග බලා ගනු ලැබේ.

(ඒ) වතුයායන් විසින් ස්ථාවර වත්කම් මිලදී ගන්නා ඇතැම් අවස්ථාවන්හීදී එම දිනයන් ප්‍රධාන කාර්යාල වෙත දැන්වීම පමාවුවහොත් හෝ මගහැරුණ හොත්, එම වත්කම් මිලදී ගත් මුළු මාසයටම ක්ෂය කිරීම් සිදුකර ඇත.එබැවින් මෙලෙස ක්ෂයවීම් අධිගනණය වී ඇත. නමුත් 2024 වර්ෂයේදී ස්ථාවර වත්කම් ක්ෂය ගණනය කරන අවස්ථාවේ වසර තුල අළුතින් එක් වූ ස්ථාවර වත්කම් මිලදී ගත් දිනය නිසිලෙස සැලකිල්ලට ගෙන ක්ෂය ගණනය කිරීම නිවැරදිව සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

(ඔ) සංස්ථාව සතු වතු 280ක් රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත 1992.06.22 දින සිට වසර 53 ක කාලයක් සඳහා වැවිලි සමාගම් 20 ක් වෙත බදු පදනමට ලබා දී ඇත. එසේ බදු දීමේ දී එක එක වතු යාය සඳහා වෙන වෙනම බදු ගිවිසුම් අත්සන් කර ඇති අතර බදු දීමනාකරු ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව කටයුතු කර ඇත.

කෙසේ වුවත්, මෙම වතු පුද්ගලීකරණය කල ආරම්භක අවස්ථාවේ දී වසර 99 ක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් කර ඇති අතර, එකී කාලය සඳහා එක වතු යායක් සඳහා ලැබෙන බදු මුදල රු 500 /-ක් ලෙස සඳහන් කර තිබුණි. එම බදු මුදල අදාල වැවිලි සමාගම විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ගෙවීමට කටයුතු කර ඇත.

කෙසේ වෙතත් පසුව එම බදු ගිවිසුමෙහි කාලය වසර 53 ක් දක්වා අඩු කර වෙනත් බදු ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කර තිබුණු අතර එහි සඳහන් කර ඇති එක් කොන්දේසියක් අනුව වැවිලි සමාගම විසින් ගෙවිය යුතු බදු මුදල වෙනත් සූත්‍රයක් අනුව සිදු කර තිබෙන අතර, එම මුදල් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයට ලබා දීම ක්‍රමවේදය වේ.

එබැවින් එම මුදල් අප ගිණුමට බැර නොවන හේතුව මත එය ලැබීමක් ලෙස සටහන් කිරීම නිවැරදි නොවන ඇතුලත් කිරීමක් වේ. කෙසේ වෙතත් සංස්ථාව සතු දේපොලක අදායම සංස්ථා ගිණුමකට ඇතුලත් නොවීමේ ගැටළු සහගත පසු බිමක් තුල මේ සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අවධානයට යොමු කර ඇති අතර නැවත වතාවක් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට කටයුතු කිරීමට නියමිතය.

(ඕ). සංස්ථාව සතු ධාරක ජීව විද්‍යාත්මක වත්කම් පරිණත නොවූ වගාවේ සිට පරිණත වගාව දක්වා මාරු කිරීම සිදු කෙරෙනුයේ ඒවායේ වාණිජමය අස්වනු නෙලීම ආරම්භ වන අවස්ථාවේදීය. ඒ පිලිබඳව මේවනතෙක් මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කිරීමක් සිදුකර නොමැති බැවින් 2024 වසරේ අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී මේ සම්බන්ධව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කිරීමට අපි අපේක්ෂා කරමු.

තවද 2021වර්ෂයේ සිට වතුයායන් විසින් නව වගාවන් සඳහා දරණ ලද වියදම වතුයායේ ශේෂපත්‍රයේ පෙන්වීමට කටයුතු කරන ලෙස දන්වා තිබූ බැවින් 2022/2023 වර්ෂවල එම නව වගාවන් සඳහා දරණ ලද වියදම් වතුයායන්හි ශේෂපත්‍රයේ පෙන්වා තිබුණි. ඒ අතරින් 2023 වසරේ පරිණත වූ වගාවන්ට අදාලව එම වසර දෙක තුල දරණ ලද වියදම පමණක් 2023 වර්ෂයේදි මාරු කර ඇත (රු.1,177,648.00)

තවද 2024 ගිණුම් පිළියෙල කිරීමේදී පරිණත වූ වගාවන්ට මාරු කරනු ලබන වගාවන්ට අදාළ සියළුම වටිනාකම් පරිණත නොවූ ගිණුමේ සිට පරිණත වූ වගා ගිණුම වෙත නිවැරදිව මාරු කිරීමට (වතුයායන් වලින් මේ සම්බන්ධ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් පසුව) අප බලා පොරොත්තුවේ.

(ක) විගණන වාර්තාවේ සඳහන් පරිදි 2023.12.31 දිනට වතුයායන්හි දේපළ, පිරියත හා උපකරණ වර්ග 6ක පිරිවැය සහ ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන උපලේඛනය අනුව එම වත්කම් වල පිරිවැය අතර රුපියල් මිලියන 124.018 ක වෙනසක් ඇති බව සඳහන් වේ. මෙම වෙනසට හේතු වී ඇත්තේ දීර්ඝ කාලයක් තිස්සේ නිවැරදි ස්ථාවර වත්කම් ලේඛණයක් සංස්ථාව සතුව නොතිබීමයි. රේඛිය අමාත්‍යාංශයේද සහයෝගය ඇතිව අංග සම්පූර්ණ නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම මේ වන විට සංස්ථාව විසින් අරඹා ඇති අතර එහි ප්‍රථම අදියර වශයෙන් කැළෑබොක්ක වතුයායේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම ආරම්භ කරන ලදී. ඒ යටතේ කළෑබොක්ක වතුයායේ ගෘහ භාණ්ඩ හා උපකරණ භෞතික සත්‍යාපන කටයුතු ආරම්භ කරන ලදී.භෞතික සත්‍යාපන කටයුතු සඳහා යොදාගනු ලබන්නේ ආයතනයේම නිළධාරීන් වන බැවින් දෛනික රාජකාරි වලට අමතරව මෙම කටයුත්තේද නියැලීමට අවශ්‍ය බැවින් මෙම ස්ථාවර වත්කම් සත්‍යාපන කටයුතු සඳහා විශාල කාලයක් ගතවේ. නමුත් 2024 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේදී තරමක් දුරට හෝ මෙම වෙනස අවම කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

(ග) 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන් වල බැංකුවේ ඇති මුදල් ශේෂයත් වතු ගිණුම් අනුව එම ශේෂයත් අතර විගණන වාර්තාවේ පෙන්වා ඇති පරිදි රු.මි. 0.225 ක වෙනසක් පවතී.එසේම අතැති මුදල් ශේෂය රු.මි. 0.401 වූ අතර වතු ගිණුම් අනුව එය රු.මි.0.104 ක් වූ බැවින් රු.මි.0.297ක වෙනසක් පවතියි. මේ පිලිබඳ තොරතුරු සොයා බැලීමේදී එයට හේතු තුනක් බලපා ඇති බව දැනගැනීමට හැකිවිය.

- එක් හේතුවක් වී ඇත්තේ මිඩ්ලන්ඩ් හා රංගල වතුයායන් 2023.12.31සකස් කරනු ලබන අවසන් ශේෂ පතෙහි බැංකුවේ ඇති මුදල් ශේෂයට අතැති මුදල් ශේෂය ලෙස හා අතැති මුදල් ශේෂයට බැංකුවේ ඇති මුදල් ශේෂය ලෙස සටහන් කර තිබීමයි.

- 2022 වර්ෂයේ දී කුඩාඔය වතුයාය හා ඕපල්ගල්ල වතුයාය එකම වතුයායක් ලෙස වැඩකටයුතු කරගෙන යෑම සඳහා අනුමැතිය දෙන ලද අතර එවකට කුඩාඔය වතුයායේ පැවති බැංකුවේ තිබූ මුදල් ශේෂය රු.65,819.08 ක මුදල 2023.12.31දින ඕපල්ගල්ල වතුයායට මාරු කරන ලදී. එයද මෙම වෙනසට තවත් හේතුවකි. විස්තර අමුණා ඇත.
- මීට අවුරුදු 25 කට පෙර කොටගඟ වතුයායේ වතු නිවාස සංවර්ධන වැඩ පිළිවෙලකට ලැබුන ආධාර මුදලින් එම වැඩ පිළිවෙලට මුදල් භාවිතා කර ඉතුරු වූ රු.4859.98 ක් ද එම වතුයායේ බැංකුවේ ඇති මුදල් ශේෂයක් ලෙස ශේෂ පත්‍රයේ පෙන්වා තිබිණි.මෙයද බැංකු ශේෂයක් බව වතුයායෙන් දැනගැනීමට හැකි විය.

ඉහත රු.65,819.08 හා රු.4859.98 ද සංස්ථාවේ අවසන් ගිණුම් තුල බැංකුවේ ඇති මුදල් අගයට එකතු කර ඇත.

(ච) සංස්ථාව පාලනය කරමින් තිබෙන වතු යායන් 16 න් වතු 2ක් හැරෙන්නට ඉතිරි වතු 14 ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කයන් තුල පිහිටා තිබේ. මෙම වතු ගැසට් මගින් සංස්ථාව සතු වී තිබෙන අතර, එසේ අයිතිය ලබා දීමේ දී මෙම කිසිදු වතු යායක් මැනීම් කර නොමැති අතර , ගැසට් පත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයන් මත පිහිටා මෙතෙක් කටයුතු කර ඇත.

කෙසේ වෙතත් මෑතකදී, මැණුම් කටයුතු නොකිරීම නිසා ඇති වී තිබෙන ව්‍යාකූලතාවයට පිලියමක් ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යංශය වෙත ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් රජයේ මිනින්දෝරු අධිකාරිය විසින් මෙම වතු යායන් වල කැඩස්තර සිතියම් සකස් කිරීම සිදු කරමින් පවතී.

එසේ සිදු කල කැඩස්තර මැනුමේ දී වතු යායන් බොහොමයක ගැසට් පත්‍රයේ සඳහන් ඉඩම් මාණයන් සැලකිය යුතු කොටසක් අඩු වී ඇති බව තහවුරු වී ඇත. මේ පිලිබඳව වතු අධිකාරීන් ගෙන් කල විමසීම් වලදී , කරුණු දක්වා ඇත්තේ, නකල්ස් සංරක්ෂණ කලාපය සඳහා වතුයායන් ගෙන් ඉඩම් වෙන් කර මායිම් කණු සිටවා ඇතත් එසේ මායිම් කණු සිටු වී මේ දී මැනීමක් සිදු කර නොමැති බැවින් එකී කලාපය සඳහා වෙන් වූ මාණයන් පිලිබඳව දැනීමක් නොමැති බවයි.

2007 වර්ෂයේ දී මධ්‍යම පරිසර අධිකාරිය විසින් අංක 1507/9 හා 2007.07.23 දිනැති ගැසට් පත්‍රය මගින් නකල්ස් සංරක්ෂක කලාපය ලෙස අප වතු යායන් කිහිපයකට අයත් ඉඩම් ඇතුලත්වන පරිදි මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම කලාපය වෙන් කර ඇත. නමුත් එහිදී මැනුමක් සිදු කර නොමැති නිසා ඒ ඒ වතු යායන් වලින් අත් කර ගත් ඉඩම් ප්‍රමාණයන් පිලිබඳව සංඛ්‍යාත්මක දැනුවත් භාවයක් නොමැත.

මැණුම් කටයුතු වලදී එකී අධිකාරියේ නිලධාරීන් අවසරයකින් තොරව ,වන සංරක්ෂක කලාපයය තුල වූ ඉඩම් මැනීමට භාජනය කර නොගන්නා බැවින් මෙම මැණුම මගින්ද බලාපොරොත්තු වන ප්‍රතිපලය ලබා ගැනීමට අපොහොසත් වන බැවින් , අප විසින් 2024.06.12 දිනැති ලිපිය මගින් වන සංරක්ෂක වෙත දන්වා සිටියේ වන සංරක්ෂණ කලාපයට මායිම් වී ඇති අප සංස්ථාව සතු වතු මැනීමේ දී , නකල්ස් සංරක්ෂණ කලාපයට වෙන් වූ සංස්ථාව සතු ඉඩම් මැනීමට අවශ්‍ය අවසර ලබා දීමට කටයුතු කරන ලෙසයි.

එසේම මෙම වන සංරක්ෂක කලාපය සඳහා වෙන් වූ ඉඩම් ප්‍රමාණයන් නිශ්චිතව හදුනා ගැනීමෙන් අනතුරුව එකී ඉඩම් සංස්ථාව වෙත අහිමිවීම වෙනුවෙන් රජයේ තක්සේරු මුදලට අනුව වන්දි ලබා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බවද අප විසින් දැනුම් දී ඇත .

හුන්නස්ගිරිය වතු යායේ පමණක් හෙක්ටයාර 3.19ක් වැඩි වී තිබීම ඉහත සඳහන් කල ආකාරයට මැණුමකින් තොරව ගැසට් කිරීම නිසා සිදු වූ ප්‍රායෝගික ගැටළුවක් නිසා සිදු වූවක් බවට විශ්වාස කල හැක.

(ජ) සංස්ථාව සතුව පවතින ඉඩම් තොරතුරු ඇතුලත් කල ලේඛනයක් ( Land Register) මෙතෙක් හමු වී නොමැත. රජය සතු වූ වතු පාලනය කිරීමට ආයතනයක් නොමැති වූ නිසා 1958 වර්ෂයේ දී පාර්ලිමේන්තු පනතක් මගින් අරම්භ වූ මෙම සංස්ථාව වෙත අරම්භයේ දීම සතු කර දුන් සමහරක් වතු

හිමි වූ මූලාශ්‍රයන් සොයා ගැනීමට අපහසු වී ඇති නමුත්, එම වතු භෞතිකව අප සතුව හෝ ප්‍රාදේශීය වැවිලි සමාගම් පාලනයේ පවතින බවට වූ ලේඛණ අප සතුව පවතී.

තවද වතු විශාල ප්‍රමාණයක් අප සංස්ථාව සතු වී ඇත්තේ ,ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ රජයට අත් පත් කර ගෙන ඉන් අනතුරුව ගැසට් මගින් අප සංස්ථාව සතු කර දීමෙනි.

ඉහත ආකාරයට ලැබුනු සමහර වතු රජයේ අවශ්‍යතාවයන් සඳහා සම්පූර්ණ වතුයායම හෝ ඉන් කොටසක් ලෙස පවරා ගෙන ඇති අතර, එකී හේතුන් මත ලේඛණ වල සඳහන් වුවත් සමහර වතු , භෞතිකව සංස්ථාවේ හෝ වැවිලි සමාගම් පාලනයෙන් බැහැරව පවතී. උදා: පල්ලේකැලේ ,තිස්පනේ , පර්ත්

මේ සමග අමුණ ඇති ලේඛනයේ සඳහන් ආකාරයට ගැසට් මගින් හා වෙනත් ආයතන වලින් සහ මිලදී ගත් මුළු වතු යායන් හි එකතුව හෙක්ටයාර 147, 559 .12 ක් වේ. එය විගණන විමසුමෙහි 1,49,374 ක් විය යුතු බවට සඳහන් වන්නේ ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් අප වෙත ලබා දී ඇතැයි සඳහන් වතු යායන් 6න් 4 ක එකතුව දෙපාරක් මුළු එකතුවට එක් වී ඇති නිසා සහ අප වෙත ලබා දී නොමැති බවට අනාවරණය කරගත්, ඉඹුල්දෙනිය සහ පයින්හිල් යන වතු යායන් 2 හි එකතුවද අවසාන එකතුවට එක් වී තිබීම නිසා බව හදුනාගෙන ඇත.

ඒ අනුව ලැබුණු මූලාශ්‍රයන් ලෙස ,ගැසට් , වාර්ෂික වාර්තා සහ මිලදී ගත් ඉඩම් සඳහා අදාල ඔප්පු සහ ලේඛණ වල නම් සඳහන් වතු සියල්ලේ එකතුව හෙක්ටයාර 147,559 .12 ක් වේ.අදාල ලේඛනය ඉදිරිපත් කර ඇත.

(ට) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මිලදී ගත් වතු අතරින් 2019 වර්ෂය වන විට අප සතුව ඔප්පු පැවතියේ වතු 6 ක පමණක් වන අතර, විවිධ මූලාශ්‍රයන් උපයෝගී කර ගනිමින් සිදු කල සොයා බැලීම් නිසා මේ වන විට වතු 18 ක ඔප්පු සංස්ථාව වෙත ලබා ගැනීමට සමත් වී ඇත.

මිලදී ගත් බවට ඇති ලේඛණ වල සඳහන් සමහරක් වතු උදා : රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිට ඇති දැනට බලංගොඩ වැවිලි සමාගම විසින් කළමනාකරණය කරනු ලබන නන්පෙරියල් වතු යායට අයත් ඔප්පුව සොයා ගැනීම සඳහා සිදු කල සොයා බැලීම් වලදී දැනට අනාවරණය වූ කරුණු අනුව අනාවරණය වී ඇත්තේ මෙම නන්පෙරියල් වතු යාය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත අප විසින් මුදල් ගෙවා මිලදී ගෙන ඇති බවය.

ඒ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් මිලදී ගැනීම් සිදු කරන විට ඔප්පුවක් ලබා නොදෙන බැවින් , ඔප්පු නොමැති අනෙකුත් මිලදී ගත් වතුද ඒ ආකාරයෙන් ම මිලදී ගෙන ඇති දැයි සොයා බලමින් පවතී.

(ඩ) 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව බදු කුලී ආදායම රු.18,189,536 ක් වන අතර ඉඩම් අංශය විසින් විගණනය සඳහා ලබාදී ඇති උපලේඛනය අනුව එය රු.20,921,819 ක් ලෙස සටහන් කර තිබීම නිසා රු. 2,732,283 ක වෙනසක් ඇති වී තිබෙන බව විගණන වාර්තාවේ සඳහන්වේ. නමුත් අප විසින් මෙම වෙනස සම්බන්ධයෙන් තොරතුරුසොයා බැලීමේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

- AMP Ceylon (Pvt) Ltd - මෙම ආයතනයෙන් 2023.01.18 න් පසුව ලැබෙන මාසික බදු කුලී ආදායම රු.160000 ක් ද ඊට පෙර පැවති මාසික බදු කුලී ආදායම රු.112500ක් ද වේ.නමුත් ඉඩම් අංශයෙන් ලබා දී ඇති උපලේඛනය අනුව එය රු.152109.59ක් නිසා මූල්‍ය ප්‍රකාශන වල සඳහන් අගය නිවැරදිය.

- ආගරපතන වැවිලි සමාගම - මෙම සමාගමෙන් ලැබූ බදු කුලී ආදායම ඉඩම් අංශයෙන් ලබාදී ඇති උපලේඛණයෙහි ඇතුලත් නොවේ.

- Amazon Trading (Pvt) Ltd - මෙම ආයතනය සමග ඇතිකරගෙන තිබූ බදු කුලී ගිවිසුම අනුව ඔවුන්ගෙන් ලැබූ අවසාන බදු කුලී ලැබීම වන රු.693,437.50 ඉඩම් අංශයෙන් ලබා දුන් උපලේඛනයෙහි සඳහන්වී නොමැත.

- Asia Broadcasting Corporation (Pvt) Ltd – මෙම ආයතනයෙන් ලැබෙන බදු කුලී ආදායම රු.මි.1,620,000 ක් වුවද ඉඩම් අංශයෙන් ලබා දී ඇති උපලේඛනය අනුව එය රු.2,664,000 ක් ලෙස වැරදියට සටහන් කර ඇත.

- Peoples Media Network (Pvt) Ltd – මෙම ආයතනයෙන් ලැබෙන බදු කුලී ආදායම රු.1,080,000 වුවද ඉඩම් අංශයෙන් ලබාදී ඇති උපලේඛණයෙහි එය රු.1,274,400 ක් ලෙස වැරදියට සටහන් කර ඇත.

- සෙල්වරාජ් සිවකුමාර් සහ Sumiko Lanka Hotel – මෙම ආයතන වලින් ලැබූ බදු කුලී ආදායම මූලH පඃකාශන වල නිවැරදිව සඳහන් කර ඇති නමුත් ඉඩම් අංශයෙන් ලබාදී ඇති උපලේඛණයේ සඳහන් බදු කුලී අදායම නිවැරදි නොවේ.

- New Saman Group – මෙම ආයතනයෙන් ලැබිය යුතු බදු කුලී ආදායම සම්බන්ධයෙන් ඉන්වොයිස් පතක් නිකුත් කිරීම සඳහා අවශH තොරතුරු ඉඩම් අංශයෙන් මූලH අංශය වෙත ලැබී නොමැත.

  තවද වතුයායන් වලින් කඩකුලී සහ ගොඩනැගිලි බදු දීම සම්බන්ධයෙන් ලැබූ බදු කුලී ආදායම නිවැරදිව ගිණුම් ගත කර ඇතත් එම අගයන් ඉඩම් අංශයෙන් ලබාදුන් උපලේඛනයෙහි සඳහන්ව නොමැත.

(ත) 2024 මුල්‍ය ප්‍රකාශන මෙවැනි අඩුපාඩු සිදුවීම වලක්වා ගනිමින් පිළියෙළ කිරීමට අපේක්ෂා කෙරේ.

(ද) 2024 මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී මෙවැනි අඩුපාඩු වළක්වාගෙන කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

(ප) 2023.12.31 දිනට සිදුකළ භෞතික සත්‍යාපනය අනුව වතුයයන්හි පැවත පැල තවාන් වල වටිනාකම රු.15,951,139.00ක් විය. එදිනට ගිණුම් අනුව පැළ තවාන් වල අගය වූයේ රු.23,230,823 කි. එසේම 2022 වසර අවසානයෙදී සිදුකළ භෞතික සත්‍යාපනයේදී පැළ තවාන් වල අගය ගිණුම්වල අගයට වඩා රු.10,524,054 ක් අඩු වූයේ 2022 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඒ සඳහා වෙන් කිරීමක් මුල්‍ය ප්‍රකාශන සිදු කරන ලදි.

එලෙස සැලකිය යුතු අගයකින් භෞතික පැල නොතිබීමට හේතු මේ වනවිට සොයා බලමින් පවතින අතර එම හේතුන් තහවුරු කරගත් භෞතිකව නොපවතින පොත් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. තවද 2024 වසරේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී පැළ තවාන් වල වටිනාකම තොග අයිතමයන් යටතේ මුල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට බලපාන හේතුවේ.

(බ) අප සංස්ථාවේ හිග ව්‍යවස්ථාවේ දීමනා පියවීම සඳහා අමත්‍යාමන්ඩලයේ තීරණයට අනුව 2023 සැප්තැම්බර් මාසයේ සිට මාසිකව රු.මි.21.3 බැගින් ලබාදීම ආරම්භ කළ අතර 2023.12.31 වන විට එවැනි වාරික 03ක් සඳහා රු.මි.63.9ක් ලැබී තිබිණි. එම මුදලින් අප විසින් සතිපතා ව්‍යවස්ථාපිත ගෙවීම් වලට අදාල නඩු වාරික සදාහ අවශ්‍ය මුදල් ගවන අතර අර්ථසාධක අරමුදල් සහා සේවක භාර අරමුදලෙහි මාසික දායක මුදල් ගෙවීම මෙන්ම සේවක පාරිතෝෂික මුදල් ගෙවීමද සිදු කරනු ලබයි. 2023 නොවැම්බර් මාසයට අදාලව 2023.12.08 දින ලැබුණු මුදලින් 2023.12.31 දින වන විට ගෙවා නොතිබුණු

රු.14,500,094.00 2024 ජනවාරි මාසයේදී නඩු වාරික සහ පාරිතෝෂික ගෙවීම සඳහා වැය කර ඇත. යම් මාසයකට අදාලව භාණ්ඩාගාරයෙන් මුදල් ලැබුණු පසු එම මුදල් මසක පමණ කාලයක් තුල ගෙවීම් සිදුකරන බැවින් යම් මසක් අවසානය වන විට එම මස ලැබුණු මුදල සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර නොතිබිය හැකි අතර ඉදිරි මාසයේදී එම ඉතිරි මුදලින් ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධ ගෙවීම් සිදුකරනු ලැබේ.

**(ය)** විගණන විමසුමේ සඳහන් මෙම ශේෂය ( රු.මිලියන 167.161) සෑදී ඇත්තේ ජංගම ගිණුම් කිහිපයක එකතුවෙනි. බොහෝවිට ඒවා එකිනෙකට හිලව් වන ජංගම ගිණුම් වන අතර මෙම ගිණුම් ශේෂ 2012, 2019, 2020 වර්ෂවල හට ගත් ඒවා වේ. 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකසන අවස්ථාවේදී 2012 වර්ෂයේ සිට පැවත එන එක් ශේෂයක් සම්බන්ධයෙන් ගැලපුම් යොදා සැලකියයුතු ප%මාණයක් නිවැරදි කරන ලද අතර ඉතිරි ශේෂයන් පිළිබඳ තවදුරට සොයා බලා ඉදිරියේදී නිවැරදි ගැලපුම් යෙදීමට කටයුතු කරනු ලැබේ.

(ර) 2020 වර්ෂයේදී මහජන බැංකුවෙන් ලබාගත් රු.මි.100ක ණය මුදලින් 2023.12.31 දින වන විට ගෙවීමට ඉතිරිව තිබූ රු.මි.79.31 සහ එදිනට බැංකු අයිරාව වූ රු.මි.135.39 සහ ඒවාට අදාල ගෙවිය යුතු පොලිය බැංකුව සමග සාකච්ඡ කිරීමෙන් පස් අවුරුදු දීර්ඝ කාලීන ණයක් බවට පරිවර්තනය කරගන්නා ලදී. 2024 පෙබරවාරි මාසයේදී මෙම ණය පරිවර්තනය කිරීම සිදුකල අතර එසේ කිරීමට හේතු වූයේ එමගින් සංස්ථාවට ගෙවීමට සිදුවන පොළී මුදල් අඩුවීමෙන් ලැබෙන වාසිය සලකා බැලීමයි. මේ වනවිට අප විසින් මෙම ණයට අදාල වාරික මුදල් නිසි පරිදි ගෙවා ඇත.

(ල) දීර්ඝ කාලයක් පටන් සංස්ථාවේ පවතින මුල්‍ය දුෂ්කරතා හේතුවෙන් මේ දක්වා ගෙවා දැමීමට නොහැකි වූ දීර්ඝ කාලයක සිට පැවත එන පහත සඳහන් ශේෂයන් සම්බන්ධව අප විසින් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

- හලාවත වැවිලි සමගම (රු.මි.41.21) - හලාවත වැවිලි සමාගම වෙත ගෙවිය යුතු මුදල (පොළියද ඇතුලත්ව) අප සංස්ථාවේ පවතින මුල්‍ය දුෂ්කරතා හේතුවෙන් කපාහරින ලෙස ඉල්ලා අප විසින් 2024.05.16 දින ලිපියක් යවා ඇත.

- ලංකා මිනරල් සැන්ඩ් සමගම (රු මි.25) – මෙම සමාගම වෙත අප විසින් ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ ඇති නඩුව සමතයකට පත්කර ගැනීම සඳහා අවශH කටයුතු සිදුකරන ලෙස අපගේ 2024.05.16 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් කර ඇත.
- ලංකා පොහොර සමාගම (රු.මි.35.93) – අප සංථාව විසින් මෙම සමාගම වෙත 2023.12.31 දිනට ගෙවිය යුතු මුදල අප සංස්ථාවේ පවතින මුල්‍ය දුෂ්කරතා හේතුවෙන් ගෙවා දැමීම අපහසු බැවින් එය හිලව් කිරීම සඳහා අප සංස්ථාව සතු ස්ථාවර වත්කමක් පවරා ගැනීමට එම ආයතනය එකඟ දැයි විමසා ඇති අතර එසේ නොමැති නම් එම ණය කපාහරින ලෙස ඉල්ලීමක් අප විසින් අපගේ 2024.06.10 දිනැති ලිපිය මගින් සිදුකර ඇත.
- රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව (රු.මි. 28.71) - මෙම ආයතනය වෙත 2023.12.31 දිනට ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් අප විසින් මුදල් අමාත්‍යාංශය වෙත 2024.06.10 වන දින ලිපියක් යවා ඇත. අප සංස්ථාවේ පවතින මුල්‍ය දුෂ්කරතා සලකා බලා මුදල් අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත ගෙවිය යුතු ඉහත සඳහන් මුදල කපාහරින ලෙස අප විසින් මෙම ලිපිය මගින් ඉල්ලීමක් කර ඇත.
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය (රු.මි.97.71) - සංස්ථාව විසින් 2023.12.31 දිනට ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ගෙවිය යුතු රු. 54,969,666.00 ක මුදල (අප සංස්ථාව විසින් ගෙවිය යුතු රු.97,709,342.00 සහ අප වෙත ලැබිය යුතු රු.42,739,676.00 මුදල් හිලව් කළ පසු) අප සංස්ථාවේ පවතින මුල්‍ය දුෂ්කරතා හෙතුවෙන් කපාහරින ලෙස ඉල්ලීමක් අප විසින් අපගේ 2024.05.22 දිනැති ලිපිය මගින් කර ඇත.

මෙම ලිපි සඳහා මේ වන විට ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් පමණක් පිළිතුරක් ලැබී ඇති අතර එම මණ්ඩලයේ විගණන කමිටුව මගින් එලෙස අපගෙන් ලැබියයුතු එම ආයතනය වෙත ලැබිය යුතු මුදල කපාහැරීමට නොහැකි බව තීරණය අප වෙත කළ බව දන්වා ඇත.

(ව) 2022 වර්ෂයේ අවසාන ගිණුම්තුල දිර්ඝ කාලයක සිට පැවැතගෙන එන අයකරගැනීමට අවිනිශ්චිත ණයගැති ශේෂයන් සඳහා අඩමාන ණය වෙන් කිරීමක් සිදුකර ඇත. තවද ඇතැම් ශේෂයන් අයකර ගැනිම සඳහා අප මේ වන විට කටයුතු කරගෙන යමින් පවතින අතර එම ණය ගැති ශේෂ අයකර ගැනීම සඳහා එම ආයතනය වෙත ලිඛිතව හා වාචිකව දන්වා ඇත. එම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් අවධානය යොමු කර කටයුතු කරනු ලැබේ.

(ශ) වර්ෂයට අදාල මුළු පොලිය රු.8,050,274.48 වන අතර එය පහත ආයතනයන් වෙත ගෙවා ඇත.

| | |
|---|---|
| Bartleet Produce Marketing | 1,320,929.85 |
| Forbs & Walker Broker | 3,281,315.80 |
| LCBL | 3,288,863.53 |
| Mercantile Brokers | 159,165.30 |
| Total | 8,050,274.48 |

ආයතනයේ මුලා දුෂ්කරතාවයන් සහිත අවස්ථාවන්වලදී වතු කම්කරු වැටුප් ගෙවීම සහ ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කාර්යාලයේ සහ වතු කාර්යාලවල කාර්යමණ්ඩලය සඳහා වැටුප් නියමිත දිනට ගෙවීම වෙනුවෙන් මෙම අත්තිකාරම් මුදල් ලබාගෙන ඇත. සෑම මසකම පවත්වන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා ඊට පෙර කාලයට අදාලව ලබාගත් අත්තිකාරම් පිලිබඳව මුලා ප්‍රකාශන මගින් තොරතුරු ඉදිරිපත් කර ඒ පිළිබඳ දැනුවත් කර ඇත. පසුගිය වසරට වඩා මෙම වසරේ ලබාගත් අත්තිකාරම් වැඩි වී ඇත්තේ මෙම වසරේ අනෙකුත් මුලා ප්‍රභවයන්ගෙන් ආයතනයට ගලා ආ මුදල් ප්‍රමාණය හීන වීම හේතුකොටගෙනය.
ඔබගේ විගණන වාර්තාවේ දක්වා ඇති ආකාරයට ලබා ගත් අත්තිකාරම් සඳහා පමණක් අදාල වන පොලිය උපලේඛන මගින් ඉදිරිපත් කර ඇති අතර වර්ෂයට අදාල මුළු පොලිය තුල ඊට අමතරව Debit Notes Tea Claims /Penalty Charges සඳහා අයකළ මුළු පොලියද ඇතුලත් බව දන්වනු කැමත්තෙමි.

(ෂ) 2024 වර්ෂයේ වතු අධිකාරිවරුන් හතර දෙනෙකුගෙන් යුතු සමීක්ෂණ මණ්ඩලයක් පත්කර එම සමීක්ෂණ මණ්ඩලය විසින් අප සංස්ථාව සතු වාහන 122 ක් හඳුනාගෙන වාර්තාවක් සපයා ඇත. එම වාර්තාවට අනුව ධාවන තත්වයේ නොමැති වාහන 75 න් අලුත්වැඩියා කර භාවිතා කල නොහැකි තත්වයේ වාහන 25 ක මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් වැසි අංක කපා අවසන් කර ඇත. එම වැසි අංක කැපු වාහන 25 න් 12 ක මේ වන විට ලියාපදිංචිය ද අවලංගු කර ඇත.

ධාවන තත්වයේ නොමැති වාහන 75 න් වැසි අංක නොකැපු සහ ලියාපදිංචිය අවලංගු නොකල ඉතිරි වාහන 50 න් අලුත්වැඩියා කර භාවිතා කල හැකි වාහන 18 ක් අප ආයතයේ පවත්නා මුලා තත්වය මත ක්‍රමාණුකූලව අලුත්වැඩියා කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.

එම වාහන 75 න් වැසි අංක නොකැපු, ලියාපදිංචිය අවලංගු නොකල සහ අලුත්වැඩියා කර භාවියට ගත නොහැකි ඉතිරි වාහන 32 ද කඩිනමින් වැසි අංක කපා, ලියාපදිංචිය අවලංගු කර කඩිනමින් අපරණ ක්‍රියාවලිය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ස) වතුයායන්හි ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සම්බන්ධ තොරතුරු ප්‍රධාන කාර්යාලයේ සහ වතු කාර්යාල වල ඇති අතර වතු කාර්යාල වල ඇති තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කිරීම සඳහා එවන ලෙස වතුයායන් වෙත දන්වා ඇත. මේවන විට වතුයායන් කිහිපයකින් අදාල තොරතුරු ලැබී ඇති අතර ඒවා මෙම වාර්තාව සමග අමුණා ඇත. ප්‍රධාන කාර්යාලයේ තිබූ ගෝමර වතුයායට මිලදීගනු ලැබූ Tea Colour Separator Machine යන්ත්‍රයට අදාළ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. අනෙකුත් ස්ථාවර වත්කම් වලට අදාළ තොරතුරු වතුයායන් වලින් ගෙන්වාගෙන විගණනය වෙත ඉදිරිපත් කිරීමට බලපොරොත්තු වේ.

(ල) දේශීය අදායම් දෙපාර්තමේන්තුවෙන් ඉඩම් කොමසාරිස් මගින්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන ආයතන මගින් අප වෙත ලබා දුන් බවට 1977 වාර්ෂික වාර්තාවේ සඳහන් සියලුම වතු 1992 වසරේ සිට වැවිලි සමාගම් කළමනාකරණයේ පවතී.

දේශීය අදායම් කොමසාරිස් , ඉඩම් කොමසාරිස් සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යන ආයතන වලින් ලබා දී ඇතැයි සඳහන් වතු රජයේ ගැසට් පත්‍රය මගින් ලබා දී ඇතැයි අප විශ්වාස කරන අතර, ඒ අනුව එකී ඉඩම් ලබා දුන් බවට සඳහන් 1960 , 1975 යන වසර වලට අදාලව ඇති රජයේ ගැසට් පත් සියල්ල ලේඛනාගාර දෙපාර්තමේන්තුව මගින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙතින් වැවිලි සංස්ථාව වෙත ලබා දුන් බවට ශ්‍රී ලං රා වැ 1977 වාර්ෂික වාර්තාවේ සඳහන් වතු 6 න් වතු 4 ක් ම ගැසට් මගින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පැවරී, වතු සමාගම් පාලනයේ පවතී. එහි සඳහන් පැරඩයිස් යන වතු යායද වතු යායක් ලෙස අප පාලනයේ නොපවතින අතර, එය රත්නපුර දිස්ත්‍රිකයේ ඇති පාම් ගාර්ඩ්න් වතු යායේ කොටසක් ලෙස එම බදු ගිවිසුමටම ඇතුලත් වී ඇති පැරඩයිස් වත්තද යන්න වෙන් කර හඳුනා ගැනීමට නොහැක.

පයින්හිල් නමින් සඳහන් වතු යාය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් බදු ගිවිසුම් අත්සන් කර ලබා දී ඇති කිසිදු වැවිලි සමාගමකටවත් ඇතුලත්ව නොමැති අතර, කරුණු විමසීමේ දී දැන ගන්නට ලැබුනේ එම වතු යාය ජනතා වතු සංවර්ධන මණ්ඩලය භාරයේ පවතින බවයි. ඒ අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් ලබා දුන්නා යයි 1977 වාර්ෂික වාර්තාවේ ඇති කරුණු නොසලකා හැරිය හැකිය.

2.2.2

(අ)/(ආ) දීර්ග කාලයක පටන් සංස්ථාවේ පවතින දැඩි මුල්‍ය දුෂ්කරතා හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල (EPF), ලංකා වැවිලි කරුවන්ගේ අර්ථසාධක අරමුදල (CPPS) වතු කාර්යමණ්ඩල අර්ථසාධක අරමුදල (ESPS) යන අර්ථසාධක අරමුදල් වලටත් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලටත් (ETF) ගෙවිය යුතු දායක මුදල් නියමිත පරිදි ගෙවීමට නොහැකි වී ඇත. එමෙන්ම සේවක පාරිතෝෂික මුදල්ද නිසි පරිදි ගෙවීමට නොහැකි වී ඇති අතර මේවා සම්බන්ධයෙන් විශාල අධිභාර මුදලක් ගෙවීමට සිදුව ඇත. මේ සම්බන්ධව දිගින් දිගටම අපගේ රේඛිය අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර මහා භාණ්ඩාගාරය හරහා මෙම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකිරීම සඳහා ප්‍රතිපාධන ඉල්ලා ඇත. එහි ප්‍රතිපලයක් වශයෙන් මෙම හිග දායක මුදල් ගෙවා නිම කිරීම සඳහා මේ වනවිට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර ඉදිරියේදී මහා භාණ්ඩාගාරයෙන් මෙම මුදල් ලැබුණු පසු සියලුම හිග ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර අවසන් කිරීමට බලාපොරොත්තුවේ.

(ඇ)

(i)/(ii) සංස්ථාව විසින් මින් ඉදිරියට නිසි පරිදි අදායම් බදු වාර්තා දෙශීය අදායම් දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. පෙර වසර ගණනාවකට අදාළ බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බැවින් ඒ සඳහා අප විසින් වරලත් ගණකාධිකාරී සමාගමක (Audit Firm) / බදු උපදේශක වරයෙකුගේ සහය ලබා ගැනීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මේ වන විට ලබාගෙන ඇත. ඉදිරියේදී මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කිරීමට අපේක්ෂා කෙරේ.

(ඈ)

(i) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු සියලු වාහන පිළිබඳව 2020 වර්ෂයේ පූර්ණ භෞතික පරීක්ෂාවක් සිදුකර වාහන ලැයිස්තුගත කර ඇත. මීට අමතරව අප සංස්ථාව සතු වාහන ලැයිස්තුගත කිරීම සඳහා 04 දෙනෙකුගෙන් යුතු සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර එම සමීක්ෂණ මණ්ඩලය විසින් වාහන 122 ක ප්‍රමාණයක් පවත්නා බව වර්ගීකරණයකට ලක්කර 2024 වර්ෂයේ වාර්තාවක් සපයා ඇත. ඒ අනුව, වාහනවල විස්තර දැක්වෙන තොරතුරු ලැයිස්තුවක් මේ වන විට අප විසින් පවත්වාගෙන යනු ලැබේ.

කෙසේ වෙතත් අභ්‍යන්තර විගණන අංශය වෙතින් අප සංස්ථාව සතු සියලු වාහන පූර්ණ විගණනයකට ලක්කර වාර්තාවක් සකස් කරන ලෙස අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ

**මණ්ඩල පත්‍රිකා අංක SLSPC/2024/BP/Admin/01/Mar-49/01 යටතේ තීරණය කර ඇති බැවින් ඒ අනුව කටයුතු කරනු ලැබේ.**

(ii) විගණනය විසින් විශේෂිත කාර්යක් සඳහා මාණ්ඩලික තත්වයේ නිලධාරින්ට පමණක් රු.100,000.00 ක උපරිමයකට යටත්ව අත්තිකාරම් මුදල් ලබා දිය හැකි බව පෙන්වා දුන් පසු අප විසින් මාණ්ඩලික නොවන නිලධාරීන්ට අත්තිකාරම් මුදල් ලබාදීම මේ වන විට නතර කොට ඇත. ඒ අනුව මේ වන විට අප විසින් 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේක අංක 03/2015 හි සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) ට අනුකූලව මේවනවිට කටයුතු කරනු ලැබේ.

(ඉ)

**(I)** ගල්පිහිල්ල රාජ්‍ය වතුයායේ වතු අධිකාරී ලෙස සේවය කළ වතු අධිකාරී මංගල දයාරත්න මහතා 2023.01.25 වන දින සිට සේවය අත්හිටුවීම් මත එම අවස්ථාවේ එම වතුයායේ වතු අධිකාරී ලෙස පත් කිරීමට සුදුසු වතු අධිකාරීවරයෙකු නොමැතිවීම හේතුවෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැවිලි) එම වතුයායේ වැඩ ආවරණය කිරීම සඳහා 2023.01.25 දින සිට පත් කරන ලදී.

මෙම වැඩ ආවරණ සඳහා 25% ක දීමනාවක් 2023.06.26 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ 2023 ජනවාරි මස සිට ගෙවීම් සිදු කරනු ලබන අතර වතුයායට අදාල වාර්ෂික ඇස්තමේන්තුවට අනුව වතුයායේ සුපරීක්ෂණ කටයුතු සඳහා ඉන්ධන ලබා දීම හා වතු අධිකාරීවරයෙකු විසින් වතුයායට වැටුප් ගෙවීම සඳහා රැගෙන එනු ලබන මුදල් සඳහා වතු අධිකාරීට හිමි කොමිස් මුදල් ලබා දී ඇත.

**(II)** 2024.06.10 දින සිට ගල්පිහිල්ල රාජ්‍ය වතුයායේ වැඩ බලන වතු අධිකාරී ලෙස එස්.ඩබ්.එම්.සී.එස්.අලදෙනිය මහතා පත් කර ඇත.

**(ඊ)** වර්තමානයේ සංස්ථාව සඳහා සකස් කරන ලද බඳවා ගැනීම හා උසස් කිරීමේ පරිපාටිය රේඛීය අමාත්‍යාංශය මගින් 2021 මාර්තු මස කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවට අනුමැතිය පිණිස යවා ඇත. එය නැවත සංශෝධනය කර 2022 ජනවාරි සහ 2023 මැයි මස රේඛීය අමාත්‍යාංශය මගින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. රේඛීය අමාත්‍යාංශය මගින් කළමණාකාර සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තනතුරු කාණ්ඩ වශයෙන් අනුමත කොට අප සංස්ථාව වෙත ලබාදීමට කටයුතු කරන බව දන්වා ඇති අතර , මේ වනවිට ප්‍රාථමික සේවා තනතුරු සඳහා අනුමැතිය ලැබි ඇත.

(උ) පරිපාලන සහකාර, වැඩ සුපරීක්ෂක ප්‍රධාන කාර්යාලය, සහකාර ගණකාධිකාරී සහ කාර්යාල කාර්ය සහායක ප්‍රාදේශීය කාර්යාලය යන තනතුරු 04 සඳහා 2017 වර්ෂයට පෙර ලබාදුන් පත්වීම් වන අතර, 2017 වර්ෂයේදී කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය ලබාගැනීමේදී අතපසුවීමකින් මෙම තනතුරු සඳහා ඉදිරිපත් කිරීමක් සිදු කර නොමැත. එසේම මෙම තනතුරු පෞද්ගලික වන සේ අනුමත කර ගැනිම සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් 2022.10.18 හා 2023.03.15 දිනයන්හි ජාතික වැටුප් කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත. මේ දක්වා වැටුප් කොමිෂන් සභාවෙන් හෝ කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවෙන් පිළිතුරක් එවා නොමැති බැවින් නැවත සිහි කැඳවීම් ලිපියක් රේඛීය අමාත්‍යාංශය මඟින් අංක MPI/Admin/09/SLSPC/CC දරණ ලිපිය මඟින් 2023.11.22 දිනැතිව යොමු කර ඇත. තවද පරිපාලන සහකාර ලෙස සේවය කළ එල්.ගමරාලලාගේ නිළධාරිණිය 2024.05.24 දින සිට විශ්‍රාම ගොස් ඇත.

(ඌ) <u>ව්‍යාපාර සැලැස්ම</u>

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ මැදිහත්වීම මත පසුගිය වසරේදී 2024-2028 වර්ෂ සඳහා ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කල අතර, ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියද ලැබුණි. රේඛිය අමාත්‍යාංශය වැවිලි අමාත්‍යාංශයෙන් රාජ්‍ය වැවිලි ව්‍යවසායක ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයට මාරුවීමත් සමඟ ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රමවේදයට අනුව සංස්ථාවට අයත් වගාකිරීමට හෝ වෙනත් ව්‍යාපෘතීන් හට නිදහස් කල හැකි ඉඩම් පිළිබඳ විස්තර ව්‍යාපාර සැලැස්මේ ඇතුලත් නොවීම මත 2024.03.19 වන දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී

ලබාදුන් නිර්දේශයන් මත නැවත ව්‍යාපාර සැලැස්ම පිළියෙළ කලයුතු බව තීරණය කරන ලදී. ඒ අනුව මේ වනවිට නැවත නව නිර්දේශයන්ට අනුව රේඛිය අමාත්‍යාංශයේ සැලසුම් අංශයේ ප්‍රධානින්ගේ සහයෝගය ඇතිව එම සැලස්ම පිළියෙල කරමින් පවතී. ඒ අනුව ලබන මස දෙවන සතිය නිමවීමට ප්‍රථම නව ව්‍යාපාර සැලැස්ම (2024-2028) රේඛිය අමාත්‍යාංශයට භාරදීමට නියමිතය.

**2.2.4.**

**(අ)** වර්තමානය වන විට වැවිලි සංස්ථාව සතුව තේ කර්මාන්තශාලා 09 ක් පවතින බවත්, එයින් කර්මාන්තශාලා 03ක තේ නිෂ්පාදන කටයුතු සිදු කරමින් පවතියි. ඉපැරණි යන්ත්‍රසූත්‍ර වලින් යුත් දීර්ඝ කාලයක සිට අක්‍රීය තත්වයේ පවතින කර්මාන්තශාලා 05ක් ඇත. මෙම කර්මාන්තශාලා 05 වර්තමානයේ වෙළඳපොළට සරිලන ලෙස ගුණාත්මක තේ නිෂ්පාදනය කිරිමට නොහැක. එබැවින් දීර්ඝ කාලයක සිට වසා දමා ඇත. නමුත්, රංගල තේ කර්මාන්තශාලාවේ තේ වියලන යන්ත්‍රයේ ලිප කොටස ( Furnace) දැඩි අබලන් තත්වයට පත්ව තිබූ බැවින්, කර්මාන්තශාලාවට ගින්නෙන් යම් හානියක් සිදුවිමට ඉඩකඩ තිබු හෙයින් එම කර්මාන්තශාලාවේ ලිප කොටස ගලවා නැවත අලුත්වැඩියා කිරිමට මූලිකව කටයුතු සිදුකරනු ලැබුවත්, එම ලිප කොටස නැවත අලුත්වැඩියා කිරිම නොහැකි තත්වයට අබලන්ව තිබු බැවින්, නව තේ වියලනයක් මිලදි ගැනිමට සුදුසු බවත් එලෙසම එම කර්මාන්තශාලාවේ ඉපැරණි CTC යන්ත්රය මගින් ගුණාත්මක තේ නිෂ්පාදනයක් සිදුකල නොහැකිව ඇත. එබැවින් ඉහත අලුත්වැඩියාව සමඟම ගුණාත්මක තේ නිෂ්පාදනයක් සිදුකල හැකි CTC යන්ත්‍රයක් සහ CFU (Continues Fermentation Unit) යන්ත්‍රයක් ද අළුතින් සවිකලයුතු බව තේ පර්යේෂණ ආයතනයේ දැනුම ලත් නිළධාරින් විසින් නිර්දේශ කොට ඇත.

පසුගිය වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුල්‍යාමය තත්වය මත මෙම යන්ත්‍ර මිල දි ගැනිමට නොහැකි වුයෙන් මෙම වර්ෂය දක්වා කල් දමන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තිරණය කොට ඇත. එලෙසම, මෙම කර්මාන්තශාලාවේ ධාරිතාවය ද වැඩි කිරිමට කටයුතු යොදා ,අබලන්ව තිබූ තේ මැලවුම් ද්‍රෝණි සහ ඊට අදාල අනෙකුත් කොටස් මේ වන විට 95% පමණ අලුත්වැඩියා කටයුතු නිම කොට ඇත. ඉහත යන්ත්ර සවි කිරිමෙන් පසු නවින කර්මාන්තශාලාවක් ලෙස ලාභදායි ගුණාත්මක තේ නිෂ්පාදනයක් සිදු කිරිමට යොදා ගත හැකි බව දන්වා සිටිමි.

**(ආ)** ගෝමර තේ කර්මාන්තශාලාවේ ඇති ඉපැරණි Colour Separate යන්ත්‍රය මේ වන විට තේ නිෂ්පාදනය සඳහා භාවිතා නොකරන ඉපැරණි යන්ත්‍රය යන්ත්‍රයක් වේ. මෙම යන්ත්‍රය දන්කන්ද ඉපැරණි තේ කර්මාන්තශාලාව වෙත වෙනත් අරමුදල් යටතේ තේ නිෂ්පාදනය ආරම්භ කිරිමට හා එම තේ නිෂ්පාදනය විදේශිකයින්ට නැරඹිමට හැකිවන අයුරින් කුඩා ධාරිතාවයකින් යුත් තේ නිෂ්පාදනය ආරම්භ කිරිමට සාකච්ඡා කරමින් පවතියි. ඒ අනුව, මෙම Colour Separate යන්ත්‍රය එම ස්ථානයට යොදා ගැනිමට බලාපොරොත්තු වේ.

**(ඇ)** ගෝමර රාජ්‍ය වතුයායට අයත් නකල්ස් බංගලාව වසර 45 කට වෙනත් පාර්ශවයක් සඳහා බදු පදනම මත ලබා දි තිබූ බංගලාවක් වන අතර, මෙම බදු කාලය අවසන් වූවද, නැවත වැවිලි සංස්ථාවට ලබා නොදුන් බංගලාවකි. අනතුරුව මෙය මහත් පරිශ්‍රමයක් යොදා සංස්ථාවේ පාලනාධිකාරිය විසින්
2020 වර්ෂයේදි නැවත ලබා ගන්නා ලදි. මේ වන විටත් මෙම බංගලාව වෙනත් ආයෝජකයන්ට ලබාදිමට කටයුතු සිදුකරමින් පවති.

(ඈ) සමස්ථයක් ලෙස 2020 වර්ෂයේ සහ 2021 වර්ෂවල ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුයායන්වල ආදායම් ලබන තේ ක්ෂේත්‍ර සඳහා පහත සඳහන් කර ඇති පරිදි පොහොර ප්රමාණ ලබා දි ඇත. ඒ අනුව, 2020 වර්ෂයේ පොහොර ටොන් 384 ක් ද 2021 වර්ෂයේ පොහොර ටොන් 550 කට ආසන්න පොහොර ප්‍රමාණයක් යෙදවූ අතර, යෙදවූ පොහොර ප්රමාණයට අනුව සාපේක්ෂ දළු අස්වැන්න ඉහළ යන ලදි. නමුත්, 2021 වර්ෂයේ රජය විසින් රසායනික පොහොර යෙදවිම සිමා කිරිම හේතුවෙන් හා 2022 වර්ෂයේ වෙළඳපොළ තුළ පොහොර හිගතාවය හා 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ පොහොර මිළ දසගුණයකින් පමණ ඉහළ යාම හේතු කොට ගෙන 2022 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සියළුම වතුයායන් සඳහා පොහොර යෙදවිම ටොන් 40 ක ප්‍රමාණයක් දක්වා අඩුවිය.

නමුත්, 2021 වර්ෂයේ, ආදායම් ලබන තේ ක්ෂේත්‍ර සඳහා ප්‍රමාණවත් පොහොර ප්‍රමාණයක් යෙදීම හේතුකොටගෙන 2022 වර්ෂයේ 2023 වර්ෂයට සාපේක්ෂව වැඩි දළු අස්වැන්නක් ලැබුණි. නමුත් මෙම තත්වය 2023 වර්ෂයේදි දළු අස්වැන්න ලබන කේෂ්ත්‍ර සඳහා අවශ්‍ය පෙහොර ප්‍රමාණයෙන් ලබාදීම 20% ක ආසන්න ප්‍රමාණයකට සීමා වීම හේතුවෙන් , සාපේක්ෂව සියළුම වතුයායන් වල තේ අස්වැන්න 7% සිට 41% දක්වා අවප්‍රමාණය වී ඇත. මෙම දළු අස්වැන්න අව ප්‍රමාණය විමට එම වතුයායන්වල පිහිටීම සහ මෝසම් වැසි ලැබෙන ආකාරය සහ වතුවල ඇති සශ්‍රිකත්වය විශේෂයෙන් බලපාන සාධකයක් වේ.

(ඉ) බාහිර වැවිලි කරුවන් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ලබා දි ඇති සියළුම තේ ඉඩම් වැවිලි සංස්ථාව විසින් අවු.100කට වඩා පැරණි ඇට තේ ඉඩම්ය. මෙම ඉඩම්වල හෙක්ටයාර් 01 ක ඇති තේ පදුරු සංඛ්‍යාව 1650ක් තරම් වු අඩු ප්‍රමාණයකි. මෙම ඉඩම් සඳහා ද රසායනික පොහොර ලබාදිය යුතු වුවත්, පැවති රසායනික පොහොර මිළ ඉහළ යෑම තුළින් ඔවුන්ට ඒ සඳහා ලැබෙන ආදායමට සාපේක්ෂව වියදම් කිරිමට නොහැකිවිම සහ පොහොර මිළ ඉහළ යාමත් සමග ලැබුණු දළු ප්‍රමාණය සැලකිය යුතු ලෙස පහත වැටි ඇත.

(ඊ) ඉහත (ඇ) යටතේ සඳහන් කරුණු වලට අනුව,2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ අමුදළු අස්වැන්න සමස්ථයක් ලෙස 27% න් අඩු වි ඇත. ඊට සාපේක්ෂව වතුයායන් හි එක් දළු කිලෝවක නිෂ්පාදන වියදම ඉහල ගොස් ඇත. නමුත්, 2023 වර්ෂයේ බොහොමයක් වතුවල ඇස්තමේන්තු ගත නිෂ්පාදන වියදම වඩා අඩු අගයක් පවත්වාගෙන ගොස් ඇත. ඒ අතුරින් හෙයාපාර්ක් වතුයායේ සම්පූර්ණ මුළු අස්වැන්න ලබා ගන්නා තේ හෙක්ටයාර් ප්‍රමාණයට පැරණි ඇට තේ වලින් යුක්ත බැවින්, නිසි ලෙස පොහොර නොයෙදුවත්, අනෙකුත් කාලගුණික තත්වයන්ට ද ඔරොත්තු දීමේ හැකියාවක් ඇති බැවින්, රිකිලි තේ නඩත්තු කිරිමට වඩා අඩු වියදමක් දැරිම හේතුවෙන් ද හෙයාපාර්ක් වතුයායේ අඩු කම්කරු ප්‍රමාණයක් සේවය කරන නිසාවෙනුත්, වැඩි දළු ප්‍රතිශතයක්(Average) ලබා ගැනිම හේතුවෙන් ද 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ නිෂ්පාදන වියදම අඩු වි ඇත.

(උ) <u>ධාරිතාවය/ඌනතාවය/උපයෝජනය</u>

අප සංස්ථාව සතු තේ කර්මාන්තශාලා වල පවතින යන්ත්‍ර සූත්‍ර වලට අනුව, දිනකට අමු දළු ධාරිතාවයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| කැලෑබොක්ක කර්මාන්තශාලාව | කිලෝ 9000 |
| මිඩ්ලන්ඩ්ස් කර්මාන්තශාලාව | කිලෝ 7000 |
| රංගල කර්මාන්තශාලාව | කිලෝ 7000 |
| ගෝමර කර්මාන්තශාලාව | කිලෝ 5400 |

ඒ යටතේ, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ තේ කර්මාන්ත ශාලාවන්හි නිමි තේ නිෂ්පාදනය විශාල පසු බෑමකට ලක්ව ඇත්තේ, ලංකාව පුරාම ඇති වතුයායන්වල තේ නිෂ්පාදනය ගිය වසරට සාපෙක්ෂව 50%ට වඩා අඩු ඵලදාවක් 2023 වර්ෂයේ පැවති අයහපත් කාලගුණය හා 2022 වර්ෂයේ රසායනික පොහොර තහනමට ලක්වීමෙන් අනතුරුව, පොහොර මිල සීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් සිදුව ඇති බවයි. ඒ අනුව, කර්මාන්තශාලාවන් වෙත ලැබුණු අමු දළු ප්‍රමාණයද සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුවී ඇත. තවද ගිය වසරට සාපේක්ෂව මෙම වසරේ දළු ප්‍රමාණයෙහි අඩුවීමෙහි ප්‍රතිශතය 35%ත්, 25%ත් තරම් අගයකි.

(ඌ) අත්තිකාරම් මුදලක් ලෙස රජයේ මිනින්දෝරු අධිකාරිය වෙත ලබා දී ඇති ලක්ෂ 05 ක මුදල සම්බන්ධයෙන් මෙතෙක් අප විසින් එකී අධිකාරිය වෙත ඉල්ලුම් නොකිරීම පහත සඳහන් හේතු මත මෙතෙක් සිදු නොකර පවතී.

- මෙම උඩුවෙල වතුයාය ශ්‍රී .ල. රා. වැ  මිලදී ගත් වතු යායක් වුවද, ජනවසම භාරයේ කිසිදු සංවර්ධන ක්‍රියාවලියක් නොමැතිව පවතී.

- මෙම වතුයායේ ඔප්පුව අප විසින් සොයා ගැනීමෙන් අනතුරුව අපගේ අයිතිය මත අමාත්‍යාංශයේ  ද අනුමැතිය ඇතිව අක්කර 50 ක් විකිණීම සඳහා වූ ක්‍රියාවලියේ, එක කොන්දේසියක් ලෙස , අක්කර 50 විකුණා ලැබෙන අදායමින් හරි අඩක් ජනවසම ආයතනයේ හිග ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම සඳහා ලබා දෙන බව සහ එසේ ලබා දීම හේතු කොටගෙන ජනවසම විසින් එකී උඩුවෙල වතුයායේ බුක්තියෙන් ඉවත් වී යායුතු බවත්ය. ඒ අනුව එම වතු යාය නැවත සංස්ථාව භාරයට ගැනීමේ දී වතුයායේ වට මැනුමක් සිදු කර ඔප්පුවේ සඳහන් ඉඩම් ප්‍රමාණය භෞතිකව ඇත්දැයි  නිශ්චිතව ම දැන ගැනීමට අවශ්‍ය වූ හෙයින්, අත්තිකාරම් මුදල්  ආපසු ලබා ගැනීමට ක්‍රියාකර නොමැත.

(එ) 2022 වර්ෂයේ ගෝමර රාජ්‍ය වතුයාය ලාභ ලැබීමට හේතුව වන්නේ,  2021 වර්ෂයේ අගභාගයේ දී, වතුයායට අවශ්‍ය  නිසි පොහොර ප්‍රමාණය ලබාදීමෙන් අනතුරුව, 2023 වර්ෂයේ ලබාගත් දළු අස්වැන්නට වඩා දළු කිලෝ 214,477 ක ප්‍රමාණයක් 2022 වර්ෂයේ වැඩිපුර නොළා ගැනිම හේතුවෙන් 2022 වර්ෂයේ ලැබූ තේ අස්වැන්නට සාපේක්ෂව රටේ පැවති පොහොර හිඟතාවය සහ පොහොර  මිල අධිකවීම හේතුවෙන්,2022/2023 වර්ෂයේ අවශ්‍ය පොහොර ප්‍රමාණය යෙදීමට නොහැකි විය. එම හේතුවෙන් සම්ප්‍රදායික ( Orthodox) තේ නිෂ්පාදනයට සුදුසු ප්‍රමිතියෙන් යුතු තේ දළු ලබා ගැනිමට නොහැකි විය. ඒ අනුව, 2023 වර්ෂයේ ගෝමර තේ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කොට, එම වර්ෂයේ බලාපොරොත්තු වූ තේ විකුණුම් මිල (NSA) ලබා ගැනිමට ද නොහැකි විය. තවද දළු අස්වැන්න අඩුවිම මතද නිෂ්පාදන වියදම ඉහළ යන ලදි. එලෙසම ගෝමර තේ කර්මාන්තශාලාව නවීකරණය කිරිම සඳහා වූ ප්‍රාග්ධන වියදම ද ඇතුලත්ව අලාභය ඉහළ ගොස් ඇත.
තවද, කැලැබොක්ක රාජ්‍ය වතුයාය 2022 වර්ෂයේ අවසාන ගිණුම් වාර්ථාවට අනුව තේ හා අනෙකුත් ආදායමත් සමග රු10,461,477 ක ලාභයක් උපයා ඇත. එලෙසම 2023 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවට අනුව ද අනෙකුත් ආදායම සමඟ රු.10,717,096ක ලාභයක් ලබා ඇත. ඒ අනුව, කැලැබොක්ක රාජ්‍ය වතුයාය 2022/2023 වර්ෂවලදි අලාභ ලබා නොමැත.

තවද, කොටගඟ හා විහාරගල යන වතුයායන් අප සංස්ථාව සතු අඩුම සශ්‍රික භාවයකින් යුත් වතු වන අතර, එක් එක් වතුයායන්වල හෙක්ටයාරයක පවතින තේ පඳුරු සංඛ්‍යාවද අනෙකුත් වතුයායන්ට සාපේක්ෂව අඩු අගයක් ගැනිම  හා 2022/2023 වර්ෂයේ ආදායම් ලබන ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය  ප්‍රමාණයට පොහොර නොයෙදිම මත, සැළකය යුතු ප්‍රමාණයකින් දළු අස්වැන්න අඩු වි ඇත.ඊට සාපේක්ෂව නිෂ්පාදන වියදම ද ඉහළ ගොස් ඇත. මිට අමතරව, මිඩ්ලන්ඩ් රාජ්‍ය වතුයාය මැද රට වියළි කළාපයේ පිහිටා ඇති බැවින් ද  නියමිත පරිදි පොහොර නොයෙදවිම හේතුවෙන් හා තේ නිෂ්පාදනය සඳහා ලැබෙන අමු දළුවල ප්‍රමිතිය අඩුවිම හේතුවෙන්, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ විකුණුම් මිල (NSA) අඩුවී ඇත. ඒ අනුව, 2022 වර්ෂයට  වඩා 2023 වර්ෂයේ අලාභය ඉහළ ගොස් ඇත.

(ඒ) (ඔ) යන අංක දෙකෙහි සඳහන් කරුණුවලට අදාළව හෙයාපාර්ක්, හුන්නස්ගිරිය, රංගල, හාගල, කොටගඟ, වුඩ්සයිඩ්, ගෝමර, මිඩ්ලන්ඩ්ස් වතුයායන්හි කම්කරු පිරිවැය හා මුළු ආදායම සමඟ සංසන්දනය කර ප්‍රතිශතයන් දක්වා ඇත. මෙහිදි ඉහත සඳහන් වතුයායන්වල නැවත තේ වගා කිරිම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ලබා දුන් ප්‍රාග්ධන  මුදල්වලට අදාළව නව තේ වගා වැඩසටහන යටතේ යෙදවූ කම්කරුවන්ගේ පිරිවැය ද එක්කොට ගණනය කර ඇත. නමුත් ඉහත නව තේ වගාව සඳහා ලැබූ අරමුදල් ප්‍රාග්ධන වියදමක් ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ලබා දි ඇත. ඒ අනුව, දක්වා ඇති දත්තයන් ආදායම ලැබිම වෙනුවෙන් යොදන ලද කම්කරුවන් (Revenue Labour) සහ ඔවුන් වෙනුවෙන් දැරු වියදමට අදාළව ආදායමෙහි ප්‍රතිශතයන් ලෙස නිවැරදි විය යුතුය.

(ඕ) <u>තාක්ෂණ උද්‍යානයක් පිහිටු වීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම - වලහන්දූව වත්ත</u>

i .වලහන්දූව රාජ්‍ය වතුයාය 1994.04.21 දිනැති අංක 815/10 දරණ ගැසට් නිවේදනය මගින් රාජ්‍ය  වැවිලි සංස්ථාව වෙත අයිතිය පැවරී තිබුණි . නමුත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසහන් සභාව විසින් මෙම වතුයාය

අංක 2124 /40 හා 2019.05.24 දිනැති ගැසට් නිවේදනය මගින් නැවත ප්‍රත්‍යාදිෂ්ඨ කර ගැනීමට කටයුතු කර තිබුණි.

ඒ අනුව වතුයායේ නෛතික අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරුණු අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින්, තාක්ෂණ **උද්‍යානය** සඳහා වූ ඉඩමේ භුක්තිය තාක්ෂණ අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

ඉහත තත්වය මේ වන විට නිවැරදි වී ඇති අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ඉහත කී ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද ගැසට් නිවේදනය ඉවත් කර දෙන ලෙස ඉල්ලා අමාත්‍යාංශ මට්ටමින් , දිගින් දිගටම කරන ලද ඉල්ලීම් සලකා වලහන්දූව වතුයාය ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද ඉහත කී ගැසට් නිවේදනය අවලංගු කරමින් 2022 .03.15 දිනැති ,අංක 2271/25 දරණ ගැසට් නිවේදනය නිකුත් කර ඇත.

ii) ඉහත සඳහන් කල පරිදි , තාක්ෂණ උද්‍යානය සඳහා ලබා දෙන ඉඩම් කොටස තීරණය කර ඇත්තේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසිනි.

iii )රබර් ගස් වල ආදයම් අහිමි වීම වලක්වා ගැනීමට නොහැකි වූ පසු බිමක අදාල ඉඩම් සඳහා වූ වන්දිය අප වෙත ලබා දෙන ලෙස අප විසින් 2021.11.30 , 2012.12.15 ,2021.12.28 , 2022.12.13, 2023.07.28,2023.11.24 දිනැති ලිපි කිහිපයක් මගින්ම තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් සහ අක්මීමන ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

මේ අතර, තාක්ෂණ උද්‍යානය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම තාවකාලිකව අත් හිටුවා ඇති බව අක්මීමණ ප්‍රාදේශීය ලේකම් විසින් අපගේ ලිපියකට පිළිතුරු ලෙස 2023.12,02 දිනැති ලිපියෙන් දන්වා සිටි හෙයින්, අප විසින් අමාත්‍යාංශයේ ලේකම් වරයා වෙත 2022.02.12 දිනැති ලිපිය මගින් ඉල්ලා ඇත්තේ, ඉඩමේ අත්පත් කර ගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් එකී ඉඩම් කොටස් නැවත වලහන්දූව වතුයාය භාරයට ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසයි.

iv) ඉහත පිළිතුරුම අදාල වන අතර, ප්‍රශ්නගත ඉඩම් අප වෙත මෙතෙක් භාර දී නොමැති වුවත්, එකී භූමියේ ඉතිරිව ඇති රබර් වගාවේ අස්වැන්න ලබා ගැනීම සිදු කරන බව එම වතුයායේ වතු අධිකාරී විසින් ප්‍රකාශ කර ඇත.

(ක) අංක 02 සහ 03 යටතේ අතුරු බෝග ප්‍රවර්ධන සහ නැවත දැව වගා කිරිමේ වැඩ සටහන සැලසුම් කර තිබුණ ද, 2022 වර්ෂයේ නැවත තේ වගාව සහ නව තේ වගාව වැඩ සටහන යටතේ හෙක්ටයාර් 160.93 ප්‍රමාණයක වගා කටයුතු සිදුකිරිම සඳහා ඉලක්කර කර තිබුණි. ඒ අතුරින් ඒම වර්ෂයේ ඉතිරි වූ හෙක්ටයාර් ප්‍රමාණයක් 2023 වසරේද සිදුකිරිමට සිදුවිය. තවද, 2022 සිදුකරන ලද ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු ද 2023 වර්ෂයේ සිදුකිරිමට සිදුවිය. ඒ අනුව ඒ සඳහා විශාල කම්කරු ශ්‍රමයක් අවශ්‍ය වූ බැවින් වෙනත් බෝග සැලසුම් කර තිබූ පරිදිම, කම්කරු හිඟතාවය මත නිම කිරිමට නොහැකි වූ බව දන්වා සිටිමි. අංක 04 යටතේ කර්මාන්තශාලා සහ යන්ත්‍ර නවීකරණය සඳහා රු. මිලියන 190.4ක් වැය කිරිම සඳහා ඉලක්ක කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පැවති මූල්‍යම අර්බුදය හේතුවෙන්, රු. මිලියන 40.53 මුදල පමණක් වැය කර ඇති බව දන්වා සිටිමු.

<u>වලහන්දූව වතුයායේ තේ පැළ නඩත්තුව</u>

වලහන්දූව වතුයායේ තේ පැළ වගා වැඩසටහන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආධාර මත 2022 වසරේ ආරම්භකල ව්‍යාපෘතියක් වන අතර 2023 වසරේ සැලසුම් කල පරිදි එම ආධාර නොලැබීම හේතුවෙන් මෙම වැඩසටහන 25% ප්‍රමාණයකට සිමා කිරීමට සිදුවිය.

**<u>තේ පැළ 475,00 සකස්කිරීමේ වැඩසටහන</u>**

සකස්කිරීමේ වැඩසටහන යටතේ නඩත්තු කටයුතු හැර අනෙකුත් 475,000 වසරේ තේ පැළ 2023 යාකාරකම් කිසිවක් මෙම වසරේ සිදුකර නොමැති නිසාක්‍රිභෞතික ප්‍රගතියක් පෙන්වීමට නොහැක.